# මව්බිම

2023 ඔක්තෝබර් 19
බ්‍රහස්පතින්දා

මිල රු.60/-

පිටු 20

කාණ්ඩය 12
කලාපය 233

www.mawbima.lk


## ජනතාව දවස් හතරක් නිදි නෑ

# කොත්මලේ පොළොව යටින් බියකරු හඬක්

නොර්වුඩ් – නීටා පත්මි කුමාරි

▶2 පිටුවට

### නුවරඑළිය දිසාපති පරීක්ෂණයක් ඉල්ලයි



# කුරිරු ඝාතනයකට මග රැක සිටි තුවක්කුකරුවන් කඩවතදී අල්ලයි

සිරිසි මෙන්ඩිස්

▶2 පිටුවට

### ව්‍යාපාරිකයා නූලෙන් බේරෙයි

## විධායක ජනාධිපති ක්‍රමය නැති කරන්න ආණ්ඩුවට ජනවරමක් නෑ

විජයදාස රාජපක්ෂ

▶2 පිටුවට

අනුරාධා හේරත්, ශ්‍රීෂාන් පතිරන් ජයසූරිය

## මන්ත්‍රී උද්දිකට වෙඩි තැබුවේ ආරක්ෂකයන්ගේ අවිවලින් දැයි සොයයි!

පුහු ආරක්ෂක ගිනි අවි දෙක
රස පරීක්ෂකට යොමු කරන්නැයි නියෝගයක්

අනුරාධපුර – උපාලි ආනන්ද කරුණාදාස

▶02 පිටුවට

## මීගහතැන්න 'පොඩි මල්ලිගේ' ගෙදර අවි ගබඩාවක්!

සිරිසි මෙන්ඩිස්

මීගහතැන්න පොලිස් වසමේ කළුපහන ප්‍රදේශයේ පදිංචි පුද්ගලයකු අවිආයුධ කිහිපයක් සන්තකයේ තබාගෙන කිසියම් අපරාධයකට සැරසෙන බවට තොරතුරක් ඊයේ පානදුර වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක බළකායේ ස්ථානාධිපතිවරයාට ලැබිණි.

▶02 පිටුවට

## ගලගෙදර අධිකරණයේදී
## සැකකරුවෙක් නීතිඥවරියක ගෙල සිර කර ග්‍රහණයට අරන්!

මහනුවර - කේ.එල්. සුරවීර

▶02 පිටුවට

## තිස්සමහාරාමයේ වැවක් ව්‍යාපාරිකයෙක් බලෙන් අල්ලාගෙන

▶02 පිටුවට

තිස්සමහාරාම – අමිල සම්පත් ශ්‍රී



### ශ්‍රී ලංකා-වියට්නාම් නායකයන්ගේ හමුවක්...

එක් තීරයක් සහ එක් මාවතක් සමුළුවට සහභාගිවීම සඳහා චීනයට ගොස් සිටින ජනාධිපති රනිල් වික්‍රමසිංහ, වියට්නාමයේ ජනාධිපති වෝ වැන්ග් තුවොන් හමුවූ අවස්ථාව.

## සියයට 22ක වැඩි වීමක් ඉල්ලූ ලංවිම දැන් සියයට 18ක් ඉල්ලයි

චාමර අමරසූරිය

▶2 පිටුවට

## මෙතැනින් එහාට විදුලි බිල වැඩි කරන්න බෑ

චාමර අමරසූරිය

දකුණු ආසියාවේ හා අග්නිදිග ආසියාවේ විදුලි ගාස්තු සමඟ සැසඳීමේදී මෙරට විදුලි පාරිභෝගිකයන් ඉහළ විදුලි බිලක් ගෙවන රටවල් අතර සිටින බව බලශක්ති උපදේශක ආචාර්ය තිලක් සියඹලාපිටිය පවසයි.

▶02 පිටුවට




## සතොස භාණ්ඩ 5ක මිල අඩු කරයි

ඉරෝෂා දීපානි

▶02 පිටුවට

## මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ජනපති 9 දෙනකු අතට දෙයි

බිඟුන් මේනක ගමගේ

මැතිවරණ ක්‍රමයේ වෙනස්කම් සඳහා යෝජනා සැකසීමට ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් සාමාජිකයන් 09 දෙනකුගෙන් සමන්විත කොමිසමක් පත්කරනු ලැබ තිබේ.

▶2 පිටුවට

## ලොව කොතැන හිටියත් පොලිස්පති පත්කිරීමේ බලය ජනපති ළඟ!

අනුරාධා හේරත්,
ශ්‍රීෂාන් පතිරන් ජයසූරිය

අගමැති අවධාරණය කරයි

▶2 පිටුවට

## මාර්ගගත පනතට එරෙහිව පෙත්සම් 45ක්

අනුරාධා හේරත්, ශ්‍රීෂාන් පතිරන් ජයසූරිය

▶02 පිටුවට

## ගාල්ලට මහ වැසි; යළිත් ගංවතුරක්

ගාල්ල - ෆර්හාන් නිසාම්දීන්, අහංගම - එස්. දියගහගේ

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රදේශ රැසකට ඊයේ අලුයම් කාලයේ සිට දවස පුරා ඇද හැලුණු ධාරානිපාත වර්ෂාවත් සමඟ යළිත් පහත්බිම් සහ මාර්ග රැසක් ජලයෙන් යටවී ඇති අතර ගමනා ගමනයටද බාධා පැමිණ තිබිණි.

▶02 පිටුවට

## ලවණ බැම්මෙන් මාතරට නොබසින ගංවතුරක්

කඹුරුපිටිය - පී.එල්. ජයවර්ධන,
දෙයියන්දර - ටී. විජේසේකර

▶03 පිටුවට

## අයි. එම්. එෆ්. ප්‍රගතිය
## විනිවිදභාවය අතින් සැප්තැම්බරය අන්තිම ෆේල්

වෙරිටේ කියයි

බිඟුන් මේනක ගමගේ

▶2 පිටුවට

## යුද උණුසුම පිට රන් පවුම හත්දාහකින් නඟී

අමිල අබේරත්න

පසුගිය සතියට සාපේක්ෂව මෙරට වෙළෙඳපොළේ රන් පවුමක මිල රුපියල් 7000කට ආසන්න ගණනකින් ඉහළ ගොස් තිබේ.

▶02 පිටුවට




1 >>

## කොත්මලේ...

කොත්මලේ, හැදුණුවැව, වෑතලාව ක්‍රීඩාංගණයේ පොළොව යටින් ඇසෙන විවිධාකාර අද්භූත ශබ්ද හා ප්‍රදේශයේ පිහිටි ඉපැරණි ළිංද, දෛනිකව ජලය පරිභෝජනයට ලබාගත් ජල මූලාශ්‍රද හිටිහැටියේ සිඳීයෑම නිසා භීතියට පත් ප්‍රදේශවාසීන් දින 4ක් තිස්සේ නිදි වර්ජිතව එක්පැහැකට එක්ව විසඳුම් සොයන බවත් වාර්තා වේ.

උද්ගතව ඇති ගැටලුව සම්බන්ධව ප්‍රදේශවාසීන් කිහිපදෙනකු 'මව්බිම' හා කියා සිටියේ වැසි සහිත කාලවලදී රාත්‍රී කාලයේ ප්‍රදේශයේ පොදු ක්‍රීඩාංගණය හැටියට භාවිත කරන භූමියේ අභ්‍යන්තරය සිට මුළු ගමටම ඇසෙන පරිද්දෙන් යන්ත්‍රයක් ක්‍රියා කරනවා මෙන් භයානක විශාල ශබ්දයක් වරින් වර ඇසෙන බවය.

පොදු ක්‍රීඩා භූමියේ හා අවටින් පොළොව අභ්‍යන්තරයේ වැසි සහිත කාලවලදී ඇසෙන බියකරු ශබ්ද හේතුවෙන් තමන් පීඩා විඳින බැවින් නිදහසේ ජීවත්වීමට අවශ්‍ය වාතාවරණය සකස් කරන්නැයි ජනතාව ඉල්ලා සිටි බව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් දිසාපති නන්දන ගලගොඩ 'මව්බිම'ට පැවැසීය.

ඒ අනුව ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම් මත මේ පිළිබඳව පරීක්ෂා කරන ලෙස ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයෙන් ඉල්ලා සිටි බවත් එම සංවිධානය පරීක්ෂණයක් සිදුකළ බවත් කී දිසා ලේකම්වරයා, අනතුරුදායක තත්ත්වයක් නැතැයි ඔවුන් දන්වා ඇතැයිද කීය.

එසේ වුවත් එම ප්‍රදේශයේ පොළොව යටින් අද්භූත ශබ්ද මේ වනතුරුත් ඇසෙන බැවින් තවදුරටත් කඩිනම් පරීක්ෂාවක් කරන්නැයි භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙන්ද ඉල්ලා සිටි බවද හෙතෙම කියා සිටියේය.

දිස්ත්‍රික් ලේකම්වරයා මේ බව කියා සිටියේ කොත්මලේ, හැදුණුවැව වෑතලාව ප්‍රදේශයේ මතුව ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව දැනුම්දීමේ විශේෂ මාධ්‍ය හමුවක් ඊයේ (18දා) නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වමිනි.

මාධ්‍ය හමුව සඳහා සහභාගි වූ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් හර්ෂ ලක්මාල් මහතා අදහස් දක්වමින් කියා සිටියේ, "මුලින් වැවක්ව තිබුණු ස්ථානයක් 2013 වර්ෂයේදී පස් පුරවා ක්‍රීඩාංගණයක් බවට පත් කළ වෑතලාව ක්‍රීඩාංගණය පිහිටා ඇති භූමි ප්‍රදේශයේ ඇසිවන ඝෝෂාකාරී ශබ්දයක් නිකුත් වීමේ සිද්ධිය සම්බන්ධව ප්‍රදේශවාසීන්ගෙන් ලැබුණු පැමිණිල්ලකට අනුව පුඩළුඔය පොලිසිය, ග්‍රාමසේවා නිලධාරීවරයා, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය සහ කොත්මලේ වේල්ල භාරව කටයුතු කරන නිලධාරීන් සමඟ සිද්ධිය සම්බන්ධ වෑතලාව ප්‍රදේශයේ ක්‍රීඩාංගණයට ගොස් මූලික පරීක්ෂණයක් පසුගියදා සිදු කරනු ලැබුවා. ඒ පිළිබඳව මහජනතාව සෑහීමකට පත් නොවන බැවින් දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් පරිදි භූ විද්‍යා හා පතල් කැණීම් ඒකකයට එම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට ලිපියක් යොමුකර ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීමට සූදානම් වෙනවා."

ගම්වැසියෙක් අදහස් දක්වමින් මෙසේ කීවේය. "අපේ ගමේ මේ භයානක ශබ්ද ඇසෙන්නේ දැනට දවස් හයක හතක ඉඳන් වගේ. අපි පුංචි කාලේ ඉඳන් ක්‍රීඩා කරපු වැස්සට වතුර පිරිලා තියෙද්දී ඔරු පැදපු ගමේ ක්‍රීඩාංගණයේ භූමියේ ඇතුළෙන් මේ ශබ්ද ඇසෙන්නේ.

ඉස්සර මේ ක්‍රීඩාංගණයේ වැස්සක් ආවහම වතුර පිරෙනවා හරියට වැවක් වගේ. ඒකෙ අපේ දරුවෝ විතරක් නෙමේ අපිත් බැහැලා සෙල්ලම් කරලා තියෙනවා ඔරු පැදලා තියෙනවා.

තවත් අපිට වැඩිපුරම බය හිතුණේ මීට කලින් එතැනට හවස හය වෙනකොට කුළු හරක්, ගෝන්නු එහෙම එනවා, කුඩැල්ලෝ පිරිලා අඩිය තියන්නත් බැරි තරමට. දැන් ඒ මොකෙක්වත් නෑ. පොළොව අස්සෙන් එන සද්ද ගැන කියනවා නම් අමුතුම භයංකාර සද්දයක් තමයි ඇහෙන්නේ. හරියට පෙට්‍රල් වතුර මෝටරයක් ක්‍රියාත්මක කළා වගේ සද්දයක් දෙගුණ තෙගුණ වෙලා ඇහෙනවා. පවුල් 137ක් ජීවත් වෙන ගම්මානයටම මේ සද්ද භයානක විදිහටම ඇහෙනවා.

ක්‍රීඩාංගණය අවට තියෙන ගෙවල් 15 - 20 ඉන්න අයට මේක තවත් දරාගන්න බැරි ප්‍රශ්නයක් වෙලා. සොයි මොහොතේ මොනවා වෙයිද කියලා කියල හිතාගන්නවත් බැරුව දවස් ගාණක් නිදාගන්නෙ නැතිව ප්‍රජා ශාලාව ගාවට ඇවිත් වාඩි වෙලා ඉන්නවා.

මේ ප්‍රශ්නෙට අපට විසඳුම් හොයන්න බැහැ. අපි මේ ගැටලුව ගැන සමාජ මාධ්‍යවලද පළ කළාට පස්සෙ කොත්මලේ ප්‍රාදේශීය ලේකම්තුමා පුඩළුඔය පොලිසියත් එක්ක ඇවිල්ලා මේ ගැන බැලුවා.

ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් ඇවිත් නිකම් අපි බලනවා වගේම උඩින් බලලා කිව්වේ මේකෙ කිසිම අවුලක් නැහැ කියලයි. අඩුම තරමින් සෝවුකැල්ලකින්වත් ඇහලා බැලුවේ නැහැ පොළොවට.

එයාලා එන්නම් වාලේ ඇවිල්ල බලන්නම් වාලේ බලලා ගියා මොකුත් නැහැ කියලා ගියා. මෙහි ජීවත් වෙලා ඉන්න අපිට දැන් දැන් මරණ බිය දැනෙනවා.

ඉදිරියට අපි කරන්න ඕන මොනවාද කියන දේත් අපිට කියන්න. එතකන් අපට නින්දක් නම් යන එකක් නැහැ" යනුවෙන් ප්‍රදේශවාසීහු කියා සිටියහ.

## සැකකරුවෙක්...

ගලගෙදර දිසා අධිකරණයේ විවෘත අධිකරණයේ නඩුවක් විභාගය වෙමින් තිබියදී සිරමැදිරියෙන් පැනවිත් නීතිඥවරියකගේ ඇඟට පැන ගෙල සිර කරමින් සිටි බව කියන සැකකරුවකු ගලගෙදර දිසා මහෙස්ත්‍රාත් හර්ෂණ රත්නායක විසින් ලබන වීසි පස් වැනි දින තෙක් රක්ෂිත බන්ධනාගාරගත කොට තිබේ.

මෙලෙස නීතිඥවරියගේ ගෙල සිරකොට ඇය බිම පෙරළා හිංසාවට ලක් කරනු ලැබුවේ ගංජා ළඟ තබාගැනීම හා පාවිච්චි කිරීමේ චෝදනාව මත පසුගියදා 16දා පස්වරුවේ ගලගෙදර පොලිසියෙන් අත්අඩංගුවට ගෙන පෙරේදා (17දා) ගලගෙදර අධිකරණයට රැගෙන ගොස් සිටි සැකකරුවකු විසිනි.

සැකකරු සිය නඩු විභාගය හමාර කොට ඉන් ලද සන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යොමුකිරීමේ තීන්දුව මත අධිකරණ රැඳවුම් භාරයේ තබා සිටියදී වෙනත් නඩු විභාගයක් සඳහා සැකකරුවකු එම රැඳවුමෙන් පිටතට ගනු ලබන අවස්ථාවේ යකඩ දොර තල්ලු කර දමා විත් නීතිඥවරියගේ ඇඟට පැන තිබේ.

ආරක්ෂක අංශ නිලධාරීන්, පොලිස් නිලධාරීන් හා නීතිඥවරු එක්ව සැකකරුගේ ග්‍රහණයෙන් නීතිඥවරිය මුදා ගැනීම සඳහා දැඩි වෙහෙසක් දරා තිබේ.

අනතුරුව අධිකරණයට අපහාස කිරීමේ චෝදනාවට අදාළව සැකකරුගෙන් කරුණු විමසා එම කරුණු මත එදිනම එම චෝදනාව යටතේ ලබන 25 වැනි දින තෙක් සැකකරු රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබ තිබේ.

අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව සඳහා කරුණු විමසන අවස්ථාවේ සැකකරු ප්‍රකාශ කොට සිටියේ තමන් අධිකරණයට පැමිණෙන සෑම දිනකම නීතිඥවරිය දැක ඇති බවත් ඇය පිළිබඳ උපන් ආශාව මත ඇයගේ ගෙල සිරකොට අල්ලා ගත් බවත්ය.

ගලගෙදර, කළුවානේ පදිංචි මෙම සැකකරු ප්‍රදේශයේ තරුණියන් බොහොමයකට හිංසා පීඩා කර ඇති බවත් දුටු සැණින් කාන්තාවන් සිය ග්‍රහණයට ලක් කර ගන්නා බවටත් තොරතුරු අනාවරණය වී ඇති බව ගලගෙදර පොලිසිය පවසයි.

තුවාල ලත් නීතිඥවරිය ගලගෙදර රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුළත් කොට තිබේ.

## කුරිරු ඝාතනයකට...

කඩවත ප්‍රදේශයේ ව්‍යාපාරිකයකු ඝාතනය කිරීමට මඟ රැක සිටි තුවක්කුකරුවන් දෙදෙනකු ඝාතනය සඳහා ගෙනෙන ලද ස්වයංක්‍රීය පිස්තෝලය සමඟ අත්අඩංගුවට ගැනීමට හැකි වීම නිසා එම ව්‍යාපාරිකයාගේ ජීවිතය බේරා ගැනීමට පොලිසියට හැකිවී තිබේ.

තුවක්කුකරුවන්ට ලබාදුන් මුදල් කොන්ත්‍රාත්තුවට අනුව හදිසියකින් හෝ ව්‍යාපාරිකයා මරා දැමීමට නොහැකි වුවහොත් එම ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරු හෝ වෙඩි තබා ඝාතනය කිරීම සඳහා මෙම තුවක්කුකරුවන් පැමිණ සිටි බව සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමේදී හෙළිවී තිබේ.

සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමේදී හෙළිවී ඇත්තේ ඩුබායි රාජ්‍යයේ රැඳී සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු සහ සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයකුගේ මෙහෙයවීම මත තුවක්කුකරුවන් මෙම ව්‍යාපාරිකයා ඝාතනය කිරීම සඳහා පැමිණි බවය. මුදල් කොන්ත්‍රාත්තුවකට අනුව පැමිණි මෙම තුවක්කුකරුවන්ට වෙඩි ප්‍රහාරයට කලින් රුපියල් 20,000ක් ලබාදී තිබිණි.

කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් ඉකුත් 17 වැනිදා රාත්‍රියේ කැලණිය සහ ඒ අවට ප්‍රදේශ තුළ අපරාධ නිවාරණ රාජකාරියේ යෙදී සිට තිබේ.

එහිදී ප්‍රදේශයේ සැකමුසු ස්ථාන සෝදිසි කරමින් පැමිණෙද්දී පුද්ගලයන් දෙදෙනකු යතුරුපැදියක් නතර කොට සැක කටයුතු ලෙස රාගම මාර්ගයේ රැඳී සිටින බව කොට්ඨාස අපරාධ විමර්ශන නිලධාරීන්ට පෙනී ගොස් තිබේ.

පසුව ඔවුන් අසලට ගොස් ඔවුන්ගෙන් එම ස්ථානයේ රැඳී සිටින්නේ මන්දැයි විමසා ඇති අතර එහිදී ඔවුන් නිලධාරීන්ට පවසා ඇත්තේ මිතුරකු පැමිණෙනතුරු එසේ රැඳී සිටින බවකි.

කෙසේ වෙතත් ඔවුන්ගේ ප්‍රකාශය ගැන සැක සිතූ නිලධාරීන් එක් පුද්ගලයකු කැඳවා සෝදිසි කිරීමේදී ඔහුගේ ඉණේ පිස්තෝලයක් සඟවා තිබියදී සොයා ගැනීමට හැකිවී තිබේ.

පසුව ඔවුන් පැමිණි යතුරුපැදියද සෝදිසි කිරීමේදී එහි එක් පැත්තක සකසා තිබූ පෙට්ටියක තිබී විදේශීය රටක නිෂ්පාදිත ජීව අත්බෝම්බයක්ද තිබී සොයා ගැනීමට පොලිස් නිලධාරීන්ට හැකිව තිබේ.

පසුව ඔවුන් දෙදෙනා කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයට රැගෙන ගොස් දීර්ඝ ලෙස කරන ලද ප්‍රශ්න කිරීමෙන් පසු ඔවුන් දෙදෙනා රාගම-කඩවත මාර්ගයේ රාගම මාර්ගයට හැරෙන හන්දියේ රැඳී සිට ඇත්තේ කඩවත ප්‍රදේශයේ ව්‍යාපාරිකයා හෝ එහි කළමනාකරු ඝාතනය කිරීමට බවත් අනාවරණය කර ගැනීමට පොලිස් නිලධාරීන්ට හැකිව තිබේ.

මොවුන් එම ව්‍යාපාරිකයා හෝ කළමනාකරු ඝාතනය කිරීමට තැත් කර ඇත්තේ රුපියල් ලක්ෂ 10ක කප්පම් මුදලක් නොලැබුණු නිසා බවද හෙළිවී තිබේ.

ඩුබායි රාජ්‍යයේ සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයා විසින් මෙම ව්‍යාපාරිකයාගෙන් රුපියල් ලක්ෂ 10ක කප්පමක් ඉල්ලා ඇති අතර ව්‍යාපාරිකයා එම මුදල දීම ප්‍රතික්ෂේප කර තිබේ.

පසුව රට උරණ වූ විදේශගතව සිටින අපරාධකරු මුදල් කොන්ත්‍රාත්තුවක් මෙම තුවක්කුකරුවන්ට දී ව්‍යාපාරිකයා ඝාතනය කිරීමට මොවුන් එවා ඇති බව විමර්ශන නිලධාරීහු කියති.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 සහ 29 වයස්වල පසුවන මීගහවත්ත සහ කැලණිය ප්‍රදේශවල පදිංචිකරුවන් බව පොලිසිය කියයි.

කැලණිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශ්‍රීශාන්තගේ උපදෙස් මත කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඩබ්ලිව්. එම්. ඒ. සඳහුවන් ප්‍රමුඛ පොලිස් පරීක්ෂක කපිල සම්පත් සහ උප පොලිස් පරීක්ෂකවරුන් වන ජීවන්ත සිල්වා කොඩිකාර සහ බණ්ඩාර ඇතුළු පිරිසක් මෙම වැටලීමට එක්ව සිටියහ.

## ගාල්ලට මහ වැසි...

ගාල්ල-බද්දේගම පාරේ දංගෙදර, තලාපිටිය, කෝන්ගහ හන්දිය ආදී ප්‍රදේශවල මාර්ග රැසක් සම්පූර්ණයෙන්ම ජලයෙන් යටවී තිබිණි.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව පැවැසුවේ මේ වනවිට සාමාන්‍ය මට්ටමේ තිබෙන ගිංගඟේ ජල මට්ටම අධික වැස්සත් සමඟ ඉහළ යමින් පවතින බවය.

ගාල්ල දිස්ත්‍රික් ලේකම් ශාන්ත වීරසිංහ පැවැසුවේ යළිත් හදිසි ගංවතුර තත්ත්වයක් හෝ වෙනත් ආපදා තත්ත්වයක් ඇති වුවහොත් පීඩාවට පත්වන ජනතාවට අවශ්‍ය සියලු සහන සැලසීමට කටයුතු සූදානම් කර තිබෙන බවය.

## මෙතැනින් එහාට...

මේ අතරින් වාණිජ පරිභෝජනය සම්බන්ධයෙන් විදුලි දෙවැනි ඉහළ අගයක් ගන්නා රට ලෙස මෙරට සඳහන් වන බවත් එහි පළමු රට සිංගප්පූරුව බවත් ඔහු සඳහන් කරයි.

මධ්‍යම ප්‍රමාණයේ නිවාස අතරින් විදුලි ගාස්තු ගෙවීමේ මිල ගණන් අතරින් ඉහළින්ම සිටින්නේ සිංගප්පූරුව බවත් දෙවැනි ස්ථානය පිලිපීනය බවත් තෙවැනි ස්ථානය ලංකාව බවත් හෙතෙම සඳහන් කරයි.

කර්මාන්තශාලා විදුලි මිල ඉහළත්වය අනුව සිංගප්පූරුව, හොංකොං හා ශ්‍රී ලංකාව සිටින බවත් ඔහු පවසයි.

"මෙතැන් එහාට විදුලි මිල වැඩි කරන්න බෑ. දැනට අති විශාල විදුලි මිලක් තියෙන්නේ" යැයිද හෙතෙම කියා සිටී.

ඔහු මේ බව පැවැසුවේ විදුලි ගාස්තු ඉහළ දැමීමේ යෝජනාව සම්බන්ධයෙන් මහජන උපයෝගිතා කොමිෂන් සභාව සංවිධාන කළ මහජන අදහස් දැක්වීමේ අවස්ථාවට ඊයේ (18දා) එක් වෙමිනි.

## සියයට 22ක...

මේ වන විට ලංකා විදුලි බල මණ්ඩලය ලබන අලාභය අනුව විදුලි ගාස්තු වැඩි වීම සිදු විය යුත්තේ සියයට 18කින් බව ලංකා විදුලි බල මණ්ඩලයේ වැඩ බලන සාමාන්‍යාධිකාරී ආචාර්ය නරේන්ද්‍ර ද සිල්වා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පැවැති මහජන සැසියට එක් වෙමින් ඊයේ (18දා) පැවැසීය.

මීට පෙර මෙම පාඩුව බිලියන 32ක ලෙස සඳහන් වුවද මේ වන විට එය බිලියන 18ක් ලෙස සඳහන් වන බවද හෙතෙම මෙහිදී කීය.

වසරකට දෙවතාවක් විදුලි ගාස්තු සංශෝධනය කළ යුතුව තිබුණද සුවිශේෂී අවස්ථා යටතේ යළිත් සියයට 22කින් විදුලි මිල ඔක්තෝබර් මාසයේ සිට වැඩි කළ යුතු බවට දක්වමින් ලංකා විදුලිබල මණ්ඩලය මහජන උපයෝගිතා කොමිෂන් සභාවට දැනුම් දී තිබිණි.

අධික වර්ෂාවක් ලැබීමත් හා උෂ්ණත්වය පහළ යෑමත් සමඟ විදුලි උත්පාදන වියදම හා ඉල්ලුම මේ වන විට අඩුවී ඇති හෙයින් සියයට 18කින් විදුලි ගාස්තු ඉහළ දැමීමට අවශ්‍ය බව මෙහිදී හෙතෙම සඳහන් කළේය.

මේ වසරේ පළමු විදුලි ගාස්තු සංශෝධනය සඳහා අනුමැතිය පෙබරවාරි 15 වැනි දින ලැබුණු අතර එහිදී 66%කින් විදුලි ගාස්තු ඉහළ දැමිණි.

## මන්ත්‍රී උද්දිකට...

ප්‍රවීණ රංගන ශිල්පී අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී උද්දික ප්‍රේමරත්නගේ ආරක්ෂාවට යොදවා සිටින ප්‍රභූ ආරක්ෂක අංශයට අනුයුක්ත පොලිස් නිලධාරීන් දෙදෙනාට නිකුත් කර ඇති පැති අවි දෙකින් (පිස්තෝල දෙකෙන්) වෙඩි ප්‍රහාර එල්ල කර ඇද්ද? යන්න අනාවරණ කර ගැනීම සඳහා එම පැති අවි දෙක (පිස්තෝල දෙක) වහාම රජයේ රස පරීක්ෂකවරයා වෙත යවා රස පරීක්ෂක විමර්ශනයේ වාර්තාව අධිකරණයට ඉදිරිපත් කරන ලෙස අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු නාලක සංජීව ජයසූරිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඊයේ (18දා) නියෝග කළේය.

ප්‍රධාන මහෙස්ත්‍රාත් නාලක සංජීව ජයසූරිය මෙසේ නියෝග කළේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැඩිදුර වාර්තාවක් මඟින් අධිකරණයට කළ කරුණු දැක්වීමක් සැලකිල්ලට ගනිමිනි.

අදාළ වැඩිදුර වාර්තාව අධිකරණයට ඉදිරිපත් කරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැවැසුවේ අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී උද්දික ප්‍රේමරත්න ඉලක්ක කර ගනිමින් එල්ල කර ඇති බව කියන වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් අරඹා ඇති බවයි. මෙම වෙඩි තැබීමේ සිද්ධියට සම්බන්ධ බවට කිසිදු සැකකරුවකු මෙතෙක් හඳුනාගෙන නොමැති බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට දැන්වීය.

## සතොස...

ලංකා සතොස ආනයනික සහ දේශීය ටින් මාළු, මුංඇට, හාල්මැස්සන් සහ කොත්තමල්ලි යන පාරිභෝගික භාණ්ඩ පහක මිල අද (19දා) සිට පහත පරිදි අඩුකර ඇතැයි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව නිවේදනය කර ඇත.

ආනයනික ටින්මාළු (ග්‍රෑම්425) රුපියල් 35කින්, මුංඇට කිලෝවක මිල රුපියල් 20කින්, හාල්මැස්සන් කිලෝවක් රුපියල් 10කින්, කොත්තමල්ලි කිලෝවක් රුපියල් 10කින් සහ දේශීය ටින්මාළු (ග්‍රෑම්425) රුපියල් 5කින් වශයෙන් මිල අඩු කර තිබේ.

ඒ අනුව රුපියල් 685 පැවැති ආනයනික ටින්මාළු (ග්‍රෑම්425) රුපියල් 650ක්ද, රුපියල් 1,120 පැවැති මුංඇට කිලෝවක් රුපියල් 1,100ක්ද, රුපියල් 1,200 පැවැති හාල්මැස්සන් කිලෝවක් රුපියල් 1,090ක්ද, රුපියල් 550 පැවැති කොත්තමල්ලි කිලෝවක් රුපියල් 540ක්ද, රුපියල් 550 පැවැති දේශීය ටින්මාළු (ග්‍රෑම්425) රුපියල් 545ක් ලෙස මිල අඩුවී තිබේ.

## යුද උණුසුම පිට...

විදේශීය වෙළෙඳපොළේ රත්රන් මිල ඩොලර් සියයට වැඩි අගයකින් ඉහළ යෑම එයට හේතුවී ඇත.

ඒ අනුව කැරට් 22 සහ කැරට් 24 රන් පවුමක මිල එලෙස සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් තිබෙන අතර කැරට් 24ක රන් පවුමක් රුපියල් 1,73,000ක් පමණ මිලකට මේ වන විට අලෙවි වේ. ඊශ්‍රායලය හා පලස්තීනය අතර පවතින යුද්ධමය තත්ත්වය රන් මිලෙහි ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බව ආරංචි මාර්ග අනාවරණය කරයි.

## මැතිවරණ ක්‍රමය...

විශ්‍රාමික අගවිනිසුරු ජනාධිපති නීතිඥ ප්‍රියසත් ඩෙප්ගේ සභාපතිත්වයෙන් යුත් මෙම කොමිසමෙහි සුන්දරම් අරුමෙනායගම්, සේනානායක අලිසැන්ඩ්‍රලාගේ, ජනාධිපති නීතිඥ නලින් අබේසේකර, රජිත නවින් සේනාරත්න, අහමඩ් ලෙබ්බෙ මොහොමඩ් සලීම්, දීපානි සමන්ත රොඩ්රිගෝ යන මහත්වරු හා සාගරිකා දෙල්ගොඩ, හිමල්කා ප්‍රනාන්දු යන මහත්මීහු සෙසු සාමාජිකයෝ වෙති.

මූලික කරුණු 7ක් ඇතුළුව සියලුම මැතිවරණ නීති රීති පිළිබඳව පරීක්ෂා කර කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි මැතිවරණ නීති සංශෝධනය කිරීමට අවශ්‍ය නිර්දේශ සහිතව මාස 6ක් ඇතුළත වාර්තාවක් ලබා දෙන්නැයි නියෝග කරමින් ජනාධිපතිවරයා මෙම පත්කිරීමට අදාළ ගැසට්ටුව නිකුත් කර ඇත.

කාන්තා හා තරුණ නියෝජනය වැඩි කිරීම, මැතිවරණයක් ප්‍රකාශයට පත්කළ දින සිට එකී මැතිවරණය පවත්වා ප්‍රතිඵල නිකුත් කරනු ලබන දින දක්වා වන කාලය අඩු කිරීම, ඡන්දය භාවිත කිරීමේදී මුද්‍රිත ඡන්ද පත්‍රිකාවක් වෙනුවට ඉලෙක්ට්‍රොනික ඡන්ද භාවිතය, විදෙස්ගත ලාංකිකයන්ට ඡන්දය භාවිතයට අවශ්‍ය කටයුතු සම්පාදනය, එකම පුද්ගලයකුට මහජන නියෝජිතයන් තෝරාගැනීමේ මැතිවරණ දෙකකට තරග කිරීමටත් සහ තේරී පත්වුවහොත් එකවර අදාළ සභා දෙකම නියෝජනය කිරීමට අවස්ථාව ලබාදීම, මැතිවරණ කටයුතු වෙනුවෙන් සේවා සපයන රාජ්‍ය අංශයේ නොවන ඡන්දදායකයන්ටද තැපැල් ඡන්ද අවස්ථාව දීම හා මහජන නියෝජිතයන් තෝරාගැනීමට සමාජයේ බහුත්ව ලක්ෂණ නියෝජනය වන පරිදි සමානුපාතික හා කේවල ක්‍රම සම්මිශ්‍ර ඡන්ද ක්‍රමයක් සැකැසීම අදාළ මූලික කාරණා අත වේ.

## විනිවිදභාවය අතින්...

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 17 වැනි වැඩසටහන ආරම්භ කිරීමෙන් පසු ප්‍රගතිය හා විනිවිදභාවය අතින් දුර්වලම මට්ටම ඉකුත් සැප්තැම්බර් මාසයේදී වාර්තා වී ඇතැයි වෙරිටේ රිසර්ච් ආයතනය පවසයි.

2023 ශ්‍රී ලංකාව අන්තර්ජාතික මූල්‍ය අරමුදල වෙත යැවූ අභිප්‍රාය ලිපිය අනුව එම අරමුදලේ අනුමැතිය හිමිවූ ණය වැඩසටහනේ හඳුනාගත් කැපවීම් 100ක ප්‍රගතිය මනින 'අයි.එම්.එෆ්. මීටරය' නමැති දර්ශකය අනුව වෙරිටේ රිසර්ච් ආයතනය මේ බව සඳහන් කර ඇත.

සැප්තැම්බර් අග වන විට සම්පූර්ණ කිරීමට නියමිත කැපවීම්වලින් සියයට 30ක පමණ තත්ත්වය 'නොදනී' මට්ටමේ සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීමට ආණ්ඩුව ඉටුකළ යුතුව තිබෙන විශේෂිත කැපවීම් 4න් 3ක්ම තවමත් පවතින්නේ 'ඉටුකර නොමැති' මට්ටමේ වීම මෙම තත්ත්වයට මූලික හේතුව වී ඇතැයි වෙරිටේ රිසර්ච් නිකුත් කළ නිවේදනයේ සඳහන් වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනෙහි සැප්තැම්බර් මාසය අවසන් වනවිට එකඟ වූ කැපවීම් 71න් ඉටුකර ඇත්තේ 40ක් පමණක් යැයිද 'අයි.එම්.එෆ්. මීටරය' සිය නවතම යාවත්කාලීන කිරීම්වලින් පෙන්වා දේ.

මූල්‍ය අරමුදලේ වැඩසටහනේ ආයතනික මට්ටමේ ගිවිසුමෙන් පසු ගෙවී ඇති මාස හතක කාලය තුළ විනිවිදභාවය සම්බන්ධ අවශ්‍යතාවලින් බහුතරයක් තවමත් ඇත්තේ 'ඉටු කර නැති' මට්ටමේ යැයි පවසන වෙරිටේ රිසර්ච් ආයතනය සැප්තැම්බරයේ ඉටු කිරීමට නියමිතව තිබූ නමුත් තවමත් ඉටු කර නැති 'රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඊළඟ මාසයේ තුන්වන ව්‍යාපාරික දිනය වන විට ආදායම් වියදම් සහ මූල්‍යකරණයෙන් මාසික මුදල් ප්‍රවාහ වාර්තා කිරීම' සඳහා වූ කැපවීම ඊට එක් උදාහරණයක් යැයි පවසයි.

## තිස්සමහාරාමයේ වැවක්...

තිස්සමහාරාම සාචන්තිස්සපුර ප්‍රදේශයේ පිහිටි සියඹලගස් වැව ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ගොවීන් කළ ඉල්ලීමකට අනුව මීට මාස තුනකට පමණ ඉහතදී ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළද වැවෙහි ඉඩම් අල්ලා වැටකඩුලු යොදා කොටු කරගෙන සිටි ව්‍යාපාරිකයකු ඇතුළු පිරිසක් එම ඉඩම් නිදහස් නොකිරීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු මාස දෙකක කාලයක් තිස්සේ නතර කිරීමට සිදුව ඇතැයි තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් මනෝජ් කොඩිතුවක්කු පැවැසීය.

සියඹලගස් වැවෙන් ගොවි පවුල් 65ක් පෝෂණය වන අතර දිවිය ශක්ති ගොවි සංවිධාන විසින් තිස්සමහාරාම සහකාර ප්‍රාදේශීය ලේකම් මනෝජ් කොඩිතුවක්කු වෙත මෙම ගැටලුව ඉදිරිපත් කිරීමෙන් පසු වහාම වැවට අයත් ඉඩම් පවරාගන්නා ලෙස අදාළ බලධාරීන්ට උපදෙස් ලබාදී තිබුණේය. ඒ අනුව පෙරේදා (17දා) වාරිමාර්ග නිලධාරීන්, පළාත් ඉඩම් නිලධාරීන් සමඟ මිනින්දෝරු නිලධාරීන් පැමිණ වැවට අයිති ඉඩම් මායිම් ගල් යොදා සලකුණු කිරීම ආරම්භ කළේය. එම අවස්ථාවේ ඉඩම් අල්ලාගෙන සිටි ව්‍යාපාරිකයන් ඇතුළු තවත් කිහිපදෙනකු පැමිණ නිලධාරීන්ට විරෝධය දැක්වූ අතර ගොවීන් සමඟ උණුසුම් වචන හුවමාරුවක් ඇති විය.

වැව අල්ලාගෙන සිටි ව්‍යාපාරිකයා සහ තවත් පුද්ගලයන් කිහිපදෙනකුට නීත්‍යනුකූල අයිතියක් නොමැති බව පෙන්වා දුන් මිනින්දෝරු නිලධාරීන් වැවට අයිති සීමාව සලකුණු කර මායිම් ගල් ඇතිරීම සිදු කළේය. ඉඩම් අල්ලා ගත් පුද්ගලයා දේශපාලන බලය යොදවා වැව හරහා විදුලිය සහ පානීය ජලයද ලබාගෙන තිබූ බව ගොවීන් පෙන්වා දුන්නේය.

ඉදිකිරීම් ප්‍රමාද වීම සම්බන්ධයෙන් තිස්සමහාරාම සහකාර ප්‍රාදේශීය ලේකම් මනෝජ් කොඩිතුවක්කුගෙන් කළ විමසීමකදී වැවට අයිති අක්කර 15ක පමණ භූමි ප්‍රමාණයෙන් අක්කර හතක් පමණ වැටකඩුලු යොදා කොටු කරගෙන නිලධාරීන්ට බාධා කිරීමෙන් මාස දෙකක් ප්‍රමාද වූ බව කීය. හෙට සිට යළි ඉදිකිරීම් ආරම්භ කිරීමට උපදෙස් ලබාදී ඇති බවත් ඔහු සඳහන් කළේය.

## මාර්ගගත පනතට...

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතට එරෙහිව මේ වනවිට පෙත්සම් 45ක් ශ්‍රේෂ්ඨාධිකරණයට ලැබී ඇති බව කථානායක මහින්ද යාපා අබේවර්ධන ඊයේ (18දා) පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේය.

මෙම පනත් කෙටුම්පතට යම් සංශෝධන ඉදිරිපත් කිරීමට රජය තීරණය කර ඇතැයි නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී ඇති බවද කථානායකවරයා නිවේදනය කළේය.

මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් විසින් පසුගිය 3 වැනිදා මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාව පිළිබඳ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය. එම කෙටුම්පතට අනුව ජනාධිපතිවරයා පත් කරන කොමිසමේ නියෝග මත සමාජ මාධ්‍ය ගිණුම් ඇතුළු ඕනෑම ඔන්ලයින් ප්‍රකාශනයක් තහනම් කිරීමට හා අවහිර කිරීමටත් එම ප්‍රකාශන සම්බන්ධයෙන් සිරදඬුවම් නියම කිරීමටත් නීති පැනවීමට යෝජනා කර තිබේ.

## විධායක ජනාධිපති ක්‍රමය...

විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට වත්මන් ආණ්ඩුවට ජනවරමක් නොමැති බව අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ ඊයේ (18දා) පාර්ලිමේන්තුවේදී පැවැසීය.

විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම වෙනුවෙන් තමා කැබිනට් මණ්ඩලයට යෝජනා නොකළ අතර තමා යෝජනා කළේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම ගැන යැයිද කැබිනට් අමාත්‍ය විජයදාස රාජපක්ෂ පාර්ලිමේන්තුවේදී පැවැසීය.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ කිසිදු අවශ්‍යතාවක් ආණ්ඩුවට නැතැයිද එසේ කිරීමට ජනවරමක් තම ආණ්ඩුවට ලබාදී නැතැයි රාජපක්ෂ අමාත්‍යවරයා කීය. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම යම් බලවේගයක් විසින් මතු කළ පදනමක් නොමැති කතාවක් බවද අමාත්‍යවරයා පැවැසීය.

## ලොව කොතැන හිටියත්...

ලොව කොතැනක සිටියත් මෙරට ජනාධිපතිවරයකුට මෙරට පොලිස්පතිවරයා පත් කිරීමේ බලය තිබෙන අතර ඒ අනුව දැනට පොලිසියේ වැඩකටයුතු කරගෙන යන බව අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන පාර්ලිමේන්තුවේදී ඊයේ (18දා) පැවැසීය.

අද වනවිට රටේ පොලිස්පතිවරයා පත්කිරීම සම්බන්ධයෙන් මත දෙකක් පවතින අතර වහාම පොලිස්පතිවරයා කවුද යන්න පිළිබඳ හෙළි කරන්න යැයි පාර්ලිමේන්තු මන්ත්‍රී ශානක්කියන් රාසමානික්කම් අග්‍රාමාත්‍යවරයාගෙන් මෙහිදී ඉල්ලා සිටියේය.

ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ නොසිටින අවස්ථාවක මෙලෙස චෝදනා කිරීම වැරදි බවත් ජනාධිපතිවරයා තාවකාලිකව පොලිස්පතිවරයා පත් කිරීමට ව්‍යවස්ථා සභාවට දැනුම් දී ඇති බවත්, නමුත් යම් නීතිමය බාධා නිසා එය සිදු කිරීම කළ නොහැකි බවට එම සභාව දැනුම් දී ඇති අතර නමුත් නැවත ඊට අදාළව යෝජනා ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයාට හැකි බවත් මෙහිදී නිමල් ලන්සා මන්ත්‍රීවරයා කීය.

## මීගහතැන්න...


එම තොරතුර ලැබුණු සැණින් ක්‍රියාත්මක වූ එම ස්ථානාධිපතිවරයා වහා මේ සම්බන්ධයෙන් මීගහතැන්න පොලිස් ස්ථානාධිපතිවරයා දැනුවත් කරන ලදී.

ලැබුණු තොරතුර ඉවත නොදැමූ මීගහතැන්න පොලිස් ස්ථානාධිපතිවරයා ක්ෂණිකව ක්‍රියාත්මක වී වහා කණ්ඩායමක් සමඟ කළුපහන ප්‍රදේශයට පිටත්ව ගියහ.

අපරාධයක් සිදුකිරීමට ඇති හැකියාව වළකාලමින් සැකසහිත පුද්ගලයාගේ නිවෙස සෝදිසි කිරීමේදී එම නිවෙස තුළ තිබී විවිධ වර්ගයේ ආයුධ තොගයක් සොයාගැනීමට නිලධාරීන්ට හැකිවිණි.

මතුගම, මහකළුපහන, මල්ලිකාගොඩ ප්‍රදේශයේ පිහිටි නිවෙස තුළ සඟවා තිබූ විදේශ රටක ජීව අත්බෝම්බයක්, පුපුරණ ද්‍රව්‍ය අඩංගු පාර්සලයක්, වායු රයිෆලයක්, ඒ සඳහා යොදන උණ්ඩ 111ක්, යකඩ කඩුවක්, කිණිසි දෙකක්, විවිධ වර්ගයේ පතරොම් සහ පතරොම් කොපු මෙන්ම අපරාධයක් සඳහා භාවිත කිරීමට යොදාගත් බවට සැක කළ හැකි අත්වැසුම් 02ක්ද සමඟින් සැකකරුද මීගහතැන්න පොලිසියේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබිණි.

වලාන දූෂණ මර්දන ප්‍රහාරක බළකායේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඉන්දික වීරසිංහ සහ මීගහතැන්න පොලිස් ස්ථානාධිපති පී.සී.එස්. දහනායකගේ මෙහෙයවීම මත මෙම වැටලීම සිදු කර තිබේ.



## දවසේ පද 4

කංසා නිසා අඹු දරුවන් දුක් විඳිතෙයි
හීනා ගමේ දුක හඳුනා හඬ නඟතෙයි
ඩයනා ඒරොප්පෙ බෙර පදයට නටතෙයි
රෝමය ගිනි ගනී නීරෝ වෙණ වයතෙයි

විදුර අබේනායක



# ලවණ බාධකයෙන් මාතරට නොබසින ගංවතුරක්

## සැප්තැම්බරයේ ගැලු වතුර තවම එහෙමමයි

## ප්‍රදේශවාසීහු කබලෙන් ළිපට - කුඹුරු අක්කර 12,000ක් විනාශයි

## දරුවන්ට පාසල් යන්නත් නෑ

ලෝකයේ පැරැණි ශිෂ්ටාචාර බිහි වී ඇත්තේ ගංගා නිම්න ආශ්‍රිතව බව පෙනේ. එමෙන්ම ලෝකයේ මෙන්ම අපේ රටේද ජනාවාස ඇති වී තිබෙන්නේත් ගංගා නිම්නවලය. මිනිස්සු ඈත අතීතයේ සිට ජීවත්වීම සඳහා ගංගා නිම්න තෝරා ගනු ලැබුවේ කෘෂිකාර්මික කටයුතුවලට අවශ්‍ය ජලය ලබා ගැනීමට මෙන්ම අනෙකුත් එදිනෙදා අවශ්‍යතා සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීමේ පහසුව නිසාය.

එලෙස ගත වර්ෂ ගණනකට පෙර ජනාවාස බවට පත්කරගෙන වතු පිටි වගා කරගෙන සත්ත්ව පාලනය ආදී විවිධ ජීවනෝපායවල යෙදෙමින් ගෙවල් දොරවල් හදාගෙන නිල්වලා නිම්නයේ ජීවත් වන දහස් ගණනක් ජනතාවට බැස නොයන ගංවතුර නිසා සිය පාරම්පරික වාස භූමි අත්හැර දමා යෑමේ අවදානමක් ඇතිව තිබීම කනගාටුදායක තත්ත්වයකි.

නිල්වලා නිම්නයේ ජීවත්වන ජනතාවට ගං වතුර අරුමයක් නොවේ. ගොස්තල සඳු මුලුහින් ආරම්භ වී සැතපුම් ගණනක් ගෙවා මාතර තොටමුණෙන් මුහුදට එක්වන නිල්වලා නදිය කාලාන්තරයක් තිස්සේ අවුරුද්දකට කිහිප වතාවක් පිටාර ගලා ගම් බිම් යට කර දැමීම එම ප්‍රදේශවල ජීවත්වන ජනතාවට පුරුදු පුරුදු තත්ත්වයකි. ගං වතුර ගලන කාලයට කොට්ට පැදුරු අකුළාගෙන උස් බිමක සිටින නෑයෙකුගේ හෝ හිතවතෙකුගේ ගෙදරක දවසක් දෙක ඉහක් ගත කර ගංවතුර බැස ගිය පසු හැවින නිවෙස් වෙත පැමිණ සුපුරුදු ජීවන අරගලයට මුහුණ දීමට නිල්වලා නිම්නයේ ජීවත්වන ජනතාව පුරුදුව සිටියහ.

එහෙත් මේ වන විට මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට මුහුණ දීමට සිදුව තිබෙන්නේ ඔවුන් ජීවිත කාලය තුළම අත්නොවිඳි අමිහිරි අත්දැකීමකට බව පෙනේ. සමහර ප්‍රදේශවලට පසුගිය සැප්තැම්බර් දෙවැනිදා ගැලූ ගංවතුර තවමත් බැස නොස් නැත. මාසයකට අධික කාලයක් පැවැති ගංවතුර බැස ගිය ප්‍රදේශවලද කෙත් බිම් ජලයෙන් යටවී තිබීම නිසා සහමුලින්ම විනාශ වී ඇත. අනුන්ට අත නොපා සිය දහඩිය මහන්සියෙන් කෙත් වතු අස්වද්දා අභිමානයෙන් මේ ප්‍රදේශවල ජීවත් වූ ගොවි ජනතාව අද යාචකයන් පිරිසක් බවට පත්ව සිටිති. ඔවුන් නිල්වලා ගඟ දෙස බලා සුසුම්ලන්නේ කවර නම් සාපයක් තමන්ට පලදී ඇත්දැයි කල්පනා කරමිනි. නිල්වලා නදිය මෙතරම් කුරිරු වූයේ ඇයි දැයි සිතා ගත නොහැකිවය.

නිල්වලා ගඟ හරහා ඉදිකළ ලවණ බාධකය මේ සියලු විපත්වලට මුලවී තිබේ. ලවණ බාධකය යනු කුමක්දැයි විමසා බැලිය යුතුය.

නිල්වලා ගඟේ ඉහළ කොටසේ වැඩි බෑවුමකින් යුතු නිසා ගඟ ඉහළ ජලාධාර ප්‍රදේශයට වසින වැසි ජලය බාධාවකින් තොරව ගඟ දිගේ පහළට ගලයි. එහෙත් අකුරැස්සෙන් පහළ කොටස තැනිතලා බිමක් නිසා ඒ ප්‍රදේශය හරහා ජලය ගලා යෑම සිදු වන්නේ ඉතාමත් මන්දගාමී ලෙසය. මේ නිසා එම ප්‍රදේශය නිරතුරුව ගං වතුර තර්ජනයට ලක්වේ. එම ප්‍රදේශයට නිතර ඇති වන ගංවතුර වැළැක්වීම සඳහා 1980 දශකයේ නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

නිල්වලා ගඟෙහි ගංවතුර වැළැක්වීමේ යෝජනා ක්‍රමය මඟින් සිදුකරනු ලැබූයේ ගඟ දෙපස තිබූ උස් බිම් යා කරමින් වේලි පද්ධතියක් ඉදි කිරීමයි. මෙම වේලිවලින් ඔබ්බට ගඟේ පිටාර ගලන ජලය ගලා නොයෑම නිසා ඒ ප්‍රදේශ ගංවතුරෙන් ආරක්ෂා වන අතර එම පෙදෙස් ආරක්ෂිත කලාපයක් බවට පත්විය. ආරක්ෂිත කලාපයට වසින වැසි ජලය මාකඳුරුගොඩ සහ තුඩාව යන ස්ථානවල පොම්ප සවිකර මඟ ගඟට පොම්ප කිරීමද මෙම ව්‍යාපෘතිය යටතේ සිදුවිය. නිල්වලා ගංවතුර වැළැක්වීමේ යෝජනා ක්‍රමයේ පළමු අදියර මඟින් කිරලකෑලේ ප්‍රදේශය ආරක්ෂා කෙරුණු අතර දෙවැනි අදියර මඟින් කඹුරුගමුව ප්‍රදේශය ආරක්ෂා කිරීම සිදුවිය.

නිල්වලා ගඟේ ගලන ජලය පීත්වැල්ල ප්‍රදේශයෙන් ඇළක් සාදා මුහුදට යැවීම ඇතුළු 3 වන අදියර 88/89 රට තුළ පැවති අස්ථාවරත්වය නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එහෙත් විශාල ප්‍රදේශයක පැතිරුණ ජලය එම වේලි අතරෙන් ගඟ දිගේ මුහුදට ගලා යෑමට සිදුවිය. වේලිවලින් ගඟ පැත්තේ පිහිටි ප්‍රදේශය අනාරක්ෂිත කලාපය බවට පත්විය.

ලවණ බාධකය ඉදිකිරීම සිදුවූයේ එවැනි පසුබිමකය. පායන කාලයට උඩින් මිරිදිය වතුර මුහුදට ගලා යන අතර යටින් මුහුදු ජලය ගඟ දිගේ ඉහළට ගමන් කරයි. ජල සම්පාදන මණ්ඩලයේ පොම්පාගාරවලට පායන කාලයට මුහුදු ජලය මිශ්‍ර වීම නිසා පානීය ජලය ලබාදීමේ ගැටලුවට විසඳුමක් වශයෙන් ලවණ බාධකය ඉදි කිරීමට කටයුතු කෙරිණි.

ලවණ බාධකය ඉදිකිරීම නිසා ගඟේ පළල සහ ගැඹුර අඩු කර ඇතැයි ප්‍රදේශයේ ජනතාව පවසති. ගඟේ අවසාන කොටසේ ඉදි කිරීම් යතුරත් තිබේ.

බ්‍රෙන්ඩන්සර පාලම (පළල අඩි 300), කෝට්ටේ පාලම (පළල අඩි 330), මහානාම පාලම (පළල අඩි 380) යන පාලම් තුනෙන් එකකවත් ගැඹුර සීමා කර නැත. එහෙත් ලවණ බාධකයේ පළල අඩි 160ක් වන අතර ගඟේ ගැඹුර අඩි 16ත් 18ත් පමණ එයින් අඩු වී තිබේ.

ලවණ බාධකයෙන් නිල්වලා ගඟේ ඇති වී පවතින ගැටලුව එයයි. පසුගියදා මාතර දිස්ත්‍රික්කයට බලපෑ ඇති ගංවතුර මඟින් මහ ගංවතුරක බලපෑමට මුහුණ දීමට මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට සිදුවූයේද මෙම ලවණ බාධකය නිසාය.

එක දිගට මාසයකට අධික කාලයක් පැවැති ගංවතුර නිසා අසරණ වූ නිල්වලා නිම්නයේ ගොවි ජනතාව වෙතින් තතුතොරතුරු සොයා ගංගා නිම්නයේ පැතිපාලා බිම්වල 'මව්බිම' කළ සංචාරයේදී ගොවි ජනතාවගේ හඬ මෙසේ විය.

**කරගොඩ, හාරංගල කාකුඩුවවත්තේ, බන්දුල සෝමසිංගොඩ මෙසේ කීය.**

"මේ පැත්තට ගංවතුර ගැලුවේ පසුගිය සැප්තැම්බර් මාසෙ දෙවැනිදා. මේ වන විට ගංවතුර බැස යමින් තිබුණත් මාලිම්බඩ, වැල්ලෙතොට පාර, කද්දුව හරහා කඹුරුපිටිය පාරේ උහිත්දුවෙල ප්‍රදේශයේ පාර තවමත් යට වෙලා. කුඹුරුවල වතුර තවම බැහැල නැහැ. මම අක්කර 12ක් පසුගිය කන්නයේ වගා කළා. ගොයම් කිරට හම්දිදී තමයි ගංවතුර ගැලුවෙ. එක වී ඇටයක් ගන්න ලැබුණෙ නැහැ. ණය වෙලා කුඹුරුවලට වියදම් කරපු රුපියල් ලක්ෂ ගණනක් විනාශයි. දරුවන්ට කෑද ටිකක් හදපු දොස්සවත් හාල් ටිකක් ගෙදර නැහැ. ඉස්සර ගෙදරට හැදෑයෙක් ආවම වී මල්ලක් තොටලු හාල් ටික දෙනව ගෙනියන්න. දැන් අපටත් කාගෙන් හරි හාල් ටිකක් ඉල්ලගෙන ඇවිල්ල තමයි කන්න වෙලා තියෙන්නෙ. ගංවතුර ගැලුවම බත් පැකට් එකක් දීල වියළි ආහාර පාර්සලයක් දීල මේ වෙච්ච විනාශය පිරිමහන්න බැහැ. මේකට සාධාරණ විසඳුමක් ලබා දෙන්න ඕන. දරුවන්ට මාසෙකට වැඩි කාලයක් ඉස්කෝලෙ යන්න බැරි වුණා. පසුගිය සතියෙ පැවැත්වුණ ශිෂ්‍යත්ව විභාගෙට මේ පැතිවල ළමයි ගියේ යුද්දෙට යනව වගේ බිපල් රථවල, ට්‍රැක්ටර්වල නැගලයි.

**පහළ විටියල, ගොරකගහමුල්ලේ එරන්ද මැද්දෙගොඩ,**

නිල්වලා ගඟ හරහා ඉදිකරපු ලවණ බාධකය මේ සේරටම මුලයි. මේ නිසා හරියට කන්නය වගා කරන්න බැරි වුණා. මැයි මාසයේ ගලපු ගංවතුර බැස්සට පස්සෙ අකලට තමයි මේ ප්‍රදේශයේ කුඹුරු වගා කළේ. හරියටම කුඹුරුවල ගොයම් කිරිවදිනකොට ආයිමත් ගංවතුර ගැලුවා. දැන් ගංවතුර ගලල මාසයකට වැඩියි. මේ ගංවතුර නිසා නිල්වලා පහළ නිම්නයේ කුඹුරු අක්කර 12,000කට වඩා විනාශ වෙලා තියෙනවා. ලවණ බාධකයට විසඳුමක් නොදෙනව නම් ගොවියො ඊළඟ කන්නෙ කුඹුරු වපුරන්නෙ නෑ කියල තීරණය කරල තියෙනවා. මේතෙක් ගොවි ජනතාව විතරක් නෙවෙයි ගොවිතැනට සම්බන්ධ අතුරු ව්‍යාපාර කරල ජීවත් වුණ මිනිස්සුන්ටත් යන එන මං නැති වෙලා. අත්ට්‍රැක්ටර්, මහ ට්‍රැක්ටර් තියාගෙන ගොයම් පාගල වී ටික ඇදල පාවර බුලං කරල ජීවත්වෙන දෙතුන් සීයකට වැඩි පිරිසකටත් මේ නිසා ආදායමක් නැතිව ගියා.

කුඹුරුවලට විතරක් නෙවෙයි මේ ගං වතුර නිසා කෝටි ගණනක් වියදම් කරල හදපු පාරවල්වල කාපට් ගැලවිලා විනාශ වෙලා."

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් අජිත් ගුණසේකරගෙන් මේ සම්බන්ධව කළ විමසීමකදී ඔහු කියා සිටියේ, මීට වසර දෙකකට පමණ පෙර මෙම ලවණ බාධකය ඉදිකරන ලද්දේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් බවත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව එය අධීක්ෂණය කර ඇති බවත් ඔහු සඳහන් කළේය.

මේ මඟින් ඇති වී ඇති ගංවතුර ඇතුළු ප්‍රශ්නවලට විසඳුමක් වශයෙන් මේ වනවිට යෝජනා වී ඇත්තේ ගං ඉවුර හරහා මීටර් සියයක් දක්වා ඉදිකර ඇති ශීට් පයිල්වලින් මීටර් 12ක් ඉවත් කිරීමට බව ද ඔහු කීවේය. එය හෙට අනිද්දාම ඉවත් කරනු ඇතැයිද ඉන්පසු පවතින බොහෝ ප්‍රශ්න අවසන් වනු ඇතැයි නොපෙම සඳහන් කළේය.

■ කඹුරුපිටිය - පී.එල්. ජයවර්ධන, දෙයියන්දර - වී. විජේසේකර











> ❝ නිල්වලා ගඟ හරහා ඉදිකරපු ලවණ බාධකය මේ සේරටම මුලයි. මේ නිසා හරියට කන්නය වගා කරන්න බැරි වුණා. මැයි මාසයේ ගලපු ගංවතුර බැස්සට පස්සෙ අකලට තමයි මේ ප්‍රදේශයේ කුඹුරු වගා කළේ. හරියටම කුඹුරුවල ගොයම් කිරිවදිනකොට ආයිමත් ගංවතුර ගැලුවා. දැන් ගංවතුර ගලල මාසයකට වැඩියි. මේ ගංවතුර නිසා නිල්වලා පහළ නිම්නයේ කුඹුරු අක්කර 12,000කට වඩා විනාශ වෙලා තියෙනවා. ලවණ බාධකයට විසඳුමක් නොදෙනව නම් ගොවියො ඊළඟ කන්නෙ කුඹුරු වපුරන්නෙ නෑ කියල තීරණය කරල තියෙනවා.





# බඹරු - දෙබරු හා සුමිතුරු මහවිලච්චියේ ප්‍රභාත් අනතුරුදායක බඹරවද පන්දාහක් ඉවත් කරලා

■ මහවිලච්චිය - ආනන්ද ජයසිරි

කිසිදු පුද්ගලයකුට හානි නොවන සේ බඹර කූඩ සහ දෙබර කූඩ පන්දහසකට වැඩි ප්‍රමාණයක් එම සතුන්ගේ ජීවිතවලටද කිසිදු හානියක් නොවන සේ වසර අටක් තුළ ඉවත් කළ තරුණයකු මහවිලච්චිය ප්‍රදේශයෙන් 'මව්බිම' ට හමුවිය.

මහවිලච්චිය වම් ඉවුරේ, අංක 140 දරන ලිපිනයේ පදිංචි මේ තරුණයා රජිත ප්‍රභාත් ධර්මදාස නම් වේ. බහුකාර්ය සේවකයකු ලෙස ඔහු රැකියාව කරනු ලබන්නේ ඕයාමඩුව පොලිසියේ වන අතර මේ වනතුරුත් රැකියාවද ස්ථිර වී නැත.

වන සතුන්ට අපමණ දයාවක් දක්වන රජිත කුඩා කල සිටම සතුන් කෙරෙහි ඇල්මක් දක්වයි. ඔහු සර්පයන්ටද කිසිදු බියක් නොදක්වයි. වඳුරන්, මුවන් වැනි සතුන් මෙන්ම කිඹුලාද මෙල්ල කිරීමේ සුවිශේෂී හැකියාවක් ඔහු සතුව ඇත.

බඹර කූඩ 10, 20, 50, 100 වැනි සංඛ්‍යා දිනකට ඉවත් කර ඇති බවත් එක් දිනක් තුළ ඉවත් කළ වැඩිම බඹර කූඩ සංඛ්‍යාව 148ක් බවත් ඔහු පැවැසීය. එසේ බඹර කූඩ 148ක් ඉවත් කර ඇත්තේ තඹුත්තේගම කෝන්වැව චීන ජල ව්‍යාපෘතියෙන් මීට වසර එකහමාරකට පමණ පෙරදීය. අනුරාධපුර භික්ෂු විශ්වවිද්‍යාලය ,රජරට විශ්ව විද්‍යාලය, අනුරාධපුර ශික්ෂණ රෝහල, මධ්‍ය විද්‍යාලය, ස්වර්ණපාලි බාලිකාව, යුද හමුදා කඳවුර, මැදවච්චිය බස්නාහිර රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අනුරාධපුර නේවාසිකාගාරය, ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය, අභයගිරිය ජේතවනාරාමය ආදී අනුරාධපුර සුප්‍රසිද්ධ ස්ථාන රැසක මෙන්ම පෞද්ගලික නිවාස රැසක මොහු මේ දක්ෂතා දක්වා තිබේ. එපමණක් නොව රජරටින් බාහිරව මොරටුව විශ්වවිද්‍යාලය, හිරු රූපවාහිනී මාධ්‍ය පරිශ්‍රය ආදී කොළඹ ප්‍රදේශය ඇතුළු ප්‍රදේශ රැසක මෙය සිදුකර ඇත.

"ලෝකයේ පැවැත්ම තියෙන්නේ මේ සතුන් නිසා. මේ සතුන් තුරන්වුණා මිනිසාටද මිහිතලයෙන් සමුගන්නට සිදුවෙනවා. මේ සතුන්ට හිංසා කියන්න නම් එපා කියලත් මම ජනතාවගෙන් ඉල්ලනවා." යැයි ඔහු කියයි.

රජිත සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය නම් 0786100598 දුරකථනයට අමතන ලෙසත් ඕනෑම ජනකායක් ඉදිරියේ සතුන් ඉවත් කරන්නේ සතුන්ටද ජනතාවටද කිසිදු අනතුරක් සිදු නොවන ලෙස බවත් ඔහු පැවැසීය. ලංකාවේ කිසිවකුට දෙබර කූඩ දහවල් කාලයේදී ඉවත් කිරීමට නොහැකි අතර ඔවුන් ඒවා ඉවත් කරන්නේ රාත්‍රී කාලයේ පමණි. රජිතට බඹර කූඩ මෙන්ම දෙබර කූඩද දිවා කාලයේ ඉවත් කිරීමට හැකිවීම විස්මයජනකය.

"මම ඉල්ලා සිටින්නේ මේ සේවය මිනිසාට ලබාදීමට අවශ්‍ය ඉඩකඩ දැනට සේවය කරන ඕයාමඩුව පොලිසියේ ලැබෙන නිසා එවැනි තැනක සේවයේ ස්ථිර කර දෙන ලෙසයි." යැයිද ඔහු කීවේය.

මේ රජිත නමැති තරුණයා සම්බන්ධයෙන් අදහස් දැක්වූ අනුරාධපුර කලාප භාර වනජීවී සහකාර අධ්‍යක්ෂ ඩබ්ලිව්. එම්. කේ. චන්ද්‍රරත්න සඳහන් කළේ මොහු ජාතික සම්පතක් බවයි. විශාල මුදලක් අයකර පිහිටුවා ගත් ඇතැම් ආයතන මේවා ඉවත් කිරීමට තෝරා ගන්නේ ඉතා පහසු ස්ථාන පමණක් වුවත් රජිත ඕනෑම උසක බඹර හෝ දෙබර කූඩයක් ඉවත් කිරීමට කටයුතු කිරීම සුවිශේෂී ලක්ෂණයක් බවද කීය. එමෙන්ම කිසිම සතෙකුට ජීවිත හානියක් නොකර මේ බඹර කූඩ, දෙබර කූඩ ඉවත් කිරීම අගය කළ යුතු බවද පැවැසීය.මෙම තරුණයාටද කිසිදු සතෙක් කරදරයක් නොකිරීමද ස්වභාවධර්මය ඔහුට ලබා දුන් දායාදයක් බවද සහකාර අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

පැහැදිලිවම සතුටු වෙනවා මේ තරුණයා සම්බන්ධයෙන්. මේවා ඉවත් කිරීමට සිටින්නේ ඉතා සීමිත පිරිසක් බවද, වනජීවී දෙපාර්තමේන්තුවේ බඹර සහ දෙබර කූඩ ඉවත් කිරීමට මෑතක ලබාදුන් පුහුණුවක් මත බවද සඳහන් කළේය. මේ සහජ හැකියාව පුදුම සහගත බවද කී සහකාර අධ්‍යක්ෂවරයා "අනෙක අපි පුහුණු කණ්ඩායම් මෑතකදී සම්බන්ධ වෙද්දී ඔහු කාලයක් තිස්සේ මේ අපූරු භයානක ක්‍රියාව සිදුකර ඇති බවද" සහකාර අධ්‍යක්ෂවරයා පැවැසීය. ඔහු සමස්ත සමාජයටම හොඳ පූර්වාදර්ශයක් සපයන්නේ යැයිද කී සහකාර අධ්‍යක්ෂවරයා මිනිසා වෙනුවෙන් තමා ගැන නොසිතා මේ ආකාරයෙන් කටයුතු කරන්නේ නම් මුළු ලොවම සාමකාමී ලොවක් වන බවද කීය.


**නම වෙනස් කිරීම**

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය සභාවේ 628 A ඉහළ මිල්ලෑව උතුර ග්‍රාම නිලධාරී වසමේ, 486/A/1, ජයශ්‍රී පෙදෙස, දෙබතගල වත්ත, මිල්ලෑව පදිංචි අභයරාජ මුදියන්සේලාගේ විහඟ නවරත්න වන මා මින් ඉදිරියට අභයරාජ මුදියන්සේලාගේ අනුරී රොෂේන් හසරැල් නවරත්න ලෙස භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දන්වමි.

**නම වෙනස් කිරීම**

ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිල්පනාගොඩ නංදිය වෑගොව්ව 163 / 1 ස්ථානයේ පදිංචි සිංහලජේඩිගේ රම්සලතා කුලසිංහ වන මම මෙතැන් සිට සිංහලගේ රම්සලතා කුලසිංහ යන නම භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**නම වෙනස් කිරීම**

පුත්තලම දිස්ත්‍රික්කයේ රඹාවැව පාර, සංගට්ටිකුලම, ආණමඩුව පදිංචි රත්කොත් ජේඩී පුරයලාගේ අසේල සම්පත් රාජපක්ෂ වන මම මෙතැන් සිට රාජපක්ෂ පතිරනගේ අසේල අයේෂාත් රාජපක්ෂ යන නම භාවිත කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට
රාජපක්ෂ පතිරනගේ අසේල අයේෂාත් රාජපක්ෂ














# මව්බිම

- ලිපිනය
  සිලෝන් නිවුස්පේපර්ස් (පෞද්) සමාගම, 101, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.
- දුරකතන (පොදු)
  011-7566566
- කර්තෘ මණ්ඩලය
  011-7566502/ 011-7566503
- ෆැක්ස් - 011-7566514
- වෙබ් අඩවිය - www.mawbima.lk
- ඊ-මේල්
  news@mawbima.lk
- වෙළඳ දැන්වීම්
  011-7566583/ 011-7566584
- ෆැක්ස් - 011-7566587
- දැන්වීම
  011-7566568/ 011-7566572
- ෆැක්ස් - 011-7566569


# ගාසාවට සාමයේ අරුණලු වැටේවා!

සන්නද්ධ බලයට යොමුවීම ගැටුම් නිරාකරණය කර ගැනීමේ පිළිගත් ක්‍රමවේදයක් ලෙස මිස අනීතික ක්‍රියාවක් ලෙස පළමු ලෝක යුද්ධයේ අවසානය තෙක්ම දේශපාලන ලෝකයේදී සැලකුණේ නැත. යුද්ධය අනීතික ලෙස නම් කරනු ලැබුවේ 1919දී ජාතීන්ගේ සම්මුතිය සහ 1928දී පැරිස් සම්මුතිය විසිනි. 1945දී සම්මත කළ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මඟින් අරමුණු කෙරුණේ යුද්ධය නීතියෙන්ම බැහැර කිරීමය. එම ප්‍රඥප්තියේ 7 වැනි පරිච්ඡේදය මත පදනම්ව ක්‍රියා කරමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයට සාමය සඳහා වන තර්ජනයකට, සාමය උල්ලංඝනය කිරීමකට හෝ ආක්‍රමණකාරී ක්‍රියාවකට ප්‍රතිචාර ලෙස සාමූහික බලය යෙදවීමක් සිදු කළ හැකිය. මේ ආදී ලෙස ලෝකයේ සන්නද්ධ යුද තත්ත්වයන්ට අදාළව සාමූහිකව එළඹුණු සම්මුතියක් රාජ්‍ය අතර පවතී. එහෙත් මැදපෙරදිග ගාසා තීරයට මේ කිසිවක් අදාළ නැති ගානය. හමාස් සංවිධානයේ තිරිසන් ප්‍රහාරයකින් ආරම්භව ඊශ්‍රායලයේ තිල හමුදා ප්‍රහාරවලින් දිග්ගැස්සෙමින් තිබෙන ගාසා යුද්ධය වනාහි දියුණු යැයි කියන ලෝකයේ අමනුෂ්‍යත්වයේ නූතන ප්‍රකාශනය බවට පත්ව තිබේ.

සිය ගණනකින් ආරම්භ වූ අසල් මිනුෂ ජීවිත පූජාව දිනෙන් දින දහස් ගණනින් ඉහළ යමින් ඇත. බිල්ලන් බළලුන් සේ මිනිසුන් මියයද්දී උත්ප්‍රාසජනක ලෙස ඔවුන් බේරාගැනීමට කිසිදු දෙවි කෙනෙක් පැමිණෙන පාටක්ද නැත. කෙසේ වෙතත් සුපුරුදු පරිදි ගාසාව මුල් කරගෙන ලෝක බල තුලනය කඳවුරුගත වීම ආරම්භ විය. මේ වනවිට හමාස් ප්‍රහාරයට වඩා බරපතළ කරුණ වී තිබෙන්නේ ගාසා තීරයේ ජීවත් වන පලස්තීනුවන්ට එයින් ඉවත්වන්නැයි කියමින් ආරම්භ කළ ඊශ්‍රායල ප්‍රතිප්‍රහාරයයි. ලෝක සිතියමෙන් ගාසා තීරය ඉවත් කිරීම මැයෙන් ජාත්‍යන්තර ජනමාධ්‍ය හඳුන්වන මේ මෙහෙයුම පැහැදිලි ලෙසම ප්‍රශ්න කරමින් සිටින්නේ මනුෂ්‍යත්වයම මිස අනෙකක් නොවේ. මෙසේ පණ බේරාගැනීම සඳහා ගාසා තීරයේ උතුරු ප්‍රදේශයේ සිට දකුණු ප්‍රදේශය වෙත ගමන් කරන ජනතාව අතර ශ්‍රී ලාංකිකයෝ 17 දෙනෙක්ද සිටින බව ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති නිමල් බණ්ඩාර මහතා පවසා තිබිණි. විදේශ අමාත්‍යාංශය කටයුතු කරමින් සිටින්නේ මෙම ශ්‍රී ලාංකිකයන් පිරිස ඊජිප්තුවේ දේශසීමා පිවිසුමෙන් ඊජිප්තුවට ගෙන්වා ගැනීමටය. එමෙන්ම ඊශ්‍රායලයේදී අතුරුදන් වූ ශ්‍රී ලාංකික ජාතික අනුලා ජයතිලක මියගිය බව ඊශ්‍රායල බලධාරීන් තහවුරු කළ බවද තානාපතිවරයා පවසා තිබිණි. මේ ආදී ලෙස ශ්‍රී ලාංකික හදවත්වලටත් බලපෑම් කරමින් සිටින ගාසාහි යුද්ධය හෙටානිද්දා ලෝක තෙල් වෙළෙඳාම මඟින් ඔවුන්ගේ පොකැට්ටුවටද හදින්ම බලපෑම් කරනු ඇත.

මේ අවි අස්සේ වඩාත්ම නිහඬ පුවත බවට පත්ව තිබුණේ මේ සා බිහිසුණු යුද්ධයක් අස්සේ පවා බොර දියේ මාළු බෑමට තරම් බිඳවැටුණු ජාවාරම්කාරයන්ගේ කතාවය. ඒ, රුපියල් ලක්ෂ ගණනින් මුදල් ලබාගෙන ඊශ්‍රායලයට මිනිසුන් පැටවීමේ උත්සාහයයි. එවැනි මිනිස් ජාවාරම්කරුවන් ගැන දැනටමත් වාර්තා වී ඇති බැවින් ඔවුන්ගේ ජාවාරම්වලට හසු නොවන්නැයි මහජනයාට නිවේදන නිකුත් කිරීමටද තානාපති කාර්යාලයට සිදුවන්නේ ඒ අනුවය. ජෝර්දානයේ සිට අනවසරෙන් ඊශ්‍රායලයට ඇතුළු වූ ශ්‍රී ලාංකික කාන්තාවන් දෙදෙනකු ජෝර්දාන දේශසීමා ආරක්ෂක අංශ සෙබළුන්ගේ අත්අඩංගුවට පත්වීම ඊට කදිම නිදසුනකි. තානාපති අංශ පවසා තිබුණේ ඔවුන් පිළිබඳ තොරතුරක් මෙතෙක් වාර්තා වී නොමැති බවය. කෙසේ වෙතත් ඊශ්‍රායලයේ සේවයේ නියුතු ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නැවත ලංකාවට පැමිණීමේ ප්‍රවණතාවක් නැති බවට තානාපතිවරයා කළ ප්‍රකාශයෙන් තහවුරු වූයේ තීරණාත්මක අවස්ථාවක පවා ඊශ්‍රායල භූමියේ ඔවුන්ට ඇති රැකවරණයයි.

රාජ්‍යක් හැටියට ඊශ්‍රායලය සම්බන්ධයෙන් ලංකාව කලක් තිස්සේම දැරුවේ විවේචනාත්මක ස්ථාවරයකි. එය නිවු කරනු ලැබුවේ 1971 සමඟි පෙරමුණ මැතිවරණ පොරොන්දුවක් අනුව ඊශ්‍රායල තානාපති කාර්යාලය මෙරටින් ඉවත් කිරීමෙනි. එහෙත් 2000 දශකයෙන් පසුව ලෝක බල තුලනයේ වෙනස්වීම් එදා ඊශ්‍රායල විරෝධී දේශපාලන ජ්වර මන්ද වී තිබේ. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මෙම අර්බුදය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ස්ථාවරය පිළිබඳව ඉතා පැහැදිලි ප්‍රකාශයක් පසුගිය 9 වැනිදා පැවැති කැබිනට් රැස්වීමට ඉදිරිපත් කර තිබිණි. ශ්‍රී ලංකාව සෑම විටම ඊශ්‍රායලය සහ පලස්තීනය යන ද්විත්ව රාජ්‍ය සංකල්පය සඳහා සහාය දක්වනු ලබන නමුත් සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් ඝාතනය කරමින් ඊශ්‍රායලයට එල්ල වූ හමාස් සංවිධානයේ ප්‍රහාරය සාධාරණීය කළ නොහැකි බව ජනාධිපතිවරයා එහිදී අවධාරණය කර තිබිණි. ඊශ්‍රායලය වේවා හමාස් සංවිධානය වේවා මානව හිමිකම් කඩ කිරීමට හෝ ත්‍රස්තවාදී ක්‍රියා පැතිරවීමට කටයුතු කරන්නේ නම් ශ්‍රී ලංකාව එයට එරෙහි වන බවද ජනාධිපතිවරයා අවධාරණය කළේය. ගාසා හි සිදුවන මිලේච්ඡ යුද්ධය ගැන දෘෂ්ටිවාදී ලෙස විවිධ අදහස් තිබුණත් ලංකාවේ කිසිදු දේශපාලන බලවේගයක් එය අනුමත කරන්නේ නැත. දශක ගණනක් තිස්සේ විටින් විට ඇති පදම් ලේ හලාගත් රාජ්‍යයක අත්දැකීම් ඇති එකදු ලාංකිකයකු හෝ එය කිසිසේත් අනුමත නොකරනු ඇත. උදාවන සෑම නව නිමේෂයකම ගාසාවට සාමයේ අරුණලු වැටේවා! මව්බිමේ පැතුමද එයයි.

# හුරුදින විග්‍රහය

# විධායක ජනාධිපති පිල්ලිය



**1978 පෙබරවාරි 4 වැනිදා ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති ලෙස එජාප නායක ජේ.ආර්. ජයවර්ධන ගාලු මුවදොරදී දිවුරුම් දුන්නේය. 1977 මහ මැතිවරණයෙන් හයෙන් පහක බලයක් හිමිකරගත් එජාපය 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර සම්මත කර ගත්තේය. එය විධායක ජනාධිපති ක්‍රමයක් සහිත ව්‍යවස්ථාවක් වුවේය. අගමැති ධුරය දැරූ ජේ.ආර්. ජයවර්ධන විධායක ජනාධිපති ධුරයේ දිවුරුම් දුන්නේ ඒ අනුවය. 1982 පැවැත්වූ ප්‍රථම ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළ ජේ.ආර්. ජයවර්ධනට ජනවරමින් පත්වූ ජනාධිපතිවරයා ලෙස දෙවැනි වරටත් දිවුරුම් දීමේ අවස්ථාව හිමි වුණේය. ඔහු සිතාගෙන සිටියේ තෙවැනි වරටත් ජනාධිපති ධුරයට පත්වීමටය. එහෙත් 87-89 දේශප්‍රේමී සන්නද්ධ අරගලය නිසා ඊට ඉඩක් ජේ.ආර්. ට ලැබුණේ නැත.**

එජාපයේ ඊළඟ නායකයා ලෙස ජේ.ආර්. තෝරාගෙන සිටි ගාමිණී දිසානායකට ජනාධිපති අපේක්ෂකත්වය ලබා නොදී ආර්. ප්‍රේමදාසට ලබාදීමට සිදුවූයේ දේශප්‍රේමී අරගලයට මුහුණ දීමට අන් මඟක් ඒ අවස්ථාවේ නොතිබුණු නිසාය. ජේ.ආර්. ජයවර්ධනගේ තේරීම හරි ගියේය. විපක්ෂයේ සිරිමාවෝ බණ්ඩාරනායක පරදවා එජාපයේ ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළේය. 1982 ජනාධිපතිවරණයේදී ජේ.ආර්. ජයවර්ධන සියයට 52.91ක ප්‍රතිශතයක් හිමි කරගෙන තිබුණද 1988 ජනාධිපතිවරණයෙන් ආර්. ප්‍රේමදාසට හිමිව තිබුණේ සියයට 50.43ක් පමණි.

ජනාධිපතිවරණ නීතිය අනුව ජනාධිපති පදවියට පත්වීමට නම් ප්‍රකාශිත ඡන්ද ප්‍රමාණයෙන් සියයට 50කට වැඩියෙන් ලබාගත යුතුය. සියයට 50කට වැඩි ප්‍රමාණයක් මුල් වටයේදී ලබාගත නොහැකි වුවහොත් අපේක්ෂකයන් අතුරින් අනුපිළිවෙළින් පළමුවැනි හා දෙවැනි ස්ථානවල සිටින දෙදෙනාගේ හැර සෙසු අපේක්ෂකයන්ගේ ඡන්ද (මනාප) ඉවත් කොට දෙවැනි මනාපය ගණන් කරනු ලබයි. දෙවැනි මනාපය ගණන් කිරීමේදී ඉවත් කරන ලද අපේක්ෂකයන් දෙදෙනාගේ දෙවැනි මනාපද ගණන් කරන්නේය. එහිදී ද අවශ්‍ය සියයට ගණන නොලැබුණහොත් තුන්වැනි මනාපයද ගණන් කරනු ලබයි. මෙහැනදී සඳහන් කළ යුත්තේ අපේක්ෂකයන් දෙදෙනකුට වඩා ඉදිරිපත් වන අවස්ථාවක වඩාත් කැමැති අපේක්ෂකයාට අංක 1 සලකුණු කොට දෙවැනි, තුන්වැනි අනුපිළිවෙළින් අනෙක් අපේක්ෂකයන් දෙදෙනකුට ඡන්දය දිය හැකි බවය. 'මනාපය' පාවිච්චි නොකර එක් අපේක්ෂකයකුට පමණක් ඡන්දය දෙන්නේ නම් අදාළ අපේක්ෂකයාගේ නම හා සලකුණ ඉදිරියේ ඇති කොටුවේ කතිරය සලකුණු කිරීම ප්‍රමාණවත්ය. කෙසේ වුවද මෙතෙක් මෙරට පැවැති ජනාධිපතිවරණවල ප්‍රතිඵල විනිශ්චයේදී මේ සංකීර්ණ ක්‍රමය භාවිත කිරීමට අවශ්‍ය වූයේ නැත. සෑම ජනාධිපතිවරණයකදීම සියයට 50 කඩඉම පසු කිරීමට ජයග්‍රාහී අපේක්ෂකයා සමත් වීම ඊට හේතුවය.

1994 පැවැති ජනාධිපතිවරණයෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජයග්‍රහණය කළේ සියයට 62.28ක ප්‍රතිශතයක් ලබාගෙනය. 1999 ජනාධිපතිවරණයෙන් ඇයට සියයට 51.12ක ඡන්ද ප්‍රතිශතයක් හිමිවුණේය. 2005 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂගේ ජයග්‍රහණය 1988 ආර්. ප්‍රේමදාසගේ ජයග්‍රහණයට සමාන වුණේය. ඔහුට හිමිවුණේ ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 50.29ක් පමණි. එහෙත් මහින්ද රාජපක්ෂ 2010 ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළේ සියයට 57.88ක ප්‍රතිශතයක් ලබාගෙනය. 2015 ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේනට හිමි වූ ප්‍රතිශතය වූයේ සියයට 51.28කි. අවසානයට පැවැති 2019 ජනාධිපතිවරණයෙන් ගෝඨාභය රාජපක්ෂ සියයට 52.25ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගත්තේය. ඒ ජනාධිපතිවරණයේදී දෙවැනි මනාපය වැදගත් වේ යැයි ඇතැම් දේශපාලන විචාරකයන් මත පළ කළද ගෝඨාභය රාජපක්ෂ ඉහළ ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට සමත් වී සිටියේය.

ඊළඟ ජනාධිපතිවරණයට 2024 වසරේ දින යෙදී තිබෙන්නේය. සජබ නායක සජිත් ප්‍රේමදාස හා ජාජබ නායක අනුර කුමාර දිසානායක ජනාධිපතිවරණයට ඉදිරිපත් වන බව දැනටමත් නිවේදනය කර ඇත. මවුබිම ජනතා පක්ෂයේ නායකයා ලෙස මෑතකදී පත්වූ නීතිඥ දිලිත් ජයවීරද ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට සූදානමක් පවතින බව පෙනෙයි. ප්‍රකට ව්‍යාපාරිකයකු වන ධම්මික පෙරේරා ජනාධිපතිවරණයට ඉදිරිපත්වීමට තමන් සූදානම් යැයි මෑතකදී කියා සිටියේය. එජාප නායක, පත් කළ ජනාධිපති රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරණයට ඉදිරිපත්වීමට ලකලෑස්ති වෙමින් සිටී. එහෙත් පසුගිය දවස්වල ආරංචි වූයේ රනිල් වික්‍රමසිංහ ඊළඟ ජනාධිපතිවරණයට පෙර විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නට සැරසෙන බවයි. සති අන්ත පුවත්පතක් සිය ප්‍රධාන සිරසින් කියා තිබුණේ ආර්ථික වැඩපිළිවෙළ සාර්ථක කරගනිමින් ඒ හරහා රනිල් කෙරෙහි ජන ප්‍රසාදය ඉහළ නංවාගෙන ජනාධිපතිවරණයකට යෑමට නොහැකි තත්ත්වයක් උදාවන්නේ නම් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම වෙනුවෙන් ජනමත විචාරණයක් කැඳවීමට පොහොට්ටුවේ බැසිල් පාර්ශ්වය විසින් රනිල්ට යෝජනාවක් කර ඇති බවය. ඒ අනුව මුලින්ම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා කැමැතිද? අකැමැතිද? යන්න විමසා ජනමත විචාරණයක් පවත්වා එය ජයග්‍රහණය කර පසුව පාර්ලිමේන්තු මැතිවරණයක් කැඳවා නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සඳහා කටයුතු කළ යුතු යැයි එහිදී සාකච්ඡා වී ඇත්තේය. නව ව්‍යවස්ථාවට ඇතුළත් කරනු ලබන වගන්තියක් හරහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ තව යම් කාලයකට රාජ්‍ය නායකයා ලෙස කටයුතු කළ යුතු බවද යෝජනා වී තිබේ.

1994 ජනාධිපතිවරණයේදී පොදුජන එක්සත් පෙරමුණේ අපේක්ෂිකා (අගමැතිනී) චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණේ (ජවිපෙ) අපේක්ෂක නිහාල් ගලප්පත්තිට 1995 ජූලි 15ට පෙර විධායක ජනාධිපති ධුරය අහෝසි කරන බවට පොරොන්දුවක් ලබා දුන්නේය. එහෙත් ඇය නියමිත කාලයේදී පොරොන්දුව ඉටු කළේ නැත. 1999 ජනාධිපතිවරණයටද ඉදිරිපත් වූ (ජනාධිපතිනී) චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ඉන් ජය ගැනීමෙන් අනතුරුව 2000 වසරේ විධායක ජනාධිපති ක්‍රමය රහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. ඒ වන විට ඇය දෙවැනි වරට පත්වී ගතවී තිබුණේ මාස නවයක් පමණි. ඒ නිසා පොදුජන එක්සත් පෙරමුණ යෝජනා කර තිබුණේ චන්ද්‍රිකාගේ අවුරුදු හයක ධුර කාලයෙන් පසු ජනාධිපති තනතුර අහෝසි වන ආකාරයෙන් කෙටුම්පත සකස් විය යුතු බවය.

ප්‍රධාන විපක්ෂය වූ එජාපයේ එකඟතාව ලබා ගැනීම සඳහා චන්ද්‍රිකාගේ ධුර කාලයෙන් වසර තුනක් හෝ දෙකක් අවසානයේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු යැයි පොදුජන එක්සත් පෙරමුණ යෝජනා කළද එජාපය සාකච්ඡාවෙන් නැඟිට ගියේය. එජාපයට අවශ්‍ය නම් 2000 දෙසැම්බරයේ සංක්‍රාන්ති සමය අවසන් කිරීමට ජනාධිපතිනිය කැමැත්ත පළ කළද එජාපය ඊට ප්‍රතිචාරයක් දක්වා තිබුණේ නැත. එසේ වූවා නම් ජනාධිපති ධුරයේ රැඳී සිටීමට චන්ද්‍රිකාට ඉතිරිව තිබුණේ තවත් මාස තුනක කාලයක් පමණි.

අවසානයේ ව්‍යවස්ථා කෙටුම්පත 2000 වසරේ අගෝස්තු 3 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර චන්ද්‍රිකා ජනාධිපතිනියගේ දෙවැනි ධුර කාලය අවසානයේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට එහි විධි විධාන සලස්වා තිබුණේය. පසුව කළ යෝජනා අනුව කෙටුම්පත සංශෝධනය වී තිබුණේ නැත. එජාපය පනතට සහාය නොදුන් අතර කෙටුම්පතේ පිටපත් සභා ගර්භයේ පුලුස්සමින් විරෝධය පළ කළේය. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සහාය දීමෙන් එජාපය සූක්ෂ්ම ලෙස මඟහැරියේය. ඊට ප්‍රධාන හේතුව අන් කිසිවක් නොව ඒ තුළින් පොදුජන එක්සත් පෙරමුණට දේශපාලන වාසියක් අත්වේය යන බිය ය. ඒ අවස්ථාවේ එජාපය අවංකව මැදිහත් වී සහාය දුන්නා නම් මේ වනවිට විධායක ජනාධිපති ක්‍රමය රහිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රට තුළ ක්‍රියාත්මක වන්නේය.

'මීයක් කඩන්නේ අත ලෙවකන්න නොවේ' යැයි කියමනක් ඇත්තේය. මේ රටේ දේශපාලන පක්ෂ සෑමවිටම තීරණ ගෙන ඇත්තේ පටු වාසි බලාගෙනය.

1975 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ මහ මැතිවරණය අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක දෙවසරකින් කල් දැමුවේ 'ජනරජ ව්‍යවස්ථාව' උඩඟිමා කරගෙනය. නියමිත පරිදි මැතිවරණය පැවැත්වූවා නම් තමන්ට අවාසි වේ යැයි ඇය සිතුවාය. 1982ට නියමිතව තිබූ මහ මැතිවරණය වෙනුවට ඊනියා ජනමත විචාරණයක් පවත්වා ඡන්දය ඕනද? එපාදැයි ඇසුවේ නියමිත පරිදි මැතිවරණය පැවැත්වූවා නම් තමන් සතු හයෙන් පහක පාර්ලිමේන්තු බලය නැති වන බව ජේ.ආර්. දැන සිටි නිසාය.

1988 ජනාධිපතිවරණය පැවැත්විය යුත්තේ පාර්ලිමේන්තුව විසුරුවා හැර භාරකාර ආණ්ඩුවක් යටතේ යැයි ශ්‍රීලනිප, ජවිපෙ ප්‍රමුඛ 'පක්ෂ අටේ සන්ධානය' කළ යෝජනාවට එජාප ජනාධිපති අපේක්ෂක ආර්. ප්‍රේමදාස එකහෙළා විරුද්ධ වුණේය. මේ නිසා පක්ෂ අටේ සන්ධානය සමඟ පැවැති එකඟතාවට පිටුපෑමට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනට සිදුවුණේය. එවැනි පියවරක් තමන්ට අවාසිදායක වන බව ආර්. ප්‍රේමදාස හොඳින් දැන සිටියේය. ජවිපෙ ඊනියා ඡන්ද වර්ජනයත්, රාජ්‍ය බලයත් 1988 ජනාධිපතිවරණය දිනා ගැනීමට ප්‍රේමදාසට මහෝපකාරී වුවේය.

1994දී නියමිත පරිදි පාර්ලිමේන්තුව විසුරුවා නොහැර ජනාධිපතිවරණය කලින් පවත්වන්නැයි එජාපය ජනාධිපති ඩී.බී. විජේතුංගට බල කළේය. ඒ සිය දේශපාලන වාසිය සලකාය. 2015දී ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරණය කලින් කැඳවූයේ තමන්ට වාසිදායක පසුබිමක් රට තුළ ඇතැයි කල්පනා කළ නිසාය. නැත්නම් තව කල් ගතවුවහොත් තමන්ට අවාසිදායක යැයි සිතූ නිසාය. එවර ඔහුට වැඩේ වැරදීම වෙනම කතාවකි. 2003දී අගමැති රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවේ අමාත්‍යාංශ තුනක් පවරා ගැනීමට ජනාධිපති චන්ද්‍රිකා කටයුතු කළේ සිය වාසිය සලකාය. දෙවනුව ඇය විධායක බලතල යොදාගනිමින් පාර්ලිමේන්තුවට විසුරුවා හැරියේය. 2004 මහ මැතිවරණයෙන් එජාපය පරාජය කර බලය ලබාගැනීමට ශ්‍රීලනිප - ජවිපෙ හවුල සමත් වුණේය. ජවිපෙද සහාය දුන් චන්ද්‍රිකාගේ ඒ දේශපාලන නාඩගමේ අරමුණ වූයේ අහිමි වූ ආණ්ඩු බලය සියතට ගැනීමය.

2022 වසරේ ජනතා විරෝධය හමුවේ අගමැති ධුරයෙන් ඉල්ලා අස්වූ මහින්ද රාජපක්ෂ වෙනුවට රනිල් වික්‍රමසිංහ පත්කිරීමද සිය පක්ෂයේ වාසියට කළ දේශපාලන උප්පරවැට්ටියකි. ජනතා විරෝධයට මුහුණදීමට නොහැකිව රටින් පලාගොස් ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස්වූ ගෝඨාභය රාජපක්ෂ වෙනුවට ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නිල වශයෙන් රනිල් පත්වීමත්, දෙවනුව පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දෙන් අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ තෝරා පත්කර ගැනීමත් දේශපාලන උප්පරවැට්ටියේ දිගුවක් පමණය.

බැලූ බැල්මට අහම්බයක් ලෙස පෙනුණද එය සැලසුම්ගතව කළ දේශපාලන ක්‍රියාදාමයකි. 1987 - 89 සන්නද්ධ අරගලය හමුවේ පන්තියත් පක්ෂයත් බේරාගැනීමට ජේ.ආර්. ජයවර්ධන කළේ ආර්. ප්‍රේමදාසට පක්ෂයේ නායක ධුරයත්, ජනාධිපති අපේක්ෂක ධුරයත් ලබාදීමය. 2022දී රාජපක්ෂලා කළෙත් එවැනිම කටයුත්තකි.


නිරායුධ ජනතා අරගලයෙන් පක්ෂයත් පවුලත් බේරාගැනීමට රනිල් වික්‍රමසිංහට අගමැති - ජනාධිපති පුටු ලබාදුන්නේය. රනිල් වික්‍රමසිංහ තනතුරු භාර ගැනීමේදී පාලක පන්තියේ සුරක්ෂිතභාවය සලකනු ලැබීය. 1989 ජනාධිපති ආර්. ප්‍රේමදාසගේ ආණ්ඩුවේ පාලක පන්තිය රැකීමට කටයුතු කළේ රන්ජන් විජේරත්නය. ඔහු ඉතා දක්ෂ ලෙස සන්නද්ධ අරගලය මැඩපවත්වා සිය පන්තිය සුරක්ෂිත කළේය. රනිල් වික්‍රමසිංහ අද දක්ෂ ලෙස ඒ කටයුත්ත කරමින් සිටින්නේය.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බව පැවැසුවද එය එතරම් පහසුවෙන් හා කඩිනමින් කළ නොහැකිය. මහාචාර්ය ජී.එල්. පීරිස් කියනවා වගේ කෝදුරු තෙල් හැන්දක් බොන්නා වගේ මේ නොකෙරෙන වැඩක්ය. අරමුණ තවදුරටත් මැතිවරණ කල් දැමීම විය හැකිය. විමල් වීරවංශ නම් කියා තිබුණේ පළාත් පාලන හා පළාත් සභා ඡන්ද අතුරුදන් කළා වගේ රනිල් ජනාධිපතිවරණයත් අතුරුදන් කිරීමට ඉඩ ඇති බවය. ඔහුට අනුව නම් රනිල් ඇමෙරිකාවේ ප්‍රමුඛ බලවතුන්ගේ වුවමනා එපාකම් වෙනුවෙන් පෙනී සිටිමින් ඡන්ද නොපවත්වා බලයේ සිටීමට උප්පරවැට්ටි දමන්නෙකි. ජාතික ජන බලවේගය පවසන්නේ ජනාධිපතිවරණය නොපවත්වා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන වැඩපිළිවෙළකට යනවා නම් එහා පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්විය යුතු බවය.

රනිල්ලා හදන්නේ ඇත්තටම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට නම් ඊට විරුද්ධ වීමට අවංකව වැඩ කරන කාටවත් බැරිය. ඊළඟට නියමිත පරිදි ජනාධිපතිවරණය පැවැත්වුවද ඉන් කවුරු දිනයිද යන්න තවමත් නිශ්චිතව කිව නොහැකිය. ජාත්‍යන්තර අලුත්ම සමීක්ෂණයක ප්‍රතිඵල අනුව ජාජබයේ අනුර කුමාරට ඇත්තේ 34%කි. සජබයේ සජිත් ප්‍රේමදාසට 30%කි. 36%ක් සෙසු පක්ෂවලට බෙදී ගොස්ය. තීරණයක් නැති පිරිසක්ද සිටින්නේය. ඉදිරියේ මේ තත්ත්වය වෙනස් විය හැකි වුවද 50% සීමාවට තවමත් කිසිවකු පැමිණ නැත. ඒ නිසා අනුරට හෝ සජිත්ට හෝ රනිල්ට හෝ 'ජය සිතුරුයි' කියා ප්‍රීති වීමට නොහැකිය. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නට යන්නේ රනිල්ලා, රාජපක්ෂලා අපිට බයවෙලා යැයි අනුරලාට හෝ සජිත්ලාට කියන්නට බැරිය.

හොඳ පුද්ගලයෙක් ජනාධිපති පුටුවට පත්වුණොත් හොඳ වේ යැයි වැනි මෝඩ සිතුවිලිවලින් පලක් නැත. ප්‍රගතිශීලීන් නම් කළ යුත්තේ විධායක ජනාධිපති ක්‍රමය මුලිනුපුටා දැමීමට ඇපකැප වීමය. දේශපාලන වාසි අවාසි නොබලා අවංකවම ඊට උරදිය යුතුය. 1994දී හැකි වූයේ නැත. 2000දී ද උත්සාහය අපතේ ගියේය. යළිත් අවස්ථාවක් ලැබී තිබේ. කළ යුත්තේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමය. කවුරු කවුරුත් අවංකව සබුද්ධිකව කටයුතු කිරීමය. තවත් ජනාධිපතිවරණයක් රටට අවශ්‍ය නැත. විධායක ජනාධිපති පිල්ලියෙන් රට ගලවා ගත යුතුව ඇත.

**වීරංග**



# දේශගුණික විපර්යාසවලට එරෙහි සටනට ආර්ථික අර්බුද හරස් වෙලා

## ජනපති කියයි

■ අමිත් මධුරංග ගමගේ

ලෝකයේ බොහෝ රටවල් මුහුණ දෙන ආර්ථික අර්බුදය දේශගුණික විපර්යාසවලට එරෙහි සටනට ප්‍රධාන බාධාවක් වී තිබෙන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ ඊයේ (18දා) පැවැසීය.

ඒ අනුව කර්ම කලාපීය රටවල් කේන්ද්‍ර කර ගනිමින් සුවිශේෂී වැඩපිළිවෙළක් දියත් කළහොත් එමඟින් අනාගත දේශගුණික විපර්යාසයන්ට ශක්තිමත්ව මුහුණදීමට දැවැන්ත රුකුලක් ලැබෙන බව ජනාධිපතිවරයා සඳහන් කළේය.

"එක් තීරයක් - එක් මාවතක්" ජාත්‍යන්තර සමුළුවට සමගාමීව "ස්වාභාවික සුසංයෝගය වෙනුවෙන් හරිත සේද මාවත" මැයෙන් චීන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති ඉහළ පෙළේ සම්මන්ත්‍රණය අමතමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මේ බව කීවේය.

ලෝකයට ආවේණික ශාක ප්‍රභේදයන්ගෙන් 80%ක් හා සමස්ත කොරල් සහ කඩොලානවලින් 50%ක් පමණ පිහිටා ඇත්තේ කර්ම කලාපය තුළ බව පැවැසූ ජනාධිපතිවරයා මෙම තත්ත්වය පසුබිම් කරගෙන දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමේ ප්‍රයත්නයේ ශ්‍රී ලංකාව යෙදී සිටින බවද සඳහන් කළේය.

මෙම විශ්වවිද්‍යාලය මඟින් දේශගුණික වෙනස් වීම් අවම මට්ටමකට පවත්වාගෙන යෑම සඳහා තියුණු පර්යේෂණ, අදාළ නියෝජිත ආයතනයන්හි සිදු විය යුතු වෙනස්කම්, ජාත්‍යන්තර සහයෝගය, ප්‍රජා ක්‍රියාකාරකම් ආදී විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ගත හැකි පියවර පිළිබඳ සොයා බලන බවද හෙතෙම ප්‍රකාශ කළේය.

ලෝකය මුහුණ දෙන ප්‍රධාන භූගෝලීය ත්‍රිත්ව අර්බුදයන් සේ සැලකෙන දේශගුණික විපර්යාස, පරිසර දූෂණය සහ ජෛව විවිධත්ව විනාශය සම්බන්ධව කඩිනම් පියවර ගැනීමේ අරමුණ ඇතිව ඊට අදාළ පර්යේෂණ සිදුකිරීම හා ආරක්ෂණ පියවර ගැනීමට පසුබිම සැකසෙන දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කළ යුතු බවද ජනාධිපතිවරයා පැවැසීය.

දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය ගෝලීය උණුසුම සෙල්සියස් අංශක 1.5ක මට්ටමකට සීමා කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම, පර්යේෂණ සහ විසඳුම් ලබා දෙන බව පැවැසූ හෙතෙම මෙම විශ්වවිද්‍යාලය දේශගුණික විපර්යාසයන්ට එරෙහි සටනේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන බව සඳහන් කළේය.

චීන මහජන සමූහාණ්ඩුවේ උප ජනාධිපති හාන් ෂෙංගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ මෙම සම්මන්ත්‍රණයේදී එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ඇන්ටෝනියෝ ගුටෙරෙස් සහ ඊට සහභාගි වූ අනෙකුත් රටවල රාජ්‍ය නායකයෝද අදහස් දැක්වූහ.

# හිසට සෙවණක් නොතිබුණ පවුල් 4කට අස්ගිරි මහා විහාරයෙන් නිවෙස්

මහනුවර අස්ගිරියේ ස්ථිර නිවාස නොමැතිව සිටි පවුල් හතරක් සඳහා අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහනායක හිමියන්, කාරක සංඝ සභික හිමිවරුන්ගේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ දායකත්වයෙන් මහනුවර පොල්ගොල්ල ජලාශය ආසන්නයේ අරුප්පොළ ප්‍රදේශයේ නිවාස හතරක් ඉදිකර භාරදීම ඊයේ (18දා) සිදු කෙරිණි.





නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නිවාස ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හොඹිලේ ලබා දී තිබෙන අතර නිවාස හතර ඉදිකර ඇත්තේ අස්ගිරි මහනායක අතිපූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඤාණරතන මහනායක හිමි ප්‍රමුඛ කාරක සංඝ සභික හිමිවරුන්ගේ මූල්‍ය දායකත්වයෙනි.

වත්මන් වෙළෙඳපොළ වටිනාකම් අනුව ඉඩමද ඇතුළුව එක් නිවසක වටිනාකම රුපියල් කෝටියක් පමණ වන බවද මුරුද්දෙණියේ ධම්මරතන නාහිමියෝ පැවසූහ.

මහවැලි ගඟ ආසන්නයේ පිහිටි මෙම නිවාස ඉදි කළ භූමියේ එක් පර්චසයක් රුපියල් මිලියනයක පමණ වටිනාකමින් යුක්ත බවත් එක් නිවැසියකුට පර්චස් හයක භූමි ප්‍රමාණයක අයිතිය ලබා දී තිබෙන බවත් අස්ගිරි පාර්ශ්වයේ කාරක සංඝ සභික, බදුලු මුතියංගණ රජමහා විහාරස්ථානයේ භාරකාර පූජ්‍ය මුරුද්දෙණියේ ධම්මරතන නාහිමියෝ පැවසූහ.

අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක වරකාගොඩ ශ්‍රී ඤාණරතන නාහිමියන්ගේ උපදෙස් මත මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ අතර නිවාස ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය ලබා දී ඇත්තේ ශ්‍රී ලංකා යුද හමුදාවේ 11 වන සේනාංකය විසිනි.

නිවාස ජනතා අයිතියට පත් කිරීමේ අවස්ථාවට අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ලේඛකාධිකාරී ආචාර්ය මැදගම ධම්මානන්ද, මහියංගණ රජමහා විහාරාධිපති උරුලෑවත්තේ ධම්මරක්ඛිත, අස්ගිරි පාර්ශ්වයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී නාරම්පනාවේ ආනන්ද, බදුලු මුතියංගණ රජමහා විහාර භාරකාර මුරුද්දෙණියේ ධම්මරතන, ඇටිපොළ මහින්ද යන නාහිමිවරුද සහකාර බෞද්ධ කටයුතු කොමසාරිස් බී.එම්.ඒ. බණ්ඩාර, ගඟවට කෝරලය ප්‍රාදේශීය ලේකම් සම්පත් බණ්ඩාර ජයසිංහ, යුද හමුදා 11 වැනි සේනාංකාධිපති මේජර් ජෙනරාල් මහින්ද රණසිංහ, සහකාර නාගරික කොමසාරිස් ප්‍රභාත් මද්දුමආරච්චි ඇතුළු පිරිසක් සහභාගි වූහ.

■ මහනුවර - කේ.එල්. සුරවීර

## අලි - මිනිස් ගැටුමට විසඳුම් දෙනු

# සිවිල් හා පරිසර සංවිධාන කොටුවේ උද්ඝෝෂණයක



■ සචිනි ශේෂාධි

අලි - මිනිස් ගැටුම් විසඳීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වහාම ක්‍රියාත්මක කරන ලෙසට බල කරමින් සිවිල් සංවිධාන හා පරිසර සංවිධාන නියෝජිතයෝ කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී ඊයේ (18දා) විරෝධතාවක නිරත වූහ.

අවශේෂ කැලෑ වනසන ව්‍යාපෘතිය නතුළා ගනු, හක්කපටස් අපරාධකරුවන්ට දඬුවම් දෙනු, අලිමංකඩ අවහිර නොකරනු ආදී පාඨ ලියූ විරෝධතා පුවරු රැගත් පිරිස අලි ඝාතනවලට එරෙහිව සිය විරෝධය දැක්වූහ.

එහිදී අදහස් දැක්වූ ජීව විද්‍යා දේශක තිස්ස ජනනායක පැවැසුවේ මෙවැන්නකි.

"අලි අපේ රටට ඉන්න ප්‍රධාන ස්වාභාවික සම්පතක්. එය රටට සංචාරකයන් එන්න බලපාන ප්‍රධාන සාධකයක්. මේ වනවිට අලි ගහනය එන්න එන්න අඩු වෙනවා. වසරකට අලි හාරසියක් විතර මියයනවා.

මේ කරන්නේ වන අලි මරලා දාන එක. මෙහෙම අලි මරලා දාද්දී වගකිව යුතු රාජ්‍ය ආයතන ඉතා නිහඬ සහ නිදාගිලි ස්වභාවයක් දක්වනවා. මේ අහිංසක සතුන්ට අපිට වගේම ජීවත්වෙන්න අයිතියක් තියෙනවා. ඒ සතුන්ගේ අයිතිය තහවුරු කරලා අනාගත පරම්පරාවට මේ සත්තු දකින්න විඳින්න අවස්ථාව ඇති කරන්න ඕනේ. එය අපේ පරම්පරාව විසින් කළ යුත්තක්. එහෙම නැති වුණොත් එයාලට පුළුවන් පුරෝපු අලි තමයි බලන්න වෙන්නේ."

# සිවිල් වැසියන් ඝාතනය කරමින් ගාසා තීරයට බෝම්බ දැමීම හෙළා දකිනවා

## ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය

■ බ්‍රිහාන් පතිරත් ජයසූරිය

ළමයින් ඇතුළු පලස්තීන සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් ඝාතනය කරමින් සහ තවත් දහස් ගණනක් තුවාල කිරීමට හේතු වූ ගාසා තීරයට දිගින් දිගටම හමුදා බෝම්බ ප්‍රහාර එල්ල කිරීම ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය දැඩි ලෙස හා අවිවාදයෙන් හෙළා දකින බවත් ගාසා තීරයේ ජනතාවට සාමූහික දඬුවම් දීම යුද අපරාධයක් වන අතර එය වහාම නතර කළ යුතු බවත් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය නිවේදනය කර ඇත.

ඊශ්‍රායලය විසින් පලස්තීන භූමි ප්‍රදේශ සාපරාධී ලෙස අත්පත් කරගෙන සිටීමට එරෙහිව ප්‍රතිරෝධය උත්සන්න කර ඇති මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය පලස්තීන ජනතාවට නොසැලෙන සහයෝගිතාව ප්‍රකාශ කරන බවද එම පක්ෂය නිවේදනය කර ඇත.

බොහෝ අහිංසක සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි කිරීමට හේතු වූ තියුණු හා භයානක උත්සන්න වීම පිළිබඳ සම්පූර්ණ වගකීම, ඊශ්‍රායලයේ ෆැසිස්ට් දක්ෂිණාංශික ආණ්ඩුව දැරිය යුතු බවත් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ මතය වී තිබේ. ඊශ්‍රායල රජයේ අනුග්‍රහය යටතේ බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින ප්‍රදේශවල පදිංචිකරුවන් ඇති කළ හිංසිය සහ අල් - අක්සා පල්ලිය අවට සිදුවීම් හටගත් ඔක්තෝබර් මස මුල් සතිය අවසානයේ ඉතා බරපතළ උත්සන්න වීමට මඟ පෑදූ බවද කොමියුනිස්ට් පක්ෂය සඳහන් කර ඇත.

දෙපාර්ශ්වයේම සිවිල් වැසියන්ගේ මරණ සහ ඔවුන්ට එරෙහි අපරාධ වැළැක්විය යුතු අතර එම ක්‍රියාවන් හෙළා දැකිය යුතුය. කෙසේ වෙතත් ඊශ්‍රායල හමුදාව සහ රාජ්‍ය අනුග්‍රහය ලබන පදිංචිකරුවන් විසින් දිනපතා පලස්තීන ජනතාවට එරෙහිව සිහිසුණු අපරාධ සිදු කරන බව පැහැදිලිව වටහා ගත යුතු බවද විශේෂ නිවේදනයක කොමියුනිස්ට් පක්ෂය සඳහන් කර ඇති අතර එම නිවේදනයේ මෙසේද දැක්වේ.

ගැටුමේ මූලික ප්‍රශ්නය විසඳාගත හැක්කේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාව ක්‍රියාත්මක කිරීමෙන් පමණක් බව ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය අවධාරණය කර සිටී. සාපරාධී ලෙස පලස්තීන භූමි අල්ලාගෙන සිටීම සහ වර්ගවාදය අවසන් කර රාජ්‍ය දෙකක විසඳුමක් ක්‍රියාත්මක කරන ලෙස කොමියුනිස්ට් පක්ෂය ඉල්ලා සිටී. 1967 ජූනි 4 වැනි දින වනවිට පිළිගත් දේශසීමා තුළ නැගෙනහිර ජෙරුසලම් අගනුවර වූ ස්වාධීන රාජ්‍යයක් පිහිටුවීම සඳහා පලස්තීන ජනතාවගේ සාධාරණ අරගලයට ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ පූර්ණ සහ නොසැලෙන සහයෝගිතාව ප්‍රකාශ කරන අතර අදාළ එක්සත් ජාතීන්ගේ යෝජනා මඟින් පිළිගෙන ඇති ආකාරයට සියලු පලස්තීන සරණාගතයන්ට ආපසු පැමිණීමේ අයිතිය තහවුරු විය යුතුය.

බටහිර අධිරාජ්‍යවාදී බලවේග පලස්තීනුවන්ට එරෙහි ඊශ්‍රායල ක්‍රියාමාර්ග සාධාරණීකරණය කිරීමෙන් නොනැවතී, හිතාමතාම තත්ත්වය උග්‍ර කිරීම අපි හෙළා දකිමු.

තත්ත්වය සමනය කර වහාම ගැටුම අවසන් කරන ලෙස ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය දෙපාර්ශ්වයෙන්ම ඉල්ලා සිටී.

ස්වාධීනත්වය සහ ස්වෛරීභාවය සඳහා වන පලස්තීන ජනතාවගේ නීත්‍යනුකූල ඉල්ලීම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය නොසැලී පෙනී සිටිනු ඇත.

## බොහෝ පෙදෙස්වලට තද වැසි

# දිස්ත්‍රික්ක 9කට නායයෑමේ අනතුරු



■ චන්දන ලක්මාල්

දිවයිනට බලපා ඇති අහිතකර වැසි හේතුවෙන් මේ වන විට ආපදාවට ලක්වූ පිරිස වැඩි වෙමින් පවතින බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ පැවැසීය.

ඒ අනුව ඊයේ හවස් වන විට පවුල් 2,420ක පුද්ගලයන් 9,173 ද පූර්ණ නිවාස හානි 28ක්ද, අර්ධ හානි 1,233ක්ද ආපදාවට ලක්වී ඇති බව අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

ගෙවුණු සති 2,3ක් ආසන්න කාලය තුළ දිස්ත්‍රික්ක 18ක පවුල් 31,279ක පුද්ගලයන් එක් ලක්ෂ පනහෙළොස් දහසකට අධික පිරිසක් පීඩාවට පත් වී ඇති බවද හෙතෙම සඳහන් කළේය.

පූර්ණ ආරක්ෂිත ස්ථාන 49ක පවුල් 1,637ක පුද්ගලයන් 6,900ක් රඳවා ඇති බවත් එයින් සුළු පිරිසක් මේ වන විට නිවෙස්වලට ගොස් ඇති බව ප්‍රකාශ කළේය.

මධ්‍යම කඳුකරයේ බදුල්ල දිස්ත්‍රික්කයේ මීරියබැද්ද ප්‍රදේශයේ නාය යෑමේ අවදානම තවමත් පවතින අතර මීරියබැද්ද ප්‍රදේශයේ පවුල් 241 දැනුවත් කර ඇති අතර ඉවත් වී ඇත්තේ සුළු සංඛ්‍යාවක් බවත් ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ, අප විසින් ලබාදෙන අනාවැකි අවවාද පිළිගෙන පෙර සූදානම් සහිතව ඉවත් වීම සඳහා දැනුවත් කිරීමෙන් ඉවත් වී සිටින ලෙස ආපදා කළමනාකර මධ්‍යස්ථානය පැවැසීය.

තවද අතුරැස්ස ඉබුල්ගොඩ හේන කන්ද නාය යෑමේ ලක්ෂණ පහළ වීම හේතුවෙන් මේ වන විට නිවාස අනූක පුද්ගලයන් තුන්දෙනකු එයින් ඉවත් කළ බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පැවැසීය. පවතින වැසි හේතුවෙන් මහනුවර, බදුල්ල, මාතලේ, නුවරඑළිය, රත්නපුර, කෑගල්ල, ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පනවා තිබූ නායයෑමේ අනතුරු ඇඟවීම් ඉදිරි පැය 24 තුළද ක්‍රියාත්මක බව එම මධ්‍යස්ථානය පැවැසීය.

අන්තර් නිවර්තන අභිසාරී (උතුරු අර්ධ ගෝලයේ සහ දකුණු අර්ධ ගෝලයේ සිට පැමිණෙන හුළං අභිසාරී වන කලාපය) දිවයිනේ කාලගුණයට බලපෑම් කරමින් පවතින අතර එහි බලපෑම හේතුවෙන් දැනට පවතින වැසි තත්ත්වය තවදුරටත් පවතින බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පැවැසීය. ඒ අනුව දිවයිනේ බොහෝ ප්‍රදේශවල අද (19දා) විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකිය. බස්නාහිර, සබරගමුව, දකුණ, මධ්‍යම සහ ඌව පළාත්වල ඇතැම් ස්ථානවලට මි.මී. 100ට වැඩි තද වැසි ඇතිවිය හැකිය.

හපුතලේ, දියතලාව, බණ්ඩාරවෙල, වැලිමඩ, ඇල්ල නගරවල දැඩි මීදුම් තත්ත්වයක් ඇති වන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වැඩිදුරටත් සඳහන් කළේය.

## ජාතික යෞවන නාට්‍ය උළෙලට අදත් කෙටි නාට්‍ය 4ක්







ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය එක්ව ජාතික තරුණ සේවා සභාව 42 වැනි වරටත් සංවිධාන කරනු ලබන ජාතික යෞවන නාට්‍ය උළෙල එළැඹෙන 31දා දක්වා සෑම දිනකම සවස 6.00ට මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ පැවැත්වේ.

දේදුනු සංගීතාගේ "බයිලා ගහන දවසක්", චතුරංග පෙරේරාගේ "Let's Marry," කේ. චන්ද්‍රමේගන්ගේ "සූනියම්" (දමිළ), කසුන් මධුශංකගේ "මං ටොමී හිල්ෆිගර්" යන කෙටි නාට්‍ය අද (19දා) වේදිකාගත වේ.

# ගුරුවරුන්ගේ හිඟ වැටුපෙනුත් බදු අය කරනවා

## ජෝසප් ස්ටාලින්

■ අමිත් මධුරංග ගමගේ

උසස්වීම් ලබන ගුරුවරුන් හිඟ වැටුප් ලබාගැනීමේදී අසාධාරණ ලෙස බදු අය කරන බව ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් පැවැසීය.

වසර ගණනක් ප්‍රමාදවූ හිඟ වැටුප් එකවර ලබාගැනීමේදී මෙලෙස බදු අය කරන බව පැවැසූ ප්‍රධාන ලේකම්වරයා බදු අය කළ විට ගුරුවරයාගේ අතට ලැබෙනුයේ ඉතා අඩු මුදලක් බව සඳහන් කළේය.

යම් ගුරුවරයකු රුපියල් ලක්ෂ 09ක හිඟ වැටුප් ලබාගන්නා අවස්ථාවේදී ඉන් රුපියල් ලක්ෂ දෙකක් පමණ බදු ලෙස යළි රජය අය කර ගන්නා බවද හෙතෙම ප්‍රකාශ කළේය.

මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරය අවස්ථා ගණනාවකදී දැනුවත් කර ඇතත් මේ දක්වා ප්‍රතිචාරයක් ලැබී නැති බවද ඔහු කීවේය.

එසේම ගුරුවරුන් ලබාගෙන ඇති ගුරුසෙත ණය යෝජනා ක්‍රමයෙහි ණය හා පොලී වාරික අගය සියයට 9.5 සිට සියයට 12 දක්වා වැඩි කිරීම පිළිබඳව අවස්ථා ගණනාවකදී එම පාර්ශ්ව දැනුවත් කළද මේ දක්වා සහනයක් ලබාදී නොමැති බවද ස්ටාලින් මහතා පැවැසීය.

රාජ්‍ය බැංකුවලින් ලබාගෙන ඇති ණය සඳහා මෙලෙස වැඩි පොලියක් හා වාරිකයක් ගෙවීමට සිදුවීමෙන් ගුරුවරුන් දැඩි අසීරුතාවකට ලක්ව සිටින බවද ප්‍රධාන ලේකම්වරයා සඳහන් කළේය. වැටුප් වැඩිවීමක් නොවුණු පසුබිමක භාණ්ඩ හා සේවා මිල ගණන් අධික ලෙස ඉහළ ගොස් තිබීම ගුරුවරුන්ට දරා ගැනීමට නොහැකි බවත් මේ පිළිබඳව අවධානය යොමුකර ණය පොලී ප්‍රතිශතය අඩු කිරීමට බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු බවත් හෙතෙම ප්‍රකාශ කළේය.

## බීඩි කොළ මුදාගන්න

# රේගුවට බලපෑම් කළේ නීති වෘත්තිකයෙක්

■ අමිල අබේරත්න

රජයට අයවිය යුතු කෝටි ගණනක බද්දක් වෙනුවට ලක්ෂ තුනක් ගෙවා කොප්පමල්ලි ලෙස ආනයනය කළ බීඩි කොළ කන්ටේනර් දෙක මුදාහැරීම සඳහා බලපෑම් කර පැත්තේ අධිකරණ ක්ෂේත්‍රයේ සේවයේ සිටි ඉහළ නිලධාරියකු බව මුදල් අමාත්‍යාංශ අභ්‍යන්තර ආරංචි මාර්ගයන් සඳහන් කළේය.

රජයට අයවිය යුතු කෝටි ගණනක බද්දක් වෙනුවට ලක්ෂ තුනක් ගෙවා කොප්පමල්ලි ආනයනය කරන මුවාවෙන් බීඩි කොළ කන්ටේනර් බහාලුම් දෙකක් ඉන්දියාවේ සිට මෙරටට ආනයනය කර තිබූ අතර එහිදී අදාළ බීඩි කොළ කන්ටේනර් බහාලුම් දෙක ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගෙන තිබිණි.

අදාළ බීඩි කන්ටේනර් බහාලුම් මුදාහරින ලෙසට අදාළ ඉහළ නිලධාරියාගෙන් බලපෑම් එල්ල වී තිබූ අතර ඒ අනුව ඒ පිළිබඳ විමර්ශන අල්ලස් කොමිසම වෙත පැවරීමට වැඩ බලන මුදල් අමාත්‍ය රංජිත් සියඹලාපිටිය පියවර ගෙන ඇත.

කොප්පමල්ලි ලෙස හඟවමින් ආනයනය කරන ලද අදාළ බහාලුම් දෙක තුළ බීඩි කොළ කිලෝග්‍රෑම් 11,60ක් තිබී ඇති අතර ඒවා කොප්මල්ලි ලෙස ආනයනය කිරීම හේතුවෙන් රජයට බදු ලෙස අයවී තිබුණේ ලක්ෂ 3ක මුදලක් වන අතර රජයට අයවීමට තිබූ බදු මුදල රුපියල් කෝටි 07ක් වේ.

ඒ අනුව එමඟින් රජයට අහිමි වී තිබූ බදු මුදල රුපියල් හය කෝටි අනූහත් ලක්ෂයකි.

# ජනමතය

සංස්කාරක, ජනමතය
'මව්බිම'
අංක 101, රොසමිඩ් පෙදෙස
කොළඹ 7

රටට සමාජයට වැඩදායක හා ආර්ථික සමාජීය දේශපාලනමය කාලීන අදහස් මෙන්ම ඔබේ ගමේ නගරයේ අඩුපාඩු ගැන රටට කියන්නට "ජනමතය" පිටුවෙන් සතියකට වරක් ඔබ වෙනුවෙන් ඉඩ කඩ වෙන් කෙරේ.

සංස්කරණය : ගාමිණී වසන්ත කුමාර

## අස්වැසුමෙන් ඇස් වැසීම

'අස්වැසුම්' යන වචනය මේ දිනවල උද්දි සවස ඇසෙන්නා වූ වචනයක් බවට පත්වී ඇත. අස්වැසුම යනු ආර්ථික අවදානමක් සහිත පුද්ගලයන් වෙනුවෙන් සමාජ ආරක්ෂාව සැපයීමේ වැඩපිළිවෙළකි.

මෙම ආධාරය ලැබීමට සුදුසු යැයි සිතෙන ඕනෑම අයකුට නිර්ණායකයන්ට යටත්ව මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ හැකියාව ලබාදී තිබිණි. ඒ අනුව ඉදිරිපත්වූ අයදුම්පත් මිලියන 3.7කටත් අධික ප්‍රමාණයකින් තෝරාගත් මිලියන 3.3ක් මේ සඳහා සුදුසුකම් ලැබූවන් ලෙස තෝරාපත් කරගෙන තිබිණි.

මෙවැනි අපහසු කාලයක කුමන හෝ ආධාර මුදලක් ලැබේ නම් එය ඕනෑම අයකුට මහත් අස්වැසුමක් වේ. නමුත් අස්වැසුම සැබැවින්ම අස්වැසුමක්ද යන විග ගැටලුවකි. මන්දයත් මෙතාක් කාලයක් ජනසවිය, සමෘද්ධිය ආදී මෙකී නොකී ආධාර ලබාදෙමින් දිළිඳු බව තුරන් කිරීමට රජය ගත් උත්සාහයන් නමුවේ වුවද මෙරටෙහි යැපීම් මට්ටම වැඩිවූවා මිසක අඩුවීමක් සිදුනොවී තිබීමය. එය මනාව පැහැදිලි වන්නේ සමෘද්ධි ප්‍රතිලාභ ලබන්නන්ගේ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රමාණයක් මේ ඔස්සේ ප්‍රතිලාභ ලැබීම සඳහා සුදුසුකම් ලබා තිබීමය. කිසියම් රටක යැපීම් මට්ටම ඉහළ යෑම යනු දරිද්‍රතාව ඉහළ ගොස් ඇති බව හඟවනා කාරණාවකි.

පවත්නා ආර්ථික තත්ත්වය හමුවේ පාසල් හෝ විශ්වවිද්‍යාල මට්ටමෙන් අධ්‍යාපනය හදාරන සිසුන් සිටින්නා වූ පවුල්, ආබාධිතභාවය ආදී හේතු මත මෙම සහනාධාරය ලබාදීම සාධාරණය. නමුත් රජයෙන් යැපීම වෙනුවෙන් බලා සිටින පුද්ගලයන්, ඔවුනගේ දරිද්‍රතාවයෙන් යුක්තව සමාජය ඉදිරියෙහි පෙනී සිටින්නාවූ පුද්ගලයන්ට පවා මෙම සහනාධාරය ලබාදීම කෙතරම් යුක්ති සහගතද? මෙලෙස සුදුසුකම් පවා මෙම සහනාධාරය ලබන්නාවූ, පසුබිමක ඉන් සිදුවන්නේ ජනතාවගේ මනසෙහි යැපීම් මානසිකත්වය තවදුරටත් ස්ථාවර වීමය. එවිට දරිද්‍රතාවයෙන් පෙළෙන්නාවූ ප්‍රතිශතය ඉහළ යන අතර සංවර්ධනයට බාධාවකි.

අප මහසයෙහි තිබෙන කාලයක පටන් ලංකාව සංවර්ධනය වෙමින් පවත්නා රටකි. දියුණු සංවර්ධිත තත්ත්වයට පත්වීම පෙනෙනා තෙක් මානයක නොමැත. එයට ප්‍රධානම හේතුව ජනතාව කුමන ගැටලුවකට මුහුණදී සිටියා වුවද රට විසඳුම් සෙවිය යුත්තේ රජය යන මානසිකත්වය ශ්‍රී ලාංකික ජනතාවගේ සිතෙහි පැළපදියම් වීමය. මේ සඳහා පාලකයන්ද වගකිව යුතුය. එනම් තම පාලන බලය තව තවත් සහවුරු කර ගැනීමේ අරමුණින් ජනතාව කුමක් හෝ ඉල්ලා සැගෙනු පමණින් එය කෙසේ හෝ ලබාදෙමින් තාවකාලික විසඳුම් සෙවීමට බලයට පැමිණ පාලකයන් කටයුතු කිරීමයි. මන්දයත් ජනතාව යැපීම් මානසිකත්වයෙන් මිදී ඔවුන්ට කියා ස්වාධීන බවක් ගොඩනංවාගෙන, ස්වයංපෝෂිත ආර්ථික රටාවට හුරුවීම පාලකයන්ට නැවත බලයට ඒමට බාධාවකි. ඒ මුදල් නෝට්ටු විසි කරමින් දුප්පත් ඡන්දදායකයන්ගේ ගැටලුවලට විසඳුම් සොයන මුවාවෙන් ඔවුන්ව රවටා ඡන්දය ලබා ගැනීමට ඔවුනට නොහැකිවීම නිසාවෙනි.

සැබැවින්ම රට ගැන සිතන පාලකයන් කළ යුත්තේ මෙලෙස තාවකාලික විසඳුම් සෙවීම නොව මෙයින් සිදුවන්නේ වසරින් වසර ආධාර ලබාදීමට සිදුවන ප්‍රමාණය වැඩිවීමයි. එයද ලාංකේය ආර්ථික වර්ධනයට බාධාවක් එල්ල කරන කාරණාවකි. කළ යුත්තේ ව්‍යවසායකයන් බිහි කරමින් ඒ අලුත රැකියා අවස්ථා උත්පාදනය කරවමින් ජනතාවට තමාම උපයාගෙන තම ආර්ථිකය ස්ථිර ගැනීමේ ස්ථාවර මාර්ගයක් පෙන්වා දීමයි. ඒ සඳහා කාලාන්තරයක් තිස්සේ මුල් බැසගත් යැපීම් මානසිකත්වය බැහැර කළ යුතුය. මෙය පහසු කාරණාවක් නොවේ. එබැවින් පාසල් වියෙහි සිටම ව්‍යවසායකත්ව දැනුම සිසුන්ට ලබාදෙමින් වෘත්තීයමුඛ විෂය ධාරාවන් ඔස්සේ අධ්‍යාපනය ලබාදීමෙන් ඉන්පසු උසස් අධ්‍යාපනය හෝ රැකියා අවස්ථා සඳහා යොමුකරවීමක් ඉතාම වැදගත්ය.

මෙහිදී ජනතාව වශයෙන් අප වෙතද භාරදූර කාර්යයක් පැවරී ඇත. එනම්, රජයෙහි ආධාර හෝ මිල පෙන්වීම් වෙනුවෙන් බලා නොසිට ස්වයං ව්‍යවසායකත්ව චින්තනයක් සහ නවීන ආකල්ප ගොඩනංවා ගනිමින්, තම ආර්ථිකය ස්වයංපෝෂිත කරගැනීමය.

එබැවින් තාවකාලික අස්වැසුමක් ලබාදීම වෙනුවට ස්ථාවර විසඳුමක් ලබාදීමක් සෑම විටම රජය මත යැපීමට බලා නොසිටීමක් පාලකයන් සහ ජනතාව සතු වගකීමකි.

■ එච්.කේ.එස්. නවෝදා
හඳුරාගම
ජන සන්නිවේදන අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය.

## දුර ගමන් යන බස්වලට වැලිගම බස් නැවතුම්පොළේ ඉඩක් නැතිද?

මාතර - කොළඹ ප්‍රධාන බස් මාර්ගයේ පිහිටි වැලිගම බස් නැවතුම්පොළේ සිට ගාල්ල, කරාපිටිය, අම්බලන්ගොඩ කොළඹ, මහරගම, මීගමුව, කටුනායක, මහනුවර, මාතලේ අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ යාපනය දක්වා යන බස් රථ ධාවනය වේ.

දිනපතා ගාල්ලට සහ දුර ගමන් යෑම සඳහා වැලිගම බස් නැවතුමට පැමිණෙන ජනතාව දස දහස් ගණනකි. එහෙත් වැලිගම බස් රථ නැවතුම්පොළේ එම මගීන්ගේ පහසුව සඳහා ස්ථානයක් වෙන්කර නොමැති නිසා ගාල්ලට සහ දුර ගමන් යන මගීන්ට සිටීමට සිදුවී ඇත්තේ බස් රථ නැවතුම්පොළ අසල වෙළෙඳසල් අයිනට වී සිට බස් රථවලට ගොඩවීමටය.

මෙම තත්ත්වය නිසා මගීන්ට අව්වෙන් සහ වැස්සෙන් සිදුවන පීඩාව ඉමහත්ය. ස්ථාවර බස් නැවතුම්පොළක් තිබියදී වසර දාහතරකට වැඩි කාලයක සිට පවතින මෙම අඩුපාඩුව පිළිබඳව කිසිදු වගකිවයුතු බලධාරියකුගේ අවධානයට යොමු වී නොමැත.

එම නිසා දැන්වත් වගකිවයුතු බලධාරීන්ගේ අවධානය යොමුවී නොපමාව වැලිගම බස් රථ නැවතුම්පොළෙහි ගාල්ලට සහ දුර ගමන් යන මගීන්ට වැලිගම බස් රථ නැවතුම්පොළෙහි ඉඩක් වෙන් කර දිය යුතු බව සඳහන් කරමි.

■ වසන්තද සිල්වා - වැලිගම

ජන මතය
කවි කොළේ

### බොඳ විය සිහින අග හිඟ පිරි රටක

බුදු බණ පද ඇසුණි මහ මන්දිර ඇසුද
පොදු දන මුවින් කියැවුණෙ "සොපමණ සොඳද"
අසරණ වුණේ රටම ඒ අසාරෙම නොවෙද
යහගුණ ගැන කියනු හිමි කාගෙද වරද

ලද හිමි නිවුණි රටටම ලොකු සෙතක් වුණ
ලද නිදහස කොතෙක් වෙද මහ මෙරක් වුණ
මඳ කලකින්ම යලි රට හිනි ගොඩක් වුණ
බොඳ විය සිහින අග හිඟ පිරි රටක් වුණ

අහවර කළ නමුදු හිස් වසරක සාපේ
මහ කොල්ලයක් නොවැ සිදු වුණෙ හෙළ දීපේ
දහ දුක විඳිනු නොහැකිව මිනිජන හෝපේ
ඉහ වහා ගිය බවකි ඇවිළුණි හිනි දූපේ

මහතයි එදා ඩී.එස්. අගමැති සාලේ
ඔහු සරි කළා රටටම සිංහල සාලේ
නැත අද පොහොර ජලයද ඇවැසිම වේලේ
කොහ පාළුවට රට කොයිබද ගොවි රාලේ



■ පානදුරේ
එස්.ඒ. එස්. පෙරේරා

### අප මෙතනමයි හැමදා අපෙ වරදින්ම

හිනා වෙවී ඇවිදුන් දෙසහා විහිලු
උරණ නොවී අප අහගෙන ඉන්නවලු
උදම් වෙවී විසඳුම් ගෙන දොඩනවලු
පදම් වෙවී අප විඳවා ගන්නවලු

එන්නෙම කියාගෙන රට බේරා ගන්න
යන්නෙම ආව අප පොඩිබැඳගෙන යන්න
දන්නෙම නැතිව සිදුවී ඇත රැවටෙන්න
වෙන්නෙම බැන්ද බෙරයේ පළු අරගන්න

එන්නට පෙරළි දකිමින් රට අඩුපාඩු
ගන්නට පසු බලය වෙමිනා පිංසේඩු
දෙන්නට ආව දේ නොම දී කර පාඩු
යන්නට යන එවුන් බොරුවට කතා සෝඩු

අප මෙතනමයි හැමදා අපෙ වරදින්ම
ඉහළම් ඇතෙයි බලයට හිමි බොරුවෙන්ම
රට වැනසුමයි වුණේ එක විලසින්ම
කලයුතු යමක් කළ යුතුමයි අප දැන්ම

■ කලාභූෂණ ගාමිණී ලිවේරා
මුන්දලම

## කුසගින්න රජයේ සේවකයන්ට පමණක් නොවේ

රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුප්, අතිකාල, නිවාඩු දීමනා, නිවාඩු වැටුප් ආදී කී නොකී වරප්‍රසාද රාශියකි. ඒ වගේම තමා රජයකින්ම රු. 10,000ක් 5,000ක් වැනි විශාල මුදල්වලින් ඔවුන්ගේ වැටුප් කලින් කලට වැඩි කරයි. එසේ වරප්‍රසාද බොහෝමයක් ලබාදී තිබියදීත් තව තවත් වැඩි වැඩි ඉල්ලා මහ උද්ඝෝෂණද කරයි. අත්තටම උග්‍ර මුදල් අර්බුදයකට රට පත්වී සිටින මෙවැනි අවස්ථාවක රජයේ සේවකයන්ට පමණක් වැටුප් වැඩි කිරීම කොයි තරම් අසාධාරණද යන්න සිතා බැලිය යුතුය. මන්ද රජයේ සේවකයන්ට දැනෙන බඩගින්නම අහිත් දුක් විඳින ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ඇත.

රජයේ සේවකයන් ඉන්නේ ලක්ෂ 15ක් තරම් ප්‍රමාණයකි. නමුත් අද අප රටේ දිනකට එක් ආහාර වේලකින් පමණක් ජීවිතය ගැට ගසාගන්න හරි හමන් ආදායමක් නැතිව ජීවත්වන පෞද්ගලික අංශයේ ලක්ෂ 35ක් පමණ සංඛ්‍යාවක් සිටිති. ඒ අයට රජයේ සේවකයන්ට මෙන් විශ්‍රාම වැටුප් හෝ ඉහත කිසි කිසිම වරප්‍රසාදයක් හෝ දීමනාවක් ලැබෙන්නේ නැත. විදුලිය, යානවාහන, ගේදොර, මහා මන්දිර, මිල මුදල් උතුරන්නට තියෙන සුපිරි හැම සම්පතක්ම භුක්ති විඳින අප්‍රමාණවත් රජයේ සේවකයන් අතන්තවත් සිටිති. මෙහි සිදුවන මහත්ම අපරාධය හා අසාධාරණය වන්නේ රජයේ සේවකයන්ට වැටුප් වැඩි කරන වාරයක් වාරයක් පාසා ඒ රජයේ සේවකයන්ටද එම වැටුප් ලැබීමයි.

ඉහත කීවූ ලක්ෂ 35කට වඩා මහා ජනතාවක් අප්‍රමාණවත් දරිද්‍රතාවයෙන් පීඩනයෙන් ජීවත් වෙද්දී සෑම පුරවැසියකුට සමාන අයිතිවාසිකම් අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ලබාදී තියෙද්දීත් රජයේ සේවකයන්ට පමණක්ම මේ රටේ මිල මුදල් වරප්‍රසාද ලබාදීම කොයිතරම් නම් අසාධාරණයක්ද? අපරාධයක්ද?

දැන් සිදුවී තිබෙන්නේ විශ්‍රාම රජයේ සේවකයන්ට පමණක් සියලුම වරප්‍රසාද දීමනා ලැබෙන අතරේ ලක්ෂ 35කට වඩා ජනතාවක් සැමදා දුක් පීඩා විඳීමයි. රටේ සමස්ත ආදායමෙන් 1/3කට වඩා වැය වන්නේ රජයේ සේවකයන්ට වැටුප් ගෙවීමට බව මුදල් අමාත්‍යවරයාම කියයි. මෙය රටකට දරාගන්න බැරි තරම් මහා බරක් බව ඉතාම පැහැදිලිය. එනිසා අප රජයෙන් ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටින්නේ රජයේ සේවකයන්ට පමණක් වැටුප් වැඩි නොකර සමස්ත මහජනතාවටම සමාන ප්‍රතිලාභ ලැබෙන්නට සලස්වන ක්‍රමවේදයට යා යුතු බවයි.

■ අජිත් ජෝතිය නරසිංහ,
මත්තේගොඩ.

## රුක් දෙවියෝ හා යකඩ යක්කු

මුට්ටියක් බේරා ගැනීමට එළුවාගේ බෙල්ල කපූ මහදැනමුත්තලා සිටියේත්, කඩු තීන්ද දුන් කැකිල්ලේ රජවරුන් සිටියේත් අතීතයේ බව අප ජනප්‍රවාදවල කියවා තිබුණත් එවැන්නෝ අදත් සිටින බව පෙනෙන්නේ දැන් දැන් රටේ තොටේ සිදුවන දේවල් ගැන බැලූ විටය.

ලංගම බස් රියක් මතට පාර අයිනේ තිබූ ගහක් කඩා වැටී පස් දෙනකුගේ දිවි තොරවූ පුවතක් ඇසූ අප ඉමහත් කනගාටුවට පත් වූවෙමු. කෙසේ හෝ මේ සිද්ධියෙන් වරදකරු වූයේ පාර අයිනේ තිබී කඩා වැටුණු ගසය.

එදා සිට පාර අයිනේ සියලුම ගස්වලට උදා වූයේ නරක දසාවකි.

නවීන යන්ත්‍රසූත්‍ර යොදා ගනිමින් පාර දෙපස ද්‍රව්‍යත්න වශයෙන් බිම හෙළන අපූරු පසුබිම දිනවල කොළඹ නගරයේ දැකගත හැකිය. වසර සිය ගණනක් පුරා සෙවණ සැලසූ වනස්පතියෝ ඔහේ පිහිත් නැති නවීන යන්ත්‍රසූත්‍රවලින් මහපොළොව සිප ගන්නේ පරිසරයම හඬවමිනි. මෙසේ බිම හෙළන ගස් අතර දිරාපත් වූ ඒවාද අනතුරුදායක ඒවාද තිබිය හැකිය. එහෙත් එක මිනුමකට සැපලියට සේරම මිනුමෙන් මරන්නා සේ සියලුම ගස් කැපීම අනුමත කළ හැකිද? දිරා ගිය ගස් ගැන දැනගත හැකි ටිත්සෑන් යන්ත්‍රයක්ද කොළඹ නගර සභාවේ ඇති බව අසා ඇත්තෙමු. එම යන්ත්‍රයෙන් ගන්නා ප්‍රයෝජනය ගැනද මෙවැනි අවස්ථාවල නොඅසාම බැරිය.

අප කාලයකට කරන්නේ ගස් සිටුවන එකය. ජාතික රුක් රෝපණ දිනය, රුක් රෝපණ සතිය ආදිය යෝජනා කර ගනිමින් පාර දෙපස ගස් සිටුවන්නේ පාරේ එන අයටත් සේන්නය. ඒවායේදී කැමරාවට මුහුණ දෙන්නේ මැති ඇමැතිවරුන්ය.

ඒවායින් සැලසෙන සෙවණ ගැන සිතා එසේ සිටුවන්නට ඇත.

කෝන්ක ගස්, කොස් ගස් මඟ දෙපස සිටවූ මාර්ගද ඇත. වාසනාවට මෙන් ඒවා ඇත්තේ කොළඹ නගරයේ නොවේ. කොළඹ නගරයේ මහ පාරවල් දෙපස එසේ කොස් ගස්, කෝන්ක ගස් තිබුණා නම් මේ දවස්වල ලද අවසරයෙන් ප්‍රයෝජන ගැනීමට දේශපාලනඥයන්, දාව ජාවාරමුන් එන්නේ පෝලිමේය. එහෙම වුණා නම් අද නගර සභාවෙන් කරන ගස් කපා ඉවත් කිරීම සඳහා ඉදිරිපත් වන්නේ දාව ජාවාරමේ රහ දන්නා අයයි.

කතා කළ හැකි දේ එමටය. ගස්වලට අරක් ගත් වෘක්ෂ දේවතාවුන් මෙන්ම යකුන්ද සිටි බවට අපේ පැරැණි ජනප්‍රවාදවල කියැවේ. ගස් ගැන, යක්කු ගැන කතා කරන විට මේ දවස්වල තවත් අපූරු යකෙක් ගැන කියැවේ. ඒ යකඩ යකාය.

එදා අතුරු කතා වතුර බිබී කොළඹ දුවපු යකඩ යකා ගැනය.

අද යකඩ යකාගෙන්ද ජනතාවට ඇත්තේ කිව නොහැකි තරමේ කරදරයකි.

ඇප තුලක් ආතුරයාට බැඳීමෙන් තාවකාලිකව හෝ යකුන් මෙල්ල කළ හැකි වුවද දුම්රිය අපනවශ සේවාවක් බවට ජනාධිපතිවරයා නමින් ගැසට් නිවේදනයක් නිකුත් කළ විට පවා යකඩ යකා මෙල්ල කරගත නොහැකි තත්ත්වයක් දැන් උදා වී තිබේ.

සිගරට්වුවක, බුලත්විටක ප්‍රශ්නයකදී පවා දුම්රිය වර්ජනය කරන සේවකයන් සිටින රටක සෝචිචිය ගැන කතා කිරීමට පවා දෙයක් නැත. මේ වසරේ ගත වූ මාස කිහිපය තුළ දුම්රිය වර්ජන කීයක් සිදු වූවාද කියා ආපසු හැරී බැලීමට දැන් කාලය එළඹ තිබේ. එසේම දුම්රිය වර්ජන නිසා අහිංසක ජීවිත අකාලයේ නැති වූ අවස්ථාද කිහිපයකි.

දුම්රියේ යෑමට මාසික සීසන් ගැනීමෙන් හෝ දෙනිකව ප්‍රවේශපත් ලබාගත් අයට අද සිදුව ඇත්තේ යකඩ යකාට දිවි පුජා කිරීමටය. හැමදාම සිදුවන මේ වර්ජන සෙල්ලම දැන්වත් නතර කළ යුතුය.

උදේ රැකියාවට දුම්රියෙන් අගනුවරට එසේත් නැත්නම් වෙනත් නගරවලට එන මගින් උදේට ගෙනැත් දමා හවසට ස්ට්‍රයික් කර ජනතාව අතරමං කිරීම අද යකඩ යක්කුන්ගේ ජාතික ක්‍රීඩාවක් වී තිබේ. දුම්රිය සේවකයන්ට ප්‍රශ්න තිබිය හැකිය. එසේම අතින් අයටද ප්‍රශ්න නැත්තේ නොවේ. යම් කොටසකට ඇති ප්‍රශ්නයකට එසේම ප්‍රශ්න ඇති තවත් ජන කොටසක් ප්‍රාණ ඇපයට තබා ගැනීමට ඉඩ දිය යුතු නැත.

ගස් ගැන ඇරඹූ කතාවේ අග කොටසකට කෝච්චිය සම්බන්ධ වූයේ කෙසේ දැයි කෙනෙක් අසන්නත් බැරි නැත. එයට හේතුවක් ඇත. බස් පාරේ මෙන්ම දුම්රිය මාර්ගවල දෙපසද ඕනෑ තරම් ගස් ඇත. හැබැයි ඒවා කොළඹ පාරවල් අයිනේ ඇති මාර ගස් වාගේ නොවේ.

අන ප්‍රදේශවල රේල් පාරවල් අයිනේ ඇත්තේ කෝන්ක, මිල්ල, කැදුන්, කොස් වැනි වටිනා ගස්ය. දුම්රියේ ආරක්ෂාවට මේ ගස් කපා දමන්නැයි ඉල්ලමින් මීළඟ දුම්රිය සේවක

වැඩවර්ජනය එන්නද බැරි නැත්තේ ඒ හා සමාන බොහෝ වර්ජන දුම්රියේ සිදුව ඇති නිසාය.

මේ වටිනා ගස් කපන්නැයි දුම්රිය සේවකයන් උසිගන්වන පිරිසක්ද ඒ පිටුපස සිටිය හැකි බව සිතාගත හැක්කේ වටිනා දැවවලට ඇලුම් කරන ගස් මරුවන් තම තැනම සිටින බැවිනි.

■ හරිශ්චන්ද්‍ර කහවල

## විදුහල්පති සේවයේ උසස්වීම් කොටසකට අසාධාරණයක්

2009 වසරේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ iii පන්තියට පත්වීම් ලබා සියලු සුදුසුකම් සම්පූර්ණ කර සිටින විදුහල්පතිවරු පිරිසක් 2021 නොවැම්බර් සිට පළමු ශ්‍රේණියට උසස් නොකිරීම නිසා දැඩි අසාධාරණයකට ලක්ව සිටිති.

අදාළ උසස්වීම ලබා ගැනීමට සම්පූර්ණ කළ යුතු සේවා කාලය, කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම, උපාධි සම්පූර්ණ කිරීම යන සියල්ලද අදාළ දිනට මෙම නිලධාරීන් සම්පූර්ණ කර ඇත.

අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්තුමා බලය පවරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව, උසස්වීම දිනට පෙර සමත් වීමද එක් සුදුසුකමකි. එහෙත් අදාළ කාලය තුළ අධ්‍යාපන අමාත්‍යංශය එම පාඨමාලාව නොපැවැත්වූ අතර 2022 ජනවාරි වන විට ජාතික අධ්‍යාපන ආයතනය විසින් එම පාඨමාලාව පවත්වන ලදී.

නියමිත වේලාවට එම පාඨමාලාව නොපැවැත්වීම අධ්‍යාපන අමාත්‍යංශයෙන් සිදුවූ වරදක් නිසා එය සැලකිල්ලට ගෙන මෙම වසරේ මුල් කාලසීමාව තුළ අධ්‍යාපන අමාත්‍යංශය යැවූ ලිපි ගොනු මත එම පාඨමාලාව හැදෑරූ කොටසකට 2021 නොවැම්බර් සිට ශ්‍රී.ල.වි.සේ. පළමු පන්තිය සඳහා උසස්වීම් ලිපි නිකුත් කර ඇත.

එහෙත් මෙම වසරේ මැද රාජ්‍ය සේවා කොමිසමට පත්වූ නව සාමාජිකයන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සිදුවූ ඉහත වරද සැලකිල්ලට නොගෙන එම පාඨමාලාවම හැදෑරූ පිරිසකට උසස්වීම් ලිපි නිකුත් නොකර අධ්‍යාපන අමාත්‍යංශය සමඟ ලිපි හුවමාරුවක මේ වන විට යෙදී සිටී.

සියලු බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ මේ සමාන සුදුසුකම් සහිත කොටසකට ශ්‍රී.ල.වි.සේ. පළමු ශ්‍රේණියට උසස්වීම් ලිපි නිකුත් කළ ආකාරයටම ඉතිරි පිරිස සඳහා උසස්වීම් ලිපි නිකුත් කරන ලෙසයි.

■ අසාධාරණයට පත් විදුහල්පති පිරිසක්

## කලා ලොවේ නොමැකෙන සලකුණ



වර්ෂ 1958 රාගම පොඩිවීකුඹුරේ උපන් ජැක්සන් ඇන්තනී නම් ඔහු ශ්‍රී ලාංකේය කලා කෙත පෝෂණය කළ මෙතෙක අපමණය. වේදිකාව, සිනමාව, ටෙලිනාට්‍ය එක ලෙස අතික්‍රමණය කරමින් යුගයක් නිර්මාණය කළ ඔහු සැබැවින්ම විශිෂ්ට රංගවේදියෙකි. මහා දැනුම් සම්භාරයකින් යුතුව ශ්‍රී ලාංකේය සංස්කෘතිය මනාවින් අගය කළ අතර උපතින් කතෝලිකයකු වුවත් බෞද්ධ දර්ශනයද මහත් සේ අගය කළේය. ඉතා අපූරුවට වචනයෙන් හරඹ පාමින් අප සිත් එතුමාගේ ග්‍රහණයට සෑම විටම නතු කර ගනිමින්, තම හඬින් අප දෙසවන් සනසවමින් ප්‍රතිභාපූර්ණ රංගනයෙන් අප නෙත් අභිනන්දනයට පත් කරමින්, ප්‍රේක්ෂක හදවතේ ගැඹුරටම පැන් ස්පර්ශ කොට ලාංකේය කලාවේ දයාබර අප්පච්චි මේ මහා ප්‍රතාපවත් රංගධරයාය.

විරෙක නළුවෙක්, ගායකයෙක් නර්තනවේදියෙක් අධ්‍යක්ෂවරයෙක් නිෂ්පාදකවරයෙක්, පුරකයෙක්, සාහිත්‍යඥයෙක්, දේශකයෙක්, ගවේෂකයෙක්, නිවේදකයෙක්, ඉතිහාසඥයක් විනිසුරුවරයෙක්, ගුරුවරයෙක්, රචකයෙක්, වාර්තාකරුවෙක් තවත් විරෙක සහෝදරයෙක්, පියෙක්, මිතුරෙක් වෙමින් දශක තුනකට ආසන්න කාලයකදී පුරාවෘත්තයක් ලෙස ලාංකේය කලා ක්ෂේත්‍රයේ නොමැකෙන සලකුණක් මේ විශිෂ්ටයා සනිටුහන් කළේය. මලුසත්කමින් පරිපූර්ණ මෙතුමා රටට කළ සේවය කිසිදා මිල කළ නොහැකිය.

කලාවට හිතැති දක්ෂ දරුවන් තිදෙනකුත්, හේලබාලයන් රාශියකුත් ලාංකේය කලා කෙතට දායාද කළ ඔහු අපට ඉතිරි කර ගිය මතකය කිසිදා අමතක නොවේවි. මේ විශිෂ්ටයා කලාවට දායාද කළ නිර්මාණ කිසි දිනෙක වියැකී නොයාවි. ඒ රුව, ඒ හඬ අප සිත් අමරණීය වෙමින් සැමදා රැව් පිළි රැව් දේවි. එතුමා මියැදෙන්නට පෙර අපට කියා දුන් පණිවුඩය සදා නොවෙනස් වේවි. බුන්ඩො, සේදිරිස් වැද්දා කුස රජු, ශ්‍රී වික්‍රම, රාජසිංහ රජු, නාසිවාදීන්ගේ හිට්ලර් වැනි චරිත සිංහලේ මහා වංශ කතාව, ගඟ දිගේ ගමන වැනි වාර්තාමය වැඩසටහන්, දෑස පියා ගත් කල වැනි ගීත ඔහුගේ විශිෂ්ට රංගන හැකියාව, මධුර වූ ගායන හැකියාව, පුස්තකාලයක් බඳු වූ දැනුම් සම්භාරය මැනවින් විදහා දක්වන බවට සැක නැත. ලියන්නට බොහෝ දේ ඇතත් "කිසිවක් සිදුව අවසන් වන්නේ නැත. සියල්ල සිදුවෙමින් පවතී" යන එතුමන්ගේම ප්‍රකාශයෙන් ලියා අවසන් කරමි. ඔහුගේ දැනුම් සම්භාරයට, රංගන පෞරුෂයට සම කළ හැකි කිසිවෙක් යලි මේ බිම තුළ පහළ නොවනු ඇත. රසික සිත් තුළ සදා අමරණීය පහාපුරු කුසුම් පැණියාණනි, ඔබට මෝක්ෂ සම්පත්තිය ලැබේවා! දෙවි පුතු මඟුල් බොදුනෙදී දිනකදී අප හමුවේවා!

■ හසිනි දමින්දිකා රුද්‍රිගු
හුංගමුගොඩ
කැලණිය

## කල් යන රජයේ විභාග

ඇත්තටම ඉගෙනීම යනු කටු අත්තක්ද? අධ්‍යාපනය තුළින් යම් සාර්ථකත්වයකට පත්වන තෙක් එය යම් අසීරු වූ කාර්යයකි. නමුත් එම දුෂ්කර කාර්යය ජයගත් විට එයින් ලැබෙන ප්‍රතිලාභය නම් අති විශාලය. අපේ ජීවිත ජයගන්නට තිබෙන විවිධ කඩඉම් අතර ප්‍රධාන කඩඉමක් ලෙස උසස් පෙළ විභාගය හැඳින්වීමට පුළුවන. පුරා වසර 13ක් පාසල් අධ්‍යාපනය හදාරා ඉන් උපරිම ඵල නෙළා ගත හැකි අවධිය උසස් පෙළ විභාගය ජය ගැනීම වේ.

වසංගතයට ලංකාව ගොදුරු වූ අවධියේ සිට උසස් පෙළ විභාගය නිසි කලට පවත්වන්නට හැකියාවක් නොලැබිණි. උසස් පෙළ පමණක් නොව අනෙකුත් ජාතික තලයේ විභාගයන්ද එසේමය.

Covid අවධිය තුළ යම් දුෂ්කර කාලසීමාවක් ගත කර විසෙත් විත යථා තත්ත්වයට පැමිණෙන අවධියක වුවද තවමත් අනාගත පරම්පරාව එක තැන පල් කරමින් ඔවුන්ගේ මවුපියන්ගේ මුදල් ප්‍රරා කන උපකාරක පන්ති ගුරු හවතුන් හා යන ඩීල් එකක් ලෙස උසස් පෙළ විභාගය කල් යන්නේද? නැතහොත් පසුගිය වසරේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හරහා දෙවැනි වර විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත සිසු සිසුවියන් වෙනුවෙන් ලබාදෙන ඉඩ ප්‍රස්තාවක්ද? සැබෑ වශයෙන්ම සිදුවන්නේ කුමක්ද යන්න කාටත් ප්‍රහේලිකාවකි.

දිනෙන් දින කම්මු පත්කර රැස් වී විවිධ තීරණ ලබාදෙමින් සිසුන්ගේ මානසික මට්ටමද වෙනස් කිරීම හරහා සාක්ෂරතා මට්ටම පහළ බැස්සවීමට කටයුතු කරන්නේද යන්න

පැහැනගින තවත් පැනයකි. එහෙයින් විභාග කල් නොදමා නිසි කලට පැවැත්වීමට බලධාරීන් කටයුතු කළ යුතු වේ.

■ වින්දනා රත්නායක
කැලණිය විශ්වවිද්‍යාලය

## අනුනට අතපාන යැපුම් මානසිකත්වයෙන් මිදෙමු

රටේ ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් අස්වැසුමක් ලබා දෙන්නට රජය කටයුතු කළත් ජනතාවට ඉස්පාසුවක් නැති තත්ත්වයක් උද්ගතව ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාල අවට අරගල භූමි නිර්මාණය විය. හේතු වී ඇත්තේ අස්වැසුම අහිමි වූ පිරිස ඒකරාශී වීමය. අපේ රටේ ඉතිහාසයේ බත බුලතින් ස්වයං පෝෂිත වූ රටකි. විදේශීය ආක්‍රමණිකයන් අපේ රටේ කුඹුරු සරුසාර ගොව බිම්, ගේ දොර ඉඩකඩම්, වෙහෙර විහාර ගිනිබත් කර විනාශ කළද නිවටුන් ලෙස අසරණභාවයට පත් වූයේ නැත. එහෙත් දෙවැනි ලෝක යුද සමයේ ජනතාවගේ යැපීම සඳහා ආහාර සලාකයක් ලබා දීමට පාලකයෝ කටයුතු කළහ. නිදහසින් පසුව පැමිණි දේශීය පාලකයන්ද තම තමන්ගේ දේශපාලන පැවැත්ම උදෙසා සලාක ක්‍රමය පවත්වා ගන්නට විය. හාල් සේරු දෙකක සලාකය නොමිලේ ලබාදීම, කූපන් පොත් ක්‍රමය 1978 සිට අහෝසි වූ අතර ඒ වෙනුවට ජනසවිය යෝජනා ක්‍රමය ආරම්භ විය. පසුකාලීනව බලයට පත් වූ රජයන් මෙම ක්‍රමය සමෘද්ධිය ලෙස නම් කළ අතර රටේ දුප්පත්කම අඩු කර සංවර්ධනයට ජනතාව සක්‍රියව දායක කර ගැනීමට අපේක්ෂාව වුවත් පසුකාලීනව මෙම ක්‍රමවේදය දේශපාලන බලය තහවුරු කර ගැනීමේ ව්‍යාපෘතියක් වීම නිසා අරමුණ කරා ළඟා කරගැනීම ගැටලු සහගත විය. සිදු වූයේ වසරින් වසර දුප්පත් ජනතාව වැඩි වීමය. දේශපාලන හිතවත්කම් මත නුසුදුසු පුද්ගලයන් පවා රජයේ සහනාධාරය ලබාගන්නා තත්ත්වයට පත් වීමය. ප්‍රදේශයේ දේශපාලන බලධාරීන්ගේ පෙළපාළිය, උද්ඝෝෂණය, ජන රැළිය සඳහා ජනතාව ඒකරාශී කරගැනීමේ ඇමක් බවටද සමෘද්ධිය පත්විය. පසුව ස්වශක්තියෙන් නැඟී සිටිය හැකි පිරිස් පවා වංචා සහගත ලෙස මෙම සහනය ලබාගනිමින් සිටිති. සැබෑ ලෙසම ආධාර ලැබිය යුතු පිරිස රටේ සිටිති. එසේ නොමැතිව දෙපයින් නැඟී සිටීමට හැකියාවක් ඇති කිසියම් ඵලදායී කාර්යයන්හි නිරත විය හැකි පිරිස්වලට සහනාධාරය ලබා දීමෙන් රට තව තවත් බංකොලොත්භාවයට පත් වීම මිස ඉදිරියට යෑමක් සිදු නොවේ. පසුගිය මෙන්ම වර්තමාන රාජ්‍ය තන්ත්‍රයේ ඉහළම නිලධාරියාගේ සිට පහළටත් දේශපාලකයාගේ පහළම බලධාරියාගේ සිට ඉහළටත් බොහෝදෙනෙක් රටේ දේපළ මංකොල්ලකමින් දූෂණය වංචාව සාමාන්‍යකරණය වී ඇති යුගයකි.

ලෝකය පුරා ණය වී රටට ගෙනෙන ඖෂධ ඇතැම් කොටසක් තත්ත්වයෙන් බාල වන අතර රෝගීන්ගේ ජීවිත පවා අහිමි කර ඇත. රටට ගෙනෙන ඇතැම් දේ නිසි ලෙස බෙදා හැරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් සිදුවන හානිය විශාලය. රට ඉතා අසීරු තත්ත්වයක වැටී සිටියත් සිදුවන දූෂණ වංචාවල අඩුවක් නොමැත. ප්‍රසිද්ධියේ සොරකම් කළත් දඬුවම් නොලැබෙන තත්ත්වයක් නිර්මාණය වී ඇත. වංචා දූෂණ සිදු කරන දේශපාලකයාගේ සිට නිලධාරියා දක්වා දේපළ රජයට පවරා ගැනීමෙන් හෝ සිදුවන පාඩුව අය කරගන්නා ක්‍රමවේදයක් සකස් විය යුතුය. සමෘද්ධිය හෝ නොමිලේ ලැබෙන යමක් නැති වූ විට එකම විසඳුම උද්ඝෝෂණ හෝ පෙළපාළි යෑම වෙනුවට අනුන්ට අතපා නිවටයන් ලෙස ජීවත් වීමේ කලාව අවසන් කළ යුතුය.

■ සෝමදාස කන්දෙගේ - මාතර

## අධි අවදානම් මීරියබැද්දේ

# බලෙන් ඉන්න පවුල් ඉවත් කරන්න උසාවියෙන් නියෝග

■ හල්දුම්මුල්ල - සමන් පාලිත නානායක්කාර

කොස්ලන්ද, මීරියබැද්ද පැරැණි නාය ගිය ස්ථානය දෙපස අධි අවදානම් කලාපයේ සිටින පවුල් 16ක් ඉවත් කර අද (19දා) ඒ පිළිබඳ උසාවියට ප්‍රගතිය වාර්තා කරන ලෙස බණ්ඩාරවෙල වැඩබලන මහෙස්ත්‍රාත් සෙනත් ද සිල්වා ඊයේ (18දා) නියම කළේය.

ඉවත්ව යන ලෙස දැනුම් දුන්නද මෙතෙක් එම දැනුම්දීම නොසලකා එහිම අවදානම් ලෙස රැඳී සිටින මීරියබැද්ද පවුල් දහසයක් සඳහා මෙම නියෝගය නිකුත් කෙරිණි.

කොස්ලන්ද පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩී. දිනේෂ් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් අනුව පොලිස් කොස්තාපල් පුවනේෂ්වරන්(69335) උසාවියට ඊයේ කරුණු වාර්තා කළේය.

කරුණු සලකා බැලූ වැඩබලන මහෙස්ත්‍රාත් සෙනත් ද සිල්වා මහතා අනාරක්ෂිතව පදිංචිව සිටින පවුල් 16 වහාම ඉවත් කර අද දින උසාවියට කරුණු වාර්තා කරන ලෙසද නියෝග කෙරුණි.

මේ පිළිබඳව ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් අදාළ ජනතාව දැනුවත් කරන බවත් එසේත් නොයන්නේ නම් අත්අඩංගුවට ගෙන උසාවියට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් කොස්ලන්ද පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දිනේෂ් වික්‍රමසිංහ පැවැසීය.

ලංකාවේ විශාලතම නාය යෑමක් ලෙස වාර්තා වූ කොස්ලන්ද මීරියබැද්ද නැවත සක්‍රීය වීම නිසා අධි අවදානම් කලාපයේ සිටින ජනතාව ඉවත් කර ගැනීම සඳහා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් ජේ.ඒ.ජේ. ප්‍රියංගනී පොලිසියේ සහාය අවශ්‍ය බව දැන්වීමෙන් පසුව මෙම පියවර ගෙන තිබිණි.

## ගංවතුර අඩුවීමත් සමඟ

# මාතරට තවත් අවදානමක්

### පරිස්සම් වන්නැයි සෞඛ්‍ය අංශ කියයි

මාතර දිස්ත්‍රික්කයට බලපා තිබූ ගංවතුර බැස යෑමත් සමඟ මී උණ, ඩෙංගු සහ පාචනය වැනි රෝග බෝවීමේ බරපතළ අවදානම් සහගත තත්ත්වයක් පවතින බැවින් ඒ පිළිබඳව වඩා සැලකිලිමත් වන ලෙස සෞඛ්‍ය අංශ ජනතාවගෙන් ඉල්ලා සිටිති.

මේ සම්බන්ධයෙන් මාධ්‍ය වෙත අදහස් දැක්වූ කඹුරුපිටිය ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී චමින්ද ලියනගේ,

"පසුගිය දිනවල මාතර දිස්ත්‍රික්කයේ පැවැති ලොකුම ප්‍රශ්නය තමයි ගංවතුර තර්ජනය. සමහර ප්‍රදේශවල තවමත් ගංවතුර බැස ගිහින් නැහැ. මේ තත්ත්වයත් සමඟ සෞඛ්‍ය ප්‍රශ්න බොහොමයක් ඇති විය හැකියි. මාතර දිස්ත්‍රික්කයේ මී උණ ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා. පසුගිය අවුරුද්දේ මී උණ නිසා 24 දෙනකුට වැඩි පිරිසක් මියගිහින් තියෙනවා."

"සාමාන්‍යයෙන් මී උණ වැලඳෙන්නේ කුඹුරු වැඩ කරන විටදී කියලයි අපි හිතන්නේ. නමුත් ගංවතුර තත්ත්වයත් සමඟ මී උණ වැලඳීමේ අවදානමක් තියෙනවා. ඒ නිසා සති දෙකකට වරක් මී උණ පෙති දෙක බැගින් ගැනීමෙන් මී උණ වළක්වා ගත හැකියි.

තැන් තැන්වල ටින්, ප්ලාස්ටික් භාජන එකතුවී තිබීම නිසා ගංවතුර බැස යෑමත් සමඟ ඩෙංගු රෝගයද ව්‍යාප්ත විය හැකියි. ඒ වගේම මේ දිනවල පාචනය පැතිරීමේ ඉඩකඩ තියෙනවා. පාචනය පැතිරෙන්නේ වතුරෙන් සහ කෑම මඟිනුයි. ගංවතුරට යට වූ ළිං ඉස ක්ලෝරීන් යොදා පිරිසුදු කර ගැනීමෙන් පසුවයි පාවිච්චි කළ යුතු වන්නේ. ඒ වගේම මේ දිනවල පිසූ ආහාර ගැනීමත් තමන්ගේ පවිත්‍රතාව ගැන සැලකිලිමත් වීමත් මඟින් මෙම රෝගවලට ගොදුරු වීමේ අවදානම අඩු කරගත හැකියි. දින දෙකකට වැඩි කාලයක් උණ පවතී නම් වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතුයි."

■ කඹුරුපිටිය - ප්‍රීති ජයවර්ධන, දෙයියන්දර - ටී. විජේසේකර

# ආසියාවේ ජව සම්පන්න ආර්ථිකයක් ඇති රට ඉන්දියාවයි



සමුද්‍රීය ක්‍රියාකාරකම්, වෙළෙඳාම, සංස්කෘතිය සහ උරුමයන් සඳහා ආසියාවේ ප්‍රධානතම ජව සම්පන්න ආර්ථිකයක් පවතින රාජ්‍ය ඉන්දියාව යැයි වරාය හා නාවික හා ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා පෙරේදා ඉන්දියාවේ මුම්බායි නුවර පැවැති "ගෝලීය සමුද්‍ර සමුළුව" අමතමින් පැවැසීය. මෙම සමුළුව ඔක්තෝබර් 17 දින සිට 19 දින දක්වා පැවැත්වෙන අතර, ඉන්දීය වරාය, නාවික සහ ජල මාර්ග අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබීය.

සමුද්‍රීය අංශයේ ප්‍රධාන අංශ කෙරෙහි මෙහිදී අවධානය යොමු කර ඇති අතර, සැසිවාර, ප්‍රදර්ශන, අනාගත වරායන් පිළිබඳව සහ සමුද්‍රීය තාක්ෂණයන් යන කරුණු පිළිබඳව විදේශීය නියෝජිතයන් දැනුවත් කිරීමට වැඩසටහන් රාශියක් සකසා ඇත. සමුළුවේ සමාරම්භක අවස්ථාවට ඉන්දියාවේ අගමැති ශ්‍රී නරේන්ද්‍ර මෝදි තුමා තාක්ෂණය ඔස්සේ සහභාගි විය.

ආර්මේනියාව, බංග්ලාදේශය, බෙලරුස්, කොමරෝස්, ඉරානය, ඉතාලිය, ටැන්සානියාව, උස්බෙකිස්තානය, ස්පාඤ්ඤය සහ නේපාලය ඇතුළු රටවල් 11ක් සහ ඉන්දියාවේ ප්‍රාන්ත නියෝජනය කරමින් රාජ්‍ය අමාත්‍යවරුන්, ආණ්ඩුකාරවරු ද මෙම සමුළුවට සහභාගි වී සිටියහ.

සමුළුවේදී අදහස් පළ කරමින් අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා, මෙම ගෝලීය සමුද්‍ර සමුළුව සංවිධානය කිරීම පිළිබඳව ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ සහ ශ්‍රී ලංකා රජයේ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පැවැසීය.

සමුද්‍රීය ක්‍රියාකාරකම්, වෙළෙඳාම, සංස්කෘතිය සහ උරුමයන් සඳහා ආසියාවේ ප්‍රධාන ජව සම්පන්න ආර්ථිකයක් පවතින රාජ්‍යය ඉන්දියාව බව පැවසූ අමාත්‍යවරයා, සමුද්‍රීය ආරක්ෂාව, සාමය සහ තිරසාරභාවය පිළිබඳව මැදිහත් වන ලෙස ඉල්ලා සිටියේය.

සමුද්‍රීය වැඩපිළිවෙළුහිදී කුඩා ගොඩබිම් සහිත රටවල ජාතීන්ට සමාන අවස්ථාවන් ලබාදීමට සහ සහතික කිරීමට නීති, රීති, රෙගුලාසි සහ නවෝත්පාදනයන් ඇති කිරීම පිළිබඳව අමාත්‍යවරයා සමුළුවේ අවධානය යොමු කරන ලදී.

සමුද්‍රීය සම්බන්ධතා, සමුද්‍රීය කර්මාන්ත සහ අනෙකුත් සමුද්‍රීය කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම කාලීන අවශ්‍යතාවක් ලෙස පැවැති අවස්ථාවක මෙම "ගෝලීය සමුද්‍රීය සමුළුව" පැවැත්වීම පිළිබඳව අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා ඉන්දීය රජය පැසසුමට ලක් කළේය.

# ගැමි දරුවන්ගෙන් සුගත්ට උපහාර



සුගත් වටගෙදර සාහිත්‍ය කලා හා සංස්කෘතික ක්ෂේත්‍රයේ ඇගයීමට ලක්විය යුතු එසේත් අගහරු දමා තිබූ හෝ මහාහැරුණු කලා කරුවෙකි.

මෙම තත්ත්වය වටහාගෙන ඒ පිළිබඳව සලකා බලා ඇති "ගම්දොරින්" සංවිධානය තමන්ගේ සාමාජිකයකු වන සුගත් වටගෙදරට උපහාර පිදීමට ගත් තීරණය වෙසෙසින්ම අගය කළ යුතු වේ.

එළැඹෙන ඔක්තෝබර් 21 සෙනසුරාදා පස්වරු 6.00ට කොළඹ හැව්ලොක් වටුමේ ලුම්බිණි රඟහලේදී සුගත් වටගෙදර උපහාර ලබන්නේ මහාචාර්ය මංගල සේනානායකගේ "සින්දුකාර සව් හළුව" වේදිකා මන්ත්‍රණයක් වීමට සමගාමීවය.

සුගත් උපදින්නේ දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ හාලුගල ග්‍රාම සේවා වසමේ වටගෙදර ගමැති සුන්දර ගම්මානයේය. පාලටුව ගුණරතන මහා විද්‍යාලයෙන් ද්විතීය පාසල් අධ්‍යාපනය නිමකොට 1972 වසරේදී පේරාදෙණිය සරසවියට පිවිසි සුගත් සමාජ අධ්‍යයන කවය, සිංහල සංගමය, නාට්‍ය සංගමය, ගාන්ධර්ව සභාව යන පේරාදෙණි සරසවියේ සමිති සමාගම්වල නිලතල දරමින් සරසවි ශිෂ්‍ය අවධියේදීම සංස්කෘතික කලා ප්‍රබෝධය වෙනුවෙන් විවිධ වූ අර්ථපූර්ණ ක්‍රියාකාරකම්වල නිරත වූ ශිෂ්‍යයෙකි. පේරාදෙණිය සරසවියේදී සුගත් නාට්‍ය දෙකක් නිෂ්පාදනය කළේය. 1973දී "සාන්තාරයේ දිය උල්පත්" සහ 1975 "හෙට උපදින රංගැටියා" නම් වූ එම නාට්‍ය ද්වය සරසවියේ අන්තර් නාට්‍ය තරග සඳහා පේරාදෙණිය සරසවියේ ප්‍රධාන නාට්‍ය ශාලාවේ වේදිකාගත විය.

විශ්වවිද්‍යාලයෙන් පිට වූ සුගත්ට ලේක් හවුසියේ සරසවිය පුවත්පතේ රැකියාව ලැබුණු අතර ඔහුට ලියන්නට ලැබුණේ නාට්‍යකරුවන් ගැනය. මේ තරුණ නාට්‍යකරුවන් සමඟ මහා සබඳතාවක් ගොඩනගා ගැනීමට ඔහුට හැකි විය. නාට්‍ය මෙන්ම සිනමාව පිළිබඳව ලිපි රචනා කරමින් සුගත් මේ වන විට සුගත් වටගෙදර නාමය ප්‍රචලිත කරගෙන තිබිණි. කඩිනම් මහවැලි ව්‍යාපාරය යටතේ ඉඩම්, ඉඩම් සංවර්ධන සහ මහවැලි සංවර්ධන අමාත්‍යාංශය මඟින් පළ කළ "ඉසුර" සඟරාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සංස්කාරක තනතුර හෙබවීමට සුගත් ඒ දක්වා ලබා තිබූ පරිචය මහෝපකාරී විය. මා දන්නා තරමින් සුගත් යූ.එන්.පී.කාරයෙක් නොවේ. ඉසුරු වැඩ කරද්දී සුගත්ට බොහෝ කලා ශිල්පීන්ගේ ඇසුර ලැබිණි.

ඒ අතරතුර චන්ද්‍රිකා බණ්ඩාරනායක යුගයේ සුගත්ට ජාතික රූපවාහිනියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැඩසටහන්) තනතුර සඳහා ආරාධනාවක් ලැබිණි. ඒ අනුව ජාතික රූපවාහිනිය සුගත් ගේ දක්ෂතා විදහාපාන්නට සුදුසු තෝතැන්නක් විය.

සුගත්ගේ තිර නාට්‍ය රචනා බොහෝමයක් ජාතික රූපවාහිනියේ ප්‍රබල නාට්‍ය ලෙස එළි දැක්විණි. එම කාලයේ සිංහල අලුත් අවුරුදු නාට්‍ය මෙන්ම නිදහස් දින උදෙසාද සුගත් නාට්‍ය තිර රචනා ලිව්වේය. නිදහසේ ස්වර්ණ ජයන්තියට 1998 වසරේදී "නිදහස සොයා" යනුවෙන් සුගත් ප්‍රබල තිර කතා කිහිපයක් රචනා කළ අතර ඒවා නිමැවුම් ලෙස එළි දැක්විණි. සුගත් චිත්‍රපට තිර කතා දෙකක්ද රචනා කළේය. සාරංගා සහ දූ දරුවෝ එම චිත්‍රපට තිර කතාය. සුගත් ග්‍රන්ථ කිහිපයක්ද රචනා කළ අයෙකි. සන්නිවේදනයේ ආචාර ධාර්මික පදනම, නාට්‍යනුංකාරය (නාට්‍ය කලාව ගැන සෙනෙදිරියවාදී දැක්වියකින් රචිත ග්‍රන්ථයකි.) සිංහල නාට්‍ය කලාවේ පරන්සඩන්, නාට්‍ය කලාවේ නූතන ප්‍රවණතා සහ නාට්‍ය ක්ෂේත්‍රය සහ වෙනත් විෂයන්ට අදාළව තවත් පොත් කිහිපයක්ද, සුගත් රචනා කර තිබේ. මාතර වංශය ග්‍රන්ථය ඔහුගේ සංස්කරණයකි. මහවැලි වංශය ග්‍රන්ථය සංස්කරණය කළ සංස්කාරක මණ්ඩලයේද සුගත් සාමාජිකයෙකි.

සුගත් සරසවිය චිත්‍රපට උළෙල හා කතෝලික සිනමා පර්ෂදයේ ඕ.සී.අයි.සී. චිත්‍රපට විනිශ්චය මණ්ඩලවල කටයුතු කර ඇති අතර 1979 වර්ෂයේ සිට ජාතික තරුණ සේවා සභාවේ යොවුන් නාට්‍ය තරගාවලි කිහිපයකම විනිශ්චය මණ්ඩල සභිකයෙක් ලෙස ද කටයුතු කර ඇත. සාහිත්‍ය අනු මණ්ඩලයේ සාමාජිකයෙක් මෙන්ම සාහිත්‍ය විනිශ්චය මණ්ඩල සාමාජිකයෙක් ලෙස ද කටයුතු කර ඇති සුගත් දක්ෂ ඡායාරූප ශිල්පියෙක් මෙන්ම දක්ෂ චිත්‍ර ශිල්පියකුද වේ. විශ්වවිද්‍යාලයේදී මෙන්ම ලේක් හවුසියේදී ඔහුගේ එම කුසලතාවලට ඉඩකඩ ලැබී තිබිණි. එසේම පේරාදෙණිය සරසවියෙන් පිට වූ පසුව ස්වකීය අනාගත මංපෙත් හා නිම්වළලු පුළුල් කර ගනු වස් විවිධ විෂයන් යටතේ පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා කිහිපයක් හිමි කරගන්නා ලද අතර තත් විෂයන් පිළිබඳව විශ්වවිද්‍යාල බාහිර කථිකාචාර්යවරයෙකි. එපට අමතරව සන්නිවේදනය පිළිබඳව ප්‍රායෝගිකයකු මෙන්ම දේශකයකු ලෙසද සුගත් තවමත් කටයුතු කරයි. අප කථානායකයාණෝ අනුදත් ස්වකීය විෂය ක්ෂේත්‍රය තුළ පෑ දක්ෂම නුවණ.

එසෙයින් විවිධ වූ කුසලතාවලින් සපිරි මෙවැන්නෙක් සඳහා උපහාර පිදීම අගය කළ යුත්තේ නොවේද?

මෙම 21 (සෙනසුරාදා) සන්ධ්‍යාවේ කොළඹ ලුම්බිණි රංග කලාවේදී මහාචාර්ය මංගල සේනානායකගේ "සින්දුකාර සව් හළුව" වේදිකාගත වන මධ්‍යයේ ගම් දරුවෝ වෙතින් උපහාර ලබන සුගත් වටගෙදරට දීර්ඝායු මෙන්ම ජය සතුට පතමි.

■ සරත් වික්‍රමරත්න

# සාමදාන විනිසුරු පදවි ලබයි



කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තලවතුගොඩ, පන්නිපිටිය පාරේ අංක 360/ඩී හි පදිංචි එස්.ඩී. සරත්චන්ද්‍ර මහත්මිය මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාරවරියක් වශයෙන් කඩුවෙල දිසා අධිකරණයේදී ඔක්තෝබර් 16 දින දිවුරුම් දෙන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිධාරිනියක් වන ඇය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සේවයෙහි නිරත වේ.

# මොනරාගල රෝහලේ මෘත ශරීරාගාරයේ ශීතකරණ මාස තුනක් තිස්සේ වැඩ නෑ

■ බිබිල - නඳුන් ගුණතිලක

මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ මෘත ශරීරාගාරයේ අධි ශීතකරණ මාස තුනක් තිස්සේ අක්‍රියව පවතින නිසා පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්විය යුතු මෘතදේහයන් සියඹලාණ්ඩුව මූලික රෝහලේ මෘත ශරීරාගාරයට රැගෙන යෑමට දොතින්ට සිදුවී තිබේ.

මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ සිට සියඹලාණ්ඩුව මූලික රෝහලට කිලෝමීටර් හතළිස්පහක් පමණ ඇති නිසා මෘතදේහයන් රැගෙන යෑමට විශාල මුදලක් වැය කිරීමට සිදුව ඇතැයි දොතිනු කියති.

මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ මෘත ශරීරාගාරයේ අධි ශීතකරණ දෙකක් තිබෙන අතර මෘත දේහ හයක් ඒවායේ තැන්පත් කිරීමට හැකියාව තිබේ.

එහෙත් මීට මාස තුනකට පමණ ඉහතදී අධි ශීතකරණ දෙකම අක්‍රියව පවතී.

මේ පිළිබඳව මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ වෛද්‍ය අධිකාරී ධනපාල රත්නායකගෙන් කළ විමසීමකදී පැවැසුවේ, "අක්‍රියව පවතින අධි ශීතකරණ දෙකම අලුත්වැඩියා කරන ලෙස වගකිව යුත්තන්ට දැනුම් දී ඇති බවයි.

### කෝප් - කෝපා වලින් හෙළි වන වංචා දූෂණවලට

# වගකිවයුත්තන්ට දඬුවම් දිය යුතුයි



### ආචාර්ය සසිඳු මහානාම

දේශපාලන නායක පසු තුළින් ජනතා අභිලාෂ යට කරලීම අද බේදවාචකයක් බවට පත්වෙලා. රටට අද අවශ්‍ය වන්නේ සියලු දෙනාට පිළිගත හැකි ජාතික නායකත්වයක් පමණකැයි ආචාර්ය සසිඳු මහානාම පවසයි. බත්තරමුල්ලේ පැවැති මාධ්‍ය හමුවකදී අදහස් දැක්වූ හෙතෙම මේ අදහස් පළ කළේය.

එහිදී සසිඳු මහානාම මහතා මෙසේද කීය.

මේ රටේ සියලු දේශපාලන පක්ෂ අද මේ රට බංකොලොත් තත්ත්වයට පත් කිරීමට අඩු වැඩි වශයෙන් දායක වී තිබෙනවා. එම දේශපාලන ක්‍රියා පටිපාටි පේරම් ගෙන නව දේශපාලන සංස්කෘතියකට රට යොමු කරලීම අත්‍යවශ්‍යව තිබෙනවා.

වැරැකියාව, දූෂණය, නාස්තිය පුරාකරලීමට තවමත් අපොහොසත් වී ඇත්තේ යල් පැනපු දේශපාලන ක්‍රම ඔස්සේ කරගෙන යන පාලන ක්‍රමවේදය නිසයි. රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයෙන්ද දොරටු මේ රටේ තරම් පරාජිතමකටම විවෘත කරලීමට හැකිවන ආර්ථිකයේ නිම්වළලු පුළුල් කරන හා රාජ්‍ය අංශයේ ඉඩකඩ විවර වන නව ක්‍රමවේදයන් දියත් කළ යුතුයි. මේ සියල්ල සමඟ නිර්ධ දේශපාලනයක් රටට උරුම කර ගත හැකි වේවි යන්න මගේ හැඟීම.

"පාර්ලිමේන්තුවේ දූෂණ වංචා පිළිබඳ කෝප් හා කෝපා කාරක සභාවලදී බොහෝ දේ රටට හෙළි වෙනවා. රාජ්‍ය ආයතන බොහෝමයක අකාර්යක්ෂමතාව දූෂණ වංචා හෙළි වෙනවා. නමුත් එම ආයතනවල සිදු වූ වැරැදිවලට වගකිව යුතු අය ගැන ගන්න පියවර ගැන සමීක්ෂකට පත්වන්න ප්‍රවර්ණ පසුබිමක් එහා ඇති කළ යුතුයි.

මහජන මුදල් ගසාකන අය නිදැල්ලේ යැවීම නව නවත් එවන් ක්‍රියාමාර්ගවලට වඩා ආකාරයකින් අනුබල දීමක්. එම නිසා පාර්ලිමේන්තුවේ එම විශේෂ කාරක සභාවලදී හෙළිදරව් වන ආයතන හා ඒවායේ සිදුවන වැරැදි ක්‍රියාවන්ට දඬුවම් හෝ නීතිමය පියවර ගන්න ක්‍රියා කළොත් එය ඉතා වටිනා මෙහෙවරක් වෙනවා. ඊශ්‍රායල් පලස්තීන යුද ගැටුම තුළ ශ්‍රී ලාංකිකයන්ද විශාල අනතුරකට මුහුණ දී තිබෙනවා. අපේ බලධාරීන් මීට වඩා එම අතරමංව සිටින අපේ ජනතාව දෙස අවධානය යොමු කළ යුතුයි."

# දිවිතුර වත්තේ තේ කම්හලේ නිෂ්පාදන යළි ඇරඹේ

■ බළපිටිය - දම්සරි ලියනගේ



දක්ෂිණ අධිවේගී මාර්ගයේ කුරුඳුගහහැතැප්ම පිවිසුම් ආසන්නයේ පිහිටා තිබෙන දිවිතුර වත්ත තේ කර්මාන්තශාලාව වසර 15කට පසුව නැවතත් එහි නිෂ්පාදන කටයුතු සඳහා විවෘත කිරීමට එහි නව පාලනාධිකාරිය පියවර ගෙන තිබේ.

වැසී ගොස් තිබූ මෙම තේ කර්මාන්ත ශාලාවේ සේවය කළ සේවක සේවිකාවන් 100කට අධික පිරිසකට මේ හේතුවෙන් නැවතත් තම ජීවනෝපාය සලසා ගැනීමට අවස්ථාව උදා වූ බව දිවිතුර වත්ත වතු යායේ සම්භාරය ජනතාව කියති.

දකුණු පළාතේ පැරැණිතම තේ හා රබර් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මීට වසර 150කට පමණ පෙර ඉංග්‍රීසි පාලන සමයේ ස්ථාපිත කරන ලද මහල් තුනකින් යුත් මේ තේ කර්මාන්තශාලාව උපරිම තාක්ෂණික හා උපකරණවලින් සමන්විතව තිබී ඇත. අංග සම්පූර්ණ තේ කම්හලක් ලෙස මෑතක් වන තුරුම තේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව සිදුකරගෙන ගියත් විවිධ හේතූන් මත එය වසා දැමීමට මීට වසර 15කට පෙර ක්‍රියා කර තිබිණි.

අල්පිටිය වතු සමාගම විසින් එකල පාලනය කළ මේ තේ කර්මාන්තශාලාව බිදු පදනම මත සමාගම විසින් ලබාගෙන අන්තර්ජාතික තේ වෙළෙඳාම සඳහා විවෘත කළ බව එවර්ලීන් සමූහ ව්‍යාපාරයේ සභාපති අරුණ ද සිල්වා ප්‍රකාශ කළේය. අගය එකතු කළ තේ හා අතින් නිම කළ තේ, පහතරට තේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය සියලු සේවක ශක්තිය, තාක්ෂණික නිලධාරීන්ගෙන් සමන්විත 40 දෙනකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් දිවිතුර වත්ත තේ කර්මාන්ත ශාලාව සඳහා පත්කර ඇති බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

දකුණේ සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට හැකි සුන්දර පරිසරයක මෙම තේ කර්මාන්ත ශාලාව පිහිටා තිබෙන නිසා ඉදිරි කාලවලදී ඇදී අා සංචාරක ආකර්ෂණය නැවත වරක් ඇති කරගැනීමට හැකි බවද නව තේ සමාගම පවසයි. තේ කම්හල සඳහා අවශ්‍ය සියලු කටයුතු කිරීමට පහසුකම් සලසා ඇති බවද එම සමාගම වැඩිදුරටත් කියයි.

# කැලණි සරසවියේ ශාස්ත්‍රීය සංවාද මණ්ඩපය 24 වැනිදා

කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ වාර්ෂික ශාස්ත්‍රීය සම්භාෂණය එම විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ පරිශ්‍රයේදී 24 වැනිදා පෙරවරු 10.00 සිට පැවැත්වේ.

'සංස්කෘතික අනන්‍යතාව සහ භාෂා අධ්‍යයන' මැයෙන් මෙවර පැවැත්වෙන සංවාදයේදී සිංහල භාෂා හා සාහිත්‍ය අධ්‍යයන පර්යේෂණ 80කට අධික සංඛ්‍යාවක් සම්බන්ධයෙන් සාකච්ඡා කෙරේ.

සම්භාව්‍ය, නූතන සිංහල සාහිත්‍ය හා විචාර සම්ප්‍රදාය, සිංහල භාෂාව, ව්‍යාකරණය හා වාග් විද්‍යාව, සිංහල සංස්කෘතිය, ප්‍රාසංගික හා වාර්තික කලා යන විෂය ක්ෂේත්‍ර මෙහිදී ශාස්ත්‍රීය සංසාධනයට ලක්වේ.

මෙහි ප්‍රධාන දේශනය කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව විසින් සිදු කරනු ලබයි.

## අනුරාධපුරයේ විශ්‍රාමික දින උත්සවය

# කොමර්ෂල් බැංකුවේ අනුග්‍රාහකත්වයෙන්





බැංකු අවශ්‍යතා පිළිබඳව බැංකුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙමින් කොමර්ෂල් බැංකුව විසින් පසුගියදා අනුරාධපුරයේ පැවැති විශ්‍රාමිකයන්ගේ දින උත්සවයකදී විශ්‍රාමික රාජ්‍ය සේවකයන් 400ට අධික පිරිසකට සත්කාරකත්වය සපයන ලදී. රජරට විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය මනෝජ් ප්‍රනාන්දුගේ බෝ නොවන රෝග පිළිබඳ දේශනයෙන් උත්සවය ආරම්භ විය.

එදින දවසේ විශේෂ සිදුවීම වූයේ මහනුවර සුව සෙවණ රෝහල මඟින් නොමිලේ වෛද්‍ය සායනයක් පවත්වා සහභාගී වූවන් සඳහා අත්‍යවශ්‍ය සෞඛ්‍ය පරීක්ෂණ සහ වෛද්‍ය උපදේශන පිරිනැමීමයි. ඊට සමගාමීව බැංකුවේ යසස විශ්‍රාම වැටුප් ගිණුම් සහ ණය පහසුකම ඇතුළුව ඉතුරුම් සහ ණය පහසුකම් සම්බන්ධයෙන් විශ්‍රාමිකයන්ගේ අවශ්‍යතා සාකච්ඡා කිරීමට බැංකුවේ නියෝජිතයෝ පැමිණ සිටියහ.

ජාතික ලොතරැයි මණ්ඩලය / National Lotteries Board — අඟහරුවාදා සිළු ප්‍රතිඵල — 2023.10.17 — www.nlb.lk — NLB

**මහජන සම්පත** — දිනුම් වාරය : 5270 — රු. 34,013,784.00 — ජයග්‍රාහී අක්ෂරය: D — ජයග්‍රාහී අංක: 9 9 4 5 5 2

**ගොවිසෙත** — දිනුම් වාරය 3512 — 2023.10.17 — රු. 64,323,849.20 — ජයග්‍රාහී අක්ෂරය E — ජයග්‍රාහී අංක 17 20 28 52 — බෝනස් අක්ෂරය E — 51436

**Mega Power** — 1618 — 2023.10.17 — 19218 — රු. 411,274,948.00 — F — 24 — 28 31 50 64 — රු. 10,000,000.00 — රු. 10,000,000.00

**ලග්න වාසනා** — 2023.10.17 — 0096 — ජයග්‍රාහී ලග්නය කටක — ජයග්‍රාහී අංක 1 1 4 6 5 8 — L7 අංකය 2 7 — රු. 11,710,505.28

**හඳහන** — දිනය 2023.10.17 — දිනුම් වාරය 579 — රු. 3,036,814.40 — ජයග්‍රාහී ලග්නය කන්‍යා — ජයග්‍රාහී අංක 01 02 29 54 — බෝනස් ලග්නය කන්‍යා

**ධන නිධානය** — 1300 — රු. 115,826,220.00 — I — 10 14 45 70 — I — 15763



# රට හදන තැන

■ අනුරාධා හේරත්, ක්‍රිශාන් පතිරත් ජයසූරිය

ජනපති උපදේශක නීතිඥ බඩුනිහාල ප්‍රදානය කිරීමේ පසෙක් පෙරමුනෙක (ලද්වන වර පිහිටිම), අධිකරණ සංවිධාන පනත යටතේ අංක 2339/06 සහ 2347/10 දරන ගැසට් පත්‍රවල සඳහන් නියෝග ලක්ෂයට අදාළ විවාදයේදී ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ මැති ඇමැතිවරුන් පාර්ලිමේන්තුවේදී ඊයේ (18දා) දැක්වූ අදහස්.

පාර්ලිමේන්තුව අද (19දා) පෙරවරු 9.30ට නැවත රැස්වේ.

## මැතිවරණ ක්‍රමය වෙනස් කරනවා කියලයි හැම ආණ්ඩුවක්ම දිනුවේ

### අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ

"21 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මම ඉදිරිපත් කරන විට සද්භාවය ගැන අභියෝග කළා. මැතිවරණ වියදම් නියාමනය ගැන පනතක් ඉදිරිපත් කළ අවස්ථාවේත් සද්භාවය ගැන ප්‍රශ්න විපක්ෂය ඉදිරිපත් කළා. දූෂණ විරෝධී පනත ගේන විටත් ඒකෙත් සද්භාවයක් තියෙනවාද කියලා දිගින් දිගටම ප්‍රශ්න කළා. නමුත් මේ පනත් තුනම පාර්ලිමේන්තුව සම්මත කළා.

මැතිවරණ ක්‍රමයේ වෙනස්කම් කරන බවට පොරොන්දු නිසා තමයි හැම ආණ්ඩුවක්ම ජයග්‍රහණය කළේ. විපක්ෂය පවා එය පිළිගෙන තිබෙනවා. සද්භාවය පිළිබඳ වගකීම මම ගන්නවා. ඒක මම ගෙනාවේ. ගෙනා සියලු පනත්වලට මේ ගැටලුව ආවා. අභියෝග පැමිණියත් මේ පනත් අපි හකුළා ගත්තේ නැහැ. මුලදී අභියෝග කළත් ඒවායේ තියෙන වැදගත්කම තේරුම් ගත්තාම විපක්ෂය පවා ඇතැම් ඒවාට ඡන්දය දුන්නා. අපිට 210 ඡන්දය දුන්නා. දූෂණ විරෝධී පනතට විපක්ෂය ලොකු සහායක් දුන්නා. ස්තූතියි ඒකට. ඒ වගේම මෙරට දූෂණය නතර කළ යුතුයි කියලා අපි කියනවා. දූෂණයට විරුද්ධ මහජන නියෝජිතයන් පත් කළ යුතු බවට එකඟතාවක් තියෙනවා. එවැනි මහජන නියෝජිතයන්ට ඒමට හැකි මැතිවරණ ක්‍රමයක් හැදිය යුතුයි කියලා කියනවා. ඉතින් අපි ඒ ක්‍රමය හදනවා. ඒකට කවුරු හරි විරුද්ධ නම් ඉන් අදහස් කරන්නේ මොකද්ද. අපිට තියෙන්න ඕන මේ දූෂිත ක්‍රමයම. මේ දූෂිත ක්‍රමයෙන් එළියට එන්න කැමැති නැහැ. ඒක නිසා මේක ගේනවාට විරුද්ධයි කියලා විපක්ෂයට කියන්න පුළුවන්කමක් නැහැ."

## බොරු පරීක්ෂණවලට පත්කරන තේරීම් කාරක සභාවලට අපි එන්නේ නැහැ

### මන්ත්‍රී විජිත හේරත්

"රටේ යුක්තිය සාධාරණත්වය නැත්නම් ඒ සමාජය කඩාගෙන වැටෙනවා. අපි කොතරම් නීති අණපනත් මේ පාර්ලිමේන්තුවේ සම්මත කළත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් සමාජ සාධාරණත්වය ඇති වෙන්නේ නැහැ. රටේ ජනතාවට අද තියෙන ලොකුම ප්‍රශ්නය නීති කොච්චර තිබ්බත් නීති ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එක. සරලම උදාහරණය පාස්කු ප්‍රහාරය. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් මෑත කාලයේ ඉතාම වැදගත් තොරතුරු රාශියක් අනාවරණය වුණා. ඒ පිළිබඳව පරීක්ෂණ කරනවා කියලා ආණ්ඩුව විවිධාකාර ප්‍රකාශ කළා. නමුත් අද වෙනකන් වින්දිතයන්ට යුක්තිය, සාධාරණත්වය ඉටු වුණේ නෑ. වූදිතයන්ට නිවැරදි දඬුවම් ලැබුණෙ නෑ. වූදිතයන් පැහැදිලිව රටට හෙළිදරව් කළේ නැහැ.

සාධාරණ පරීක්ෂණයක් සිදු නොකොට බොරුවට මේ පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභා පත් කර තවත් කාලය නාස්ති කර තිබීම තේරුමක් නෑ. මේ අපරාධයට වගකිවයුත්තන් තේරීම් කාරක සභාවේ ප්‍රධානීන් බවට පත් කර ඔවුන්ගෙන් සාධාරණය ඉටුවෙන්නේ නැහැ.

වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට වුණේ නෑ. අපි එක පාරක් කරපු වැරැද්ද නැවත වතාවක් කරලා නැවත මේ රටේ ජනතාවට සාධාරණයක් ඉටු නොකර කාලය කා දමන්න අපි ලෑස්ති නෑ. අපි ඉතා වගකීමෙන් කියනවා මේ බොරු පරීක්ෂණ සඳහා පත් කරන තේරීම් කාරක සභාවලට ජාතික ජන බලවේගය අපි සම්බන්ධ වෙන්නේ නැහැ. මොකද එයින් යුක්තිය හා සාධාරණත්වය ඉටු වෙන්නේ නැහැ."

## තරුණයන් 80%ක් රට දාලා යද්දී රට පාලනය කරන්නේ 80ට කිට්ටු මහලු අය

### මන්ත්‍රී චන්දිම වීරක්කොඩි

"අපේ රටේ නීතිය වෙනස් කිරීම ගැන විතරයි කතා කරන්නේ. නීතිය පිළිපැදීම හෝ නීතිය ක්‍රියාත්මක වෙනවාද කියලා අවධානයක් යොමු වෙන්නේ නැහැ. මේ රට යහ විදිහට කිසිදු කෙනෙක් ජීවත් නොවන කාටවත් අවශ්‍ය නැති කාලෙවත් නොවන රටක් බවට පරිවර්තනය වෙමින් සිටිනවාද කියලා සැකයක් තියෙනවා.

මේ වෙද්දී අපි දන්නවා අපේ රටේ අඩාම දරුවන් ඒ කියන්නෙ ළදරුවන් 56,000ක් මන්දපෝෂණයෙන් පෙළෙනවා. පාසලකට ගියාම පාසලේ අවශ්‍ය කරන ගුරුවරු පිළිබඳ විශාල හිඟයක් තියෙනවා. අධ්‍යාපනය සඳහා අපේ දළ දේශීය නිෂ්පාදනයෙන් ඉතාම අවම මට්ටමක් වෙන් කරන්නෙ. විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ අවශ්‍යතාව 12,500ක් හැටියට තීන්දු කර තියෙනවා. නමුත් ඉන්නේ 6,200යි. සක්‍රිය සේවයේ හිටියේ. මේ මොහොත වන විට ඉන් 1,700ක් මේ රටේ නෑ. මේ වගේ තත්ත්වයක් තුළ ලෝකේ සාමාන්‍යයෙන් ඉහළ විශ්වවිද්‍යාලයක් වෙන්න නම් වෛද්‍ය ඉංජිනේරු ක්ෂේත්‍රයේ දරුවන් හය හත් දෙනකුට එක කථිකාචාර්යවරයෙක් සිටිය යුතුයි. කලා විෂයයන් සඳහා සිසුන් 18කට කථිකාචාර්යවරයෙක් ඕනේ. අපේ රටේ ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත් මේ මොහොතේ සිසුන් 28කට එක කථිකාචාර්යවරයයි සිටින්නේ. අපේ රට කොහෙනටද යන්නේ? රටේ තරුණයෝ අවුරුදු දහ අටත් විසි හතරත් අතර සියයට අසූවක් රට දාලා යන්න ඉන්නේ. 35 වයසෙ උඩවිය 78% දාලා යන්න ඉන්නෙ. රට පාලනය කරන්නේ අවුරුදු අසූවට ලංවෙච්ච මහලු අය."

## මේවායින් වැඩක් ගන්න බැරි නම් රටට පේන්න නීති ගෙනාවට වැඩක් නැහැ

### මන්ත්‍රී තුෂාර ඉඳුනිල් අමරසේන

"මේ නීති අණපනත් සියල්ල මැල්ලුමක් හැටියට අද සකස් වෙනවා. හැබැයි මේ නීති අණපනත් මෙතන මැල්ලුමක් සකස් වුණත් අපේ රටේ ඉහළනා ගිය දූෂණ වංචා සියලු කටයුතු ඒ ආකාරයෙන්ම සිද්ධ වෙනවා. පසුගිය කාලයේ දැක්කා දූෂණ විරෝධී පනත, මේ පනත පාර්ලිමේන්තුවට ගෙන ආවා. ඒ වෙලාවේ තමයි බාල ඖෂධ පිළිබඳ මහඩිය එළියට ආවේ. ඒ පනත් ගේන්න කලිනුත් මේ රටේ දූෂණය සිද්ධ වුණා. පනත් ගෙන ආවට පස්සෙත් මේ රටේ දූෂණයන් සිද්ධ වුණා. මේවා රටට පේන්න ගෙනාවට වැඩක් නෑ මේවගෙන් වැඩක් ගන්න බැරි නම්. ඒ එක්කම අපි දැක්කා සමාජ මාධ්‍ය නියාමන පනත. මේක අපේ සමගි ජන බලවේගය විසින් සරලියට ගේනකොට මේක සමගි ජන බලවේගයේ විරෝධතාවක් විතරයි කියලා ලඝු කළා. මෑත ඉතිහාසයේ රජයක් විසින් ගෙන ආ පනතකට විරුද්ධව මහජනතාවගේ විවිධ පාර්ශ්වවලින් ආ පෙත්සම් 40ක ප්‍රමාණයක් ඊයේ දවස, අද දවස, හෙට දවස විභාගයට පත්වෙනවා. අපිට ආරංචියි නීතිපතිවරයා එකඟ වී තිබෙනවා මේ සමාජ මාධ්‍ය නියාමන පනත වෙනුවෙන් අවශ්‍ය කරන සංශෝධන තමන්ලීව ගෙන ඒමට එකඟවෙලා තියෙනවා කියලා. මේ ආපු පෙත්සම් තනලින එක පාර්ශ්වයකින් නෙමේ. සමාජය තුළ විවිධ කම්පන තියෙනවා, විවිධ මතවාදයන් ගොඩනැගෙනවා. ඒ නිසයි අධිකරණයට මේ විදිහ පෙත්සම් ගනලිනක් ඉදිරිපත් වෙන්නේ. දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු, තොරතුරු දැන ගැනීමේ පනත පාර්ලිමේන්තුව තුළ සම්මත කරලා ජනතාවට තොරතුරු දැන ගැනීමේ අයිතිය ස්ථාපිත කරපු එදා සිටි අගමැති අද ජනාධිපතිවරයා බවට පත්වුණාම තමයි මේ සමාජ මාධ්‍ය නියාමන පනත වගේ දේවල් ගේන්න කටයුතු කරන්නේ. මේ වගේ මර්දනකාරී වැඩපිළිවෙළක් ගේන්නේ. අපි ඒ ගැන විශේෂයෙන් කනගාටු වෙනවා."

## දෙමළ ජනතාවගෙන් පවරාගත් ඉඩම් ආපසු නිදහස් නොකරන්නේ ඇයි?

### මන්ත්‍රී එස්. ශ්‍රීධරන්

"වසර 30ක පමණ කාලයක් නාවික හමුදාවේ දැඩි පාලනයට නතු වූ භූමියේ සුවපහසු ජනාධිපති මන්දිරයක් ඉදිකළේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පාලන සමයේදීයි.

කීරිමලේ, කන්කසන්තුරේ පාරේ පිහිටි ප්‍රදේශයේ රජ මාලිගය සහ විහාරස්ථාන විනාශ කර ඉදිකරන ලද ගොඩනැගිලි දීර්ඝකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගමකට ලබා දීමට රජය තීරණය කර ඇතැයි දැනගන්නට තියෙනවා. සම්ස්ත ශ්‍රී ලංකා හින්දු සංසදයේ උප සභාපති අර්. තිරුමුරුගන් විසින් මෙම ජනාධිපති මන්දිරයේ ගැටලුව සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත ලිපියක් යවා තිබෙනවා.

හින්දු ආගමික සාක්ෂි සහ ආගමික සංකේත විනාශ කර කීරිමලෙයි ප්‍රදේශයේ ජනාධිපති මන්දිරය ඉදිකර තිබෙන්නේ.

උතුරු හා නැගෙනහිර පළාත්වල පෞද්ගලික ඉඩම් වසර ගණනාවක් අධි ආරක්ෂිත කලාප ලෙස අල්ලාගෙන සිටියා. ඒ ඉඩම්වල පසුගිය කාලයේ රජයේ ගොඩනැගිලි ඉදිවුණා. දැන් ඒවා වෙනත් පුද්ගලයන්ට ලබා දීමට තීරණය කර තියෙනවා. කෝ මේ රටේ යුක්තිය? ආරක්ෂාව නමින් අත්පත් කරගත් දෙමළ ජනතාවගේ ඉඩම් නිදහස් නොකරන්නේ මන්දැයි මම මෙම ඉහළ සභාව හරහා ජනාධිපතිවරයාගෙන්, අගමැතිතුමාගෙන් සහ අධිකරණ ඇමැතිවරයාගෙන් අසනවා."

## මාධ්‍ය නියාමන පනතක් ගෙනැත් මිනිසුන්ගේ කටත් වහන්න හදනවා

### විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස

"දැන් හැමතැනම කතා වෙන්නේ මැතිවරණ නතර කිරීම පිළිබඳවයි. පාර්ලිමේන්තුව ඇතුළතත් ඉන් පිටතත් ඒ පිළිබඳව කතා වෙනවා. මේ මැතිවරණ ක්‍රම වෙනස් කරනවා කියලා ජනතාවගේ ඡන්ද අයිතිය උල්ලංඝනය කරන්න දෙන්න බෑ.

මැතිවරණ කොමිසම ඉල්ලලා තියෙනවා ඉතුරු සල්ලි ටිකත් දෙන්න කියලා මැතිවරණය පවත්වන්නට. අපි අහනවා රජය සල්ලි දෙනවද කියලා. දැනටමත් විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරලා තියෙනවා මේ සඳහා. මොකද්ද මේ ආණ්ඩුව කරන්නේ. මැතිවරණ නතර කිරීම තුළින් ජනතාවගේ මානව අයිතිය සම්පූර්ණයෙන් උල්ලංඝනය කිරීමක් සිදුවනවා. මේ දේ කරන්නට දෙන්න බෑ. සමාජ මාධ්‍ය නියාමන පනතකුත් ගේන්න හදනවා දැන්. දැන් මිනිස්සුන්ගේ කටවලුත් වහන්නද මේ හදන්නේ. ඡන්ද නතර කරන මැතිවරණ සංශෝධන ක්‍රියාවලිය වහා නතර කළ යුතුයි.

අද අගමැතිවරයා බරපතළ ප්‍රකාශයක් කළා. ඒක තමයි අමාත්‍යංශ උපදේශක කාරක සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඇවිත් මැතිවරණය කල් දමන්න කියලා ප්‍රකාශයට පත්කළා කියන කාරණාව. මම ඉල්ලන්නේ ඒ උපදේශක කාරක සභාවේ කාර්ය සටහන් යෝජනා කළ විපක්ෂ මන්ත්‍රීවරු කවුද කියලා අපි දැන ගත යුතුයි."

## මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ශ්‍රේෂ්ඨාධිකරණයත් මැදිහත් විය යුතුයි

### විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල

"පසුගිය සති දෙකකට පෙර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වැදගත් නඩු තීන්දුවක් ලබා දුන්නා පක්ෂ මාරු කරන මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රී ධුරය අහෝසි කරන්න. ඇත්ත වශයෙන්ම මෙය ඉතාමත් හොඳ තීන්දුවක්. ලලිත්, ගාමිණී පක්ෂයෙන් නෙරපලා ආසනය අහිමි වුණාට පස්සේ වසර 31කට මේ වගේ තීන්දුවක් ආවේ නෑ. අද පක්ෂයට තමයි ප්‍රධානත්වය දීලා තියෙන්නේ. මන්ත්‍රීවරුන්ගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි වුණොත් මන්ත්‍රී ධුරය අහෝසි වෙනවා. වසර 31ක් තිස්සේ මන්ත්‍රීවරුන් 60කට ආසන්න ප්‍රමාණයක් පිල් මාරු කළා. තමන්ට ඡන්දය දුන්නු ජනතා වරම් දූෂණය කළා. නමුත් ඒ කිසි කෙනෙක්ගෙ මන්ත්‍රී ධුරය අහෝසි වුණේ නෑ.

ජනවරම් පාවා දීලා මන්ත්‍රීවරු හැටක් පමණ පිල් මාරු කළා. සමහරු තිව්වා දැන් ගේන්නිමින් කරන්න යනවා කියලා. සමහරු ගුල්ලදට සහයෝගය දෙන්න ගියා. නමුත් විපක්ෂයේ ඉඳන් ආණ්ඩුවට සහයෝගය දෙන්න සිඳුණා. මම මේ වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට දොස් කියනවා. ශ්‍රේෂ්ඨාධිකරණය මේ එක මන්ත්‍රීවරයකුගේවත් ආසනය අහිමි කළේ නෑ. මේ දූෂිත ක්‍රමය අනුමත කෙරුවා.

ඇත්ත වශයෙන්ම මේ ලබාදුන් තීන්දුව ඓතිහාසික තීන්දුවක්. පසුගිය ඒවා අපි අමතක කරමු. මේ දේශපාලන සංස්කෘතිය සුද්ද කරන්න ශ්‍රේෂ්ඨාධිකරණය මැදිහත් විය යුතුයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විතරක් නෙවෙයි විධායකයට, ව්‍යවස්ථාදායකයට, අධිකරණයටත් වගකීමක් තියෙනවා මේ දූෂිත දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න.

දූෂණ විරෝධී පනතට විපක්ෂය ලෙස අපි විරුද්ධ වුණා කියලා මෙතන දී කියවුණා. ඕවී ඒක හරි. මොකද අපි සංශෝධන වගයක් ගෙනාවා. ඒ සංශෝධනවලට ආණ්ඩුව අකැමැති වුණා. ඉතින් ඒක වැරදි විදියට අර්ථ නිරූපණය කළ යුතු නෑ. විධායක ජනාධිපති ධුරය අහෝසි කළ යුතුයි කියලා සෑහෙන දවසක ඉඳන් තමා සාකච්ඡා වෙන්නේ. හැබැයි දිනන්න පුළුවන් නම් මේක අහෝසි කරන්නෑ. හැම ආණ්ඩුවම කළේ ඒකයි."

## සමහර නීතිඥයන්ද නීති වෘත්තියේ ආචාර ධර්මවලට නොගැළපෙන ලෙස හැසිරෙනවා

### මන්ත්‍රී නීතිඥ මධුර විතානගේ

"අද වෙනකොට අපි දකිනවා නීති වෘත්තියේ විශාල කඩාවැටීමක්. රටේ අරගලකාරී අවස්ථාවන්වල යම් යම් සැකකරුවන්, වූදිතයන් ඒ වගේම යම් යම් කඩාකප්පල්කාරී ක්‍රියා කරපු අපරාධකරුවන් අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේදී ඇතැම් නීතිඥයන් නීතිඥ සංගමය නොවෙයි නීතිඥ සංගමයට මම මේ මොහොතේ චෝදනාව එල්ල කරන්නෙ නෑ. ඒත් ඇතැම් නීතිඥවරුන් මේ නීති ආචාරධර්මවලට නොගැළපෙන ආකාරයට අධිකරණ භූමියේ හැසිරුණා අපි දැක්කා. සමහර සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කරලා ඒ අයට ඇප දුන්නට පස්සේ අධිකරණ භූමියේ මල්මාලා දාලා බදාගෙන සිප වැලඳගෙන ඒ වගේම ඔවුන්ව නැවත මේ අපරාධවලට පෙලඹීන ආකාරයෙන් ලොකු පෙලඹවීමක් ඇති කළා. මං හිතන්නේ නීති වෘත්තියට නොගැළපෙන ආකාරයට සමහර නීතිඥවරුන් පසුගිය කාලය පුරාවටම හැසිරුණා. ඇතැම් නීතිඥවරුන් අපි දැක්කා රඹුක්කන සිද්ධියේදී, මිරිහාන සිද්ධියේදී ඒ වගේම කොටුවේදී, සමහර අපරාධකාරයන් වීරයෝ බවට පත් කළේ මේ නීතිඥවරුන් එකතුවෙලා."

## ජනපතිගේ චීන ගමන නිකම් දෙකයි පනහට දාලා කතා කරන්න බෑ

### මන්ත්‍රී නිමල් ලංසා

"ජනාධිපතිවරයාට ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම ජනාධිපතිවරයා ඒ පිළිබඳ සාධාරණ විසඳුම් ඉදිරිපත් කරන්න කියලා පොලිසියට නියෝග දීලා තියෙනවා. ඒ පොලිසියට දුන්නු නියෝගය ක්‍රියාත්මක වෙන් නැත්නම් ජනාධිපතිවරයා නැවත රටට ආවාම ඒක විසඳගන්න පුළුවන්. මොකද මේ අය ජනාධිපතිතුමා එක්ක රෑට සාකච්ඡා කරනවා. ටිට පස්සෙ වෙන එකක් කියනවා.

ජනාධිපතිතුමා තාවකාලිකව පොලිස්පතිතුමා පත්කරන්නට ව්‍යවස්ථා සභාවට එවලා තිබෙනවා. ව්‍යවස්ථා සභාව කියලා තිබෙනවා යම් නීතිමය බාධාවක් නිසා කරන්නට බෑ කියලා. ජනාධිපතිතුමාට නැවත එම නම් ටික ව්‍යවස්ථා දායක සභාවට දෙන්න පුළුවන්. ඒක නීත්‍යනුකූලව වෙයි. ජනාධිපතිතුමා ගිහින් තියෙන්නේ චීනය සමඟ ඉතා වැදගත් සාකච්ඡාවකටයි. ඒ රටේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම, රටට ආයෝජන ගෙන ඒම ඇතුළු කාරණා කිහිපයකටයි. ඒ නිසා ජනාධිපතිවරයාගේ චීන ගමන නිකන් දෙකයි පනහට දාලා කතා කරන්නට බෑ."

## අලුත්ගමගේ හරසනිදු ... 

## අලුත්ගේරු නිදහසට වඩා සමාජ මාධ්‍ය නියාමනයක් තිබීම හොඳයි

### මන්ත්‍රී නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත

"යෝජනා කරනවා අලුත්ගේරු නිදහසට වඩා යම් නියාමනයක් තිබිය යුතුයි කියලා. දැන් සමගි ජන බලවේගයෙ මන්ත්‍රීවරු දෙන්නෙක් අඩා වැලපෙනවා. එක්සත් ජාතීන්ගේ සැසිවාරය අමතන්න ගිහින් සිදුවුවා කියන සිද්ධියක් අල්ලාගෙන. ඒවා ප්‍රචාරය වුණේ සමාජ මාධ්‍ය හරහා. ඉතින් ඔබතුමන්ලටම තියෙන්නෙ නැද්ද මේවා යම් ආකාරයකින් වාරණය විය යුතුයි කියලා.

ඒ වගේම මේ රටේ පොලිස්පතිවරයෙක් නෑ කියනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බැලුවම ව්‍යවස්ථා සභාවට තියෙන්නේ නිර්දේශ කරන්න විතරයි. පොලිස්පතිවරයා සම්බන්ධව මේ කියන ආකාරයේ සැක සංකා මේ සමාජ සභාව තුළ මැවීම සුදුසු නැහැ. රටේ ජනාධිපතිවරයා මේ මොහොතෙ ඉන්නේ රටින් පිට. අපි දැක්කා පසුගිය කාලේ කොහොමද පොලිසියේ බලය, නීතියේ ආධිපත්‍යය නොමැති වීම තුළ කොහොමද මේ රටේ ප්‍රචණ්ඩත්වය තිබිවුණේ කියලා.

අද පොලිසියේ අධිපති බලපරාක්‍රම සියල්ල තියෙද්දී සමහර අවස්ථාවල අපි දකිනවා බස් එකේ යන අහිංසක දැරිය සමූහ දූෂණයට ලක්කරන තත්ත්වයක් නිර්මාණය වී තියෙන බව. පොලිස්පතිට කියන බලයක් නැහැ තිබ්බොත් මොකද වෙන්නේ? අපේ දේශපාලන මතිමතාන්තර බලන්න එපා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පැහැදිලිවම තියෙන්නේ නිර්දේශ කිරීමේ බලය විතරයි. හැබැයි පත් කිරීමේ බලය තියෙන්නේ මේ රටේ ජනාධිපතිතුමාට. දවස් දෙක තුනකින් පස්සේ ජනාධිපතිතුමා එනවා. මේ කාරණාව සම්බන්ධයෙන් ටිට පස්සේ අපිට පුළුවන් සාකච්ඡා කර ගන්න."

## පොලිස්පති පත්කිරීමේ ප්‍රශ්නය පාර්ලිමේන්තුව හරහා හෝ විසඳන්න

### මන්ත්‍රී ශානකයන් රාසමානික්කම්

"රටේ ජනාධිපතිවරයා විදෙස් ගත වෙලා. රටේ පොලිසිය භාර ඇමැතිවරයාත් රට තුළ නෑ. මම දැක්කා පොලිස්පතිවරයාගේ පත් වීම නීතිවිරෝධීයි ඒක පිළිගන්න බෑ කියලා කියලු තිබෙනවා එක් කණ්ඩායමක්. ජනාධිපතිතුමාගෙ කණ්ඩායමක් කියනවා ජනාධිපතිවරයා පත් කරන අය අයින් කරන්න බෑ කියලා. ජනාධිපතිවරයා පසුගියදා කියලා රැස්වීමක් පැවැත්වූවා මඩකළපුවේ. නමුත් ඒ එකක්වත් හරියට ක්‍රියාත්මක වන්නේ නෑ. විලහට පොලිස්පති වෙන්න ඉන්න අයට දෙන්න බැරි නම් මේ තනතුර,මේක පාර්ලිමේන්තුව හරහා හරි විසඳන්න අවශ්‍යයි. රටක් කොහොමද පොලිස්පතිවරයෙක් නැතිව යන්නේ.

රටේ ජනාධිපති නෑ. එතකොට රට තුළ නීතිය ක්‍රියාත්මක කරන්න පොලිස්පතිවරයා සිටිය යුතුයි. එතකොට කවුද පොලිස්පති. පාස්කු ප්‍රහාරය වගේ එකක් අද වුණොත් කවුද මේකට වගකියන්න ඕනේ. මේක රටේ පොලිස්පතිවරයා පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා වහාම මේකට පිළිතුරු අවශ්‍යයි."

## වත්මන් යුද තත්ත්වයෙන් මානව සංහතිය දැඩි අර්බුදයකට පත්වෙලා

### මන්ත්‍රී අතුරලියේ රතන හිමි

අද මැදපෙරදිග පවතින යුද්ධය නිසා දරුවන් කාන්තාවන් දැඩි ලෙස පීඩාවට පත් වී සිටිනවා. මේක විශාල ඛේදවාචකයක්. මේ පිළිබඳ ලෝකයේ බලගතු පාර්ශ්වයන් එකතු වෙලා යම් සම්ථයකට පැමිණීමට අවශ්‍යයි. යුද්ධය තාවකාලිකව නතර කර යම් සාමකාමී පියවරක් අනුගමනය කරන එක තමයි වැදගත්. නමුත් ඒක වෙන් නැති තත්ත්වයක් තමයි පවතින්නේ.

මානව සංහතිය විශාල අර්බුදයකට ලක් වී තිබෙනවා. මේ තත්ත්වය මුළු ශ්‍රී ලංකාවටම බලපාන්න පුළුවන්. මේක බෞද්ධ භික්ෂුවක් ලෙස මට නම් දරාගන්න බෑ. මේ තත්ත්වය නිසා ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවන අර්බුදයන්වලට විසඳුම් ඉදිරිපත් කිරීම පිළිබඳ ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ කල්පනා කළ යුතුයි. නිදහසින් පසු අපි IMF එක සමඟ තමයි කටයුතු කළේ. ඒකට කවුරුත් විරුද්ධ වුණේ නෑ. නමුත් ඉන් ලබා ඇති ප්‍රතිඵල පිළිබඳ සලකා බැලිය යුතුයි.

පසුගිය රජය කාලේ ස්වෛරී බැඳුම්කර මඟින් හා බහුපාර්ශ්වීය, ඒකපාර්ශ්වීය ණය ගැනීම් තුළින් රට වැටී ඇති අර්බුදය තේරුම් ගන්න පුළුවන්. මේවාට මේ නිසාන් හොරු හොරු කියලා හරියන් නෑ. මේක ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රශ්නයක්. ඒක පිළිබඳවයි අපිට සාකච්ඡා කරන්න ඕනේ."

## තනතුරට නොගැළපෙන අයට සාම විනිසුරු පදවි ලැබීම ප්‍රශ්නයක්

### මන්ත්‍රී නිමල් පියතිස්ස

"අධිකරණ සංවිධාන පනත යටතේ අපි සාකච්ඡා කරද්දී මේ බලමුලුායතන තුනෙන් එකක බලමුලුායතනයක් පිළිබඳ තමයි මේ අද අපි කතා කරන්නේ. දේශපාලනික වෙච්ච බලමුලුායතනයක් හැටියට අපි අධිකරණය හඳුනාගනු ලබනවා. ඒ වගේම අධිකරණයට පැවරෙන කාර්යභාරය ඉතා ප්‍රබල එකක්. ව්‍යවස්ථාදායකයත්, විධායකයත් ඒ වගේම සමාජයේ අභිසුත් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී අධිකරණය තමයි ප්‍රබල භූමිකාව අත්පත් කරගෙන තියෙන්නේ. විශේෂයෙන් ජනතාවටත්, පරිපාලනයටත් අදාළව යුක්තිය ඉටුකර ගැනීමටත්, ඒ වගේම විවිධ පාර්ශ්වයන් තුළින් අගතියට පත්වන අයට සාධාරණයක් ඉටුකර ගැනීමට තියෙන ප්‍රබල බලමුලුායතනය වන්නේ අධිකරණයයි. මම අධිකරණ අමාත්‍යවරයාට කියනවා සමාදාන විනිසුරු තනතුරු එම අමාත්‍යාංශය විසින් ලබා දීලා තියෙනවා. ඒ පිළිබඳ ප්‍රබල නියාමනයකට පත් විය යුතුයි. මොකද එම තනතුරට නොගැළපෙන අයට එම තනතුරු ලැබුණොත් එය විශාල ප්‍රශ්නයක්."

# FOREIGN NEWS

■ රූ කාරියවසම්, චම්පිකා දීපානි රණසිංහ



## ගාසා තීරයේ රෝහලට එල්ල කළ ගුවන් ප්‍රහාරයෙන් 500ක් මියයද්දී

# ඇමරිකා ජනපති ඊශ්‍රායලයට සහාය පළ කරයි

## මැදපෙරදිග රටවල් 8ක විරෝධතා ඇරැඹෙයි

**ඊශ්‍රායලය විසින් දස දිනක් තිස්සේ ගාසා තීරයට එල්ල කළ බෝම්බ ප්‍රහාරයෙන් තුවාල ලැබූවන්ගෙන් සහ කම්පාවට පත්වූ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගෙන් අතුරු සිදුරු නොමැතිව පිරී ගිය ගාසා නගරයේ පිහිටි අල්-අහ්ලි රෝහලට ගුවනින් එල්ල වූ ප්‍රහාරයක් හේතුවෙන් පන්සියයකට වැඩි පිරිසක් ඝාතනය වී පැය කිහිපයකට පසු ඇමරිකානු ජනාධිපති ජෝ බයිඩන් ඊශ්‍රායලය වෙත පැමිණි අතර ගාසා තීරයේ ඊශ්‍රායලය විසින් කරන යුද්ධයට තම සහාය පළ කරන බව කියා සිටියේය.**

ඇමරිකානු ජනාධිපති ජෝ බයිඩන් මෙම ප්‍රකාශය කරද්දී අල්-අහ්ලි රෝහලට එල්ල කෙරුණු මිලේච්ඡ ප්‍රහාරය බොහෝ රටවල හෙළා දැකීමට ලක්ව තිබූ අතර අරාබි රටවල් අටකට වැඩි ගණනක ජනතාව සිය විරෝධය දැක්වීමට වීදි බැස සිටියහ.

ගාසා නගරයේ පිහිටි අල් - අහ්ලි රෝහලට ඊශ්‍රායලය අඟහරුවාදා (17දා) සවස් කාලයේදී ගුවන් ප්‍රහාරයක් එල්ල කළ බව අල්ජසීරා පුවත් සේවය ඇතුළු ජාත්‍යන්තර මාධ්‍ය කිහිපයක්ම නිවේදනය කළේය.

ඊශ්‍රායලය තමන් රෝහලට ප්‍රහාර එල්ල කළ බව ප්‍රතික්ෂේප කරමින්, පලස්තීන ජිහාඩ් සන්නද්ධ කණ්ඩායම් කළ ප්‍රහාරයක ඉලක්කය වැරදීමෙන් මෙම රෝහලට ප්‍රහාරය එල්ල වී ඇති බව කියා ඇත. පලස්තීන ජිහාඩ් සන්නද්ධ කණ්ඩායම් මෙම චෝදනාව ප්‍රතික්ෂේප කර තිබේ.

අල්-අහ්ලි රෝහලට එල්ල වූ ගුවන් ප්‍රහාරයත් සමඟ මැදපෙරදිග කලාපය තුළ කෝපාග්නිය සහ ප්‍රබල විරෝධයක් හැමෙමින් පවතී. ඉරානයේ ටෙහෙරාන් නගරයේ බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ තානාපති කාර්යාල අසලට රැස්වූ දහස් ගණන් ජනතාව විරෝධතාවේ යෙදුණහ. ජෝර්දානයේ අම්මන් නගරයට රැස්වූ දස දහස් ගණනක් පෙළපාළි ගියහ. මෙම ප්‍රහාරය 'සමූල ඝාතනයක්' ලෙස හෙළා දුටු ජෝර්දානයේ දෙවැනි අබ්දුල්ලා රජු 'මනුෂ්‍යත්වයට නින්දාවක්' බවද පැවසීය. ලෙබනනය, ටියුනීසියාව මෙන්ම බටහිර ඉවුරේ රාමල්ලා නගරයේද විශාල



විරෝධතා ඇතිවීමට මෙම ප්‍රහාරය හේතු වී තිබේ.

මේ අතර ජෝර්දානය සහ ඊජිප්තුව ඇමරිකානු ජනාධිපති ජෝ බයිඩන් හමුවීම ප්‍රතික්ෂේප කර තිබේ. පලස්තීන නායක මොහොමඩ් අබ්බාස් කල් තබාම ඇමරිකානු ජනාධිපතිවරයා හමුවීමෙන් වැළකුණේය.

ඇතිව ඇති තත්ත්වය





මත එක්සත් ජාතීන්ගේ සංවිධානය 'කඩිනම් සටන් විරාමයක්' කරා යන ලෙස පාර්ශ්වයන්ගෙන් ඉල්ලා තිබේ.

ඔක්තෝබර් 07දා හමාස් සටන්කාමීන් ඊශ්‍රායලය තුළට කඩාවැදී සිදු කළ ප්‍රහාරයෙන් අනතුරුව ඊශ්‍රායලය ඊට ප්‍රතිචාර ලෙස ගුවනින් ගාසා තීරයට ප්‍රහාර එල්ල කළේය. ඉකුත් සෙනසුරාදා සිට ගොඩබිමෙන් ආක්‍රමණයට සූදානම් බව කියමින් ගාසා තීරයේ වැසියන්ට උතුරේ සිට දකුණු අන්තයට යන ලෙස අනතුරු හැඟවීය. එහෙත් පලස්තීනුවන් විශාල පිරිසක් දකුණු ප්‍රදේශයට ගමන් කළ පසු ඊශ්‍රායලය දකුණු ප්‍රදේශයට ගුවන් ප්‍රහාර එල්ල කළේය. ජාත්‍යන්තර ප්‍රජාව සහ මානව හිමිකම් සංවිධාන මේ සම්බන්ධයෙන් ප්‍රබල අවධානයක් යොමු කර ඇති අතර එක්සත් ජාතීන්ගේ සංවිධානය ඊශ්‍රායලයට එරෙහිව යුද අපරාධ චෝදනා නැඟීමට හැකි බව පවසා තිබේ.



# අඩුම ගානේ තුවාලකරුවන් ළඟටවත් යන්න ඉඩ දෙන්න

## ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් මානුෂීය ආයාචනයක්

ගාසා තීරයේ පවතින යුද්ධයෙන් තුවාල ලබා සිටින පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීමට යැමටවත් දෙපාර්ශ්වය යුද්ධය නතර කළ යුතු බවත් මේ වන විටත් දරුවන් හා කාන්තාවන් ඇතුළු පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් තුවාල ලබා ප්‍රතිකාර බලාපොරොත්තුවෙන් සිටින බවත් ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ටෙඩ්‍රොස් අදානොම් ගේබ්‍රියෙස් සඳහන් කර ඇත.

ගාසා තීරයේ ඇති වී ඇති යුද්ධමය තත්ත්වය මේ වන විට ලෝක සෞඛ්‍ය සංවිධානයේ පාලනයෙන් මිදී ඇති බවද තම එක්ස් (ටුවිටර්) ගිණුමේ පණිවුඩයක් සටහන් කරමින් හෙතෙම මේ බව සඳහන් කර තිබේ.

පසුගිය දින කිහිපය තුළ වාර්තා වූ මහා පරිමාණ සිවිල් දේපළ හා ජීවිත හානිවලින් පසුව තුවාලකරුවන්ට ප්‍රතිකාර ලබා දීමට තම සංවිධානය සූදානම් වුවද පවතින යුද්ධ තත්ත්වය හේතුවෙන් ප්‍රතිකාර අවශ්‍ය ස්ථාන කරා ළඟා විය නොහැකි බවද ඔහු සඳහන් කර ඇත.

වෛද්‍ය ආධාර දීම සඳහා බලා සිටින සෑම තත්පරයකම ජීවිතයක් අහිමි වන බවත් හදිසි ප්‍රතිකාර අවශ්‍ය මොහොතක ඒ සඳහා සූදානමින් ගොස් සිටින ලෝක සෞඛ්‍ය සංවිධානයේ සැපයුම් දේශ සීමාවේ දින හතරකට වැඩි කාලයක් සිරවී ඇති බවත් ඔහු තම පණිවුඩයේ දක්වා තිබේ.

ජීවිත සුරැකීමේ සැපයුම් බෙදාහැරීම ආරම්භ කිරීමට ලෝක සෞඛ්‍ය සංවිධානය ඉක්මන් ප්‍රවේශයක් අවශ්‍ය බවත් දෙපාර්ශ්වයම ඒ සඳහා සහයෝගය දිය යුතු බවත් හෙතෙම සඳහන් කර ඇත.

උතුරු ගාසා තීරයේ අල් අහ්ලි ආරාබි රෝහලට එල්ල වූ ප්‍රහාරය ලෝක සෞඛ්‍ය සංවිධානය තරයේ හෙළා දකින අතර සිවිල් වැසියන් සහ ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව වහාම ආරක්ෂා කළ යුතු බවත් ජනතාව ප්‍රදේශවලින් ඉවත් කිරීමේ නියෝග ආපසු හරවන ලෙසත් තමා ඉල්ලා සිටින බවත් ඔහුගේ පණිවුඩයේ වැඩිදුරටත් දක්වා තිබේ.

■ මිතුන් ජයවර්ධන

## ගාසා තීරයට ජලය දෙන මිනිසා

ජමීල් අල් - කරෝබි සහ ඔහුගේ බූරුවා ආමින්ඩ් ගාසා තීරයේ ප්‍රසිද්ධව සිටියේ එළවළු වෙළෙඳාමටය. එහෙත් දැන් ඔහු එළවළු වෙළෙඳාම නතර කර ජලය බෙදාහැරීමට පටන්ගෙන තිබේ. පසුගිය දින නවයේම ඔහු බූරුවාත් කැටුව කරන්නේ සරණාගත ගාසා වැසියන්ගේ පිපාසය සංසිඳවාලීමේ සද්කාර්යය ඉටු කරලීමය. හිරු උදා වීමටත් පෙර අවදි වන ඔහු පිරිසුදු ජලය වැසියන්ට බෙදාදීමට පටන් ගනියි. බූරුවාගේ මෙහෙවර එළවළු විකිණීමේදීට වඩා වැඩි ඇති බැවින් බූරුවාට වැඩිපුර ආහාර මිල්ලක් ලබාදීමට තරම් ජමීල් කාරුණිකව සිටී. ඔහු තවමත් 34 හැවිරිදි වියේ පසුවන තරුණයෙකි. ජමීල් යන අරාබි වදනේ අරුත සුන්දරයි යන්නය. ගාසා වැසියන්ට ඔහු දැන් සැබෑවටම සුන්දර දසුනකි. ජමීල් සිවු දරු පියෙකි. ඔහු ජලය ලබාදෙන්නේ මුදල් අය නොකරය.




# නොච්චියාගම රණෝරාව ප්‍රාථමිකය වැහෙන්න ඔන්න මෙන්න



අනුරාධපුර අධ්‍යාපන කලාපයේ නොච්චියාගම කොට්ඨාසයට අයත් රණෝරාව ප්‍රාථමික විද්‍යාලය මේ වන විට වැසීයෑමේ තර්ජනයකට ලක්ව ඇත. නොච්චියාගම නගරයේ සිට කිලෝමීටර් 20ක් පමණ ඈතින් පිහිටි අති දුෂ්කර පාසලක් වන රණෝරාව විදුහල අඩුපාඩු රැසක් මැද පවතී. වසර කිහිපයකට පෙර ප්‍රදේශයේ උගතුන්, බුද්ධිමතුන් විශාල ප්‍රමාණයක් බිහි කළ රණෝරාව ප්‍රාථමික විද්‍යාලය අද වන විට සිසුන් 20කට හා ගුරුවරු පස් දෙනකුට සීමා වී තිබේ. පාසලේ වර්තමාන තත්ත්වය පිළිබඳ සිසුහු හා මවුපියෝ මෙසේ අදහස් දැක්වූහ.









**5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන දෙව්මි විමංශා පුෂ්පකුමාර සිසුවිය.**

අපේ පාසලේ මීට අවුරුදු කීපයකට පෙර ළමයි දෙසීයකට වැඩිය ඉඳලා තියෙනවා. ඒ වගේම පාසලේ පහසුකම් හොඳින් තිබිලා තියෙනවා. පාසලේ ශාලා දෙකක් තිබුණත් ඒවායේ අපිට ඉගෙන ගන්න සුදුසු තත්ත්වයක් නෑ. මොන මොහොතේ කඩා වැටෙයිද දන්නෑ. මේවා කාලයකින් හදලත් නෑ. ජීන්ත ටිසක් නාලාවත් නෑ. වැසිකිළි සියල්ලම අබලන්. පාවිච්චි කරන්න අමාරුයි. ගුරුවරුන්ටත් ඒ වගේමයි.

**5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සලුජ් යෙහෙන් හිමසර මෙසේ කීය. -**

හිය අවුරුද්දේ ශිෂ්‍යත්ව විභාගයට අපේ පාසලෙන් සිසුන් විස්සක් ඉදිරිපත් වුණා. පාසලේ පහසුකම් ප්‍රමාණවත් නොවන නිසා ගමේ ගොඩක් ළමයි වෙනත් පාසල්වලට යනවා. අපිට පුස්තකාලයක් නෑ. සෙල්ලම් කරන්න සෙල්ලම් මිදුලක් නෑ. තියෙන ඒව දිරලා, කැඩිලා ගිහින්. වෙනත් පාසල්වල සහෝදර සහෝදරියන්ට තියෙන කිසිම පහසුකමක් අපිට නෑ. අපි දුෂ්කර ප්‍රදේශයක ඉන්න නිසා අපි ගැන කවුරුත් හොයලා බලන්නෑ. අපේ පාසලේ බිත්තිවල ලස්සනට චිත්‍ර ඇඳලා නෑ. මේ අඩුපාඩු අපිට හදලා දෙන්න කවුරුහරි ඉදිරිපත් වෙන්න.

## ළමයි 20යි
## ගුරුවරු 5යි

**මවක වූ ශිරානි දීපිකා මහත්මිය කීවේ මෙවැන්නකි.**

අපේ ගම දුෂ්කර ගම්මානයක්. ගොඩක් අය ගොවිතැන් කරලා, කුලී වැඩ කරලා ජීවත් වෙන්නේ. තියෙන අය අවට හොඳ පාසල්වලට දරුවෝ එක්කගෙන යනවා. පාසලේ අඩුපාඩු ගොඩක් තිබ්බත් අපේ දරුවෝ මේකටම එවන්න වෙලා තියෙනවා. සෙල්ලම් මිදුලක් නෑ. තිබෙන සෙල්ලම් මිදුලේ බිත්තිවලිලා කැඩිලා, දිරලා. සීසෝ, ලිස්සන බෝට්ටු අපේ දරුවන්ට නෑ. දරුවන්ට බොන්න පිරිසුදු වතුර නෑ. ෆිල්ටර් දෙකක් තිබ්බත් ඒවා කැඩිලා නඩත්තු කරන්න විශාල මුදලක් යනවා. ඒවට සල්ලි නෑ. ටැංකියක් තියාගන්න ආරක්ෂිත කුටියක් හදලා ඒකට වතුර දාගන්න තිබ්බා නම් හොඳයි. මේවට කවුරුහරි උදවු කරන්න.

අපේ පාසලට ගුරුවරු ප්‍රමාණවත්ව සිටිනවා. ඩෙස් පුටු ප්‍රමාණවත්ව ලැබෙනවා. ඒත් අනිකුත් පහසුකම් නෑ. හැම්දාම අලි පාසල් වත්තට රංචු පිටින් එනවා. පුළුවන් කෙනෙක් ඉදිරිපත් වෙලා පාසල වටේ අලි වැටක් සකස් කර දෙන්න.

**ආනන්ද උඩවඩුගෙ මහතා මෙසේ කීය**

පාසලට එන්න හොඳ පාරක් තියෙනවා. නොච්චියාගම නගරයේ සිට කිලෝමීටර් 20ක් පමණ ආවම අපේ පාසල හමු වෙනවා. පාසලේ ගුරු නිවාසයක් තිබ්බට එහි අඩුපාඩු තියෙනවා. ඒකේ නවතින්න එන්න ගුරුවරු බයයි. හවස හතර පහ වෙනකොට අලි එනවා. උදේ හත අට වෙනකන් සමහර දවස්වල අලි පාසලේ. උදේම දරුවන්ට පාසල් යන්න විදිහක් නෑ. පාසල වටේට අලි වැටක් සකස් කරලා දුන්නොත් හොඳයි.

දැන් දැන් ගොඩක් මවුපියෝ මේ පාසලට දරුවෝ ඇතුළත් නොකරන්න හේතුව අවට පහසුකම් සහිත ලොකු පාසල්. අපේ පාසලේ දරුවන් 5 ශ්‍රේණියෙන් පස්සේ ඇතුළත් කරගන්නෑ. පුළුවන් අය අවට පාසල්වලට ළමයි දානවා. බැරි අය එපානම්. පාසලේ ඉගෙන ගන්න හොඳ පරිසරය හදලා දුන්නා නම් ගමේ ළමයි ගමේ රැඳෙනවා. පාසල සංවර්ධනය කර අපේ ගමේ පාසල රැකදෙන්න කියා බලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා.

■ ඇලයාපත්තුව - කුමාර වන්නිනායක

# දේවාලේගම පාරේ කොටසක් ආඳදොළ ඔයට නාය ගිහින්
## කඩිනම් පියවරක් නොගත්තොත් ලොකු අනතුරක් අත ළඟ



මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පල්ලාවෙල විහාර මාවත හරහා දේවාලේගම මාර්ගයේ පල්ලාවෙල රාජමහා විහාරස්ථානය අසල කොටසක් කිරම ඔයේ අතු ගංගාවක් වන ආඳදොළ ඔයට නායයෑම හේතුවෙන් දැඩි අනාරක්ෂිත තත්ත්වයක් පැනනැඟී ඇති බව ප්‍රදේශවාසීහු පවසති.

පල්ලාවෙල රාජමහා විහාරස්ථානයට පැමිණෙන බැතිමතුන් ඇතුළු ගම්මාන රැසක ජනතාව සහ රථවාහන විශාල ප්‍රමාණයක් ගමන් ගන්නා එම මාර්ගයේ කොටසක් මෙලෙස නායයෑමට ලක්ව ඇත්තේ පසුගිය දිනවල පැවැති අධික වර්ෂාපතනයත් සමඟ ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙනි. ඉහත මාර්ගයේ නායයෑමට ලක්ව ඇති ස්ථානය කඩිනමින් පිළිසකර කිරීමට කටයුතු නොකළහොත් විශාල අනතුරක් සිදුවීමේ අවදානමක් පවතින බව ජනතාව පෙන්වා දෙති. ඒ සම්බන්ධයෙන් මුලටියන ප්‍රාදේශීය සභාවේ අවධානය යොමු කරන ලෙස ද ඔව්හු වැඩිදුරටත් ඉල්ලා සිටිති.

■ දෙයියන්දර - ටී. විජේසේකර


ජනතා ප්‍රශ්න කියැවෙන මහජන වේදිකාව

OnPoint

onpoint@mawbima.lk

**ගමේ/නගරයේ අඩුපාඩු 'මව්බිම'ට ලියන්න**

ඔබ පදිංචි ප්‍රදේශයේ ඔබට නිතර ඇස ගැසෙන අඩුපාඩු, පොදු දේපළ හානිකිරීම් ආදිය මෙන්ම ජනතාව පීඩාවට පත්කරන සිදුවීම් පිළිබඳව දැන් 'මව්බිම' ජනතා ප්‍රශ්න කියැවෙන මහජන යාතිකාව මඟින් අදාළ බලධාරීන්ගේ අවධානය යොමුකිරීමේ අවස්ථාව උදාවී ඇත.

සියලු විස්තර ඡායාරූපද සමඟ ඔබගේ අනන්‍යතාවද තහවුරු කරමින් සංස්කාරක On Point, සිලෝන් නිවුස්පේපර්ස් (පෞද්.) සමාගම අංක 101, රොස්මිඩ් පෙදෙස - කොළඹ 07 ලිපිනයට යොමු කරන්න.


# ගම්පොළ - පුපුරැස්ස නගරයේ වැසි ජලය යන්නේ ගෙවල් ඇතුළෙන්



ගම්පොළ, පුපුරැස්ස නගරයේ ජලය ගලා යන ක්‍රමවත් කානු පද්ධතියක් නොමැතිකමින් දැඩි වර්ෂාවත් සමඟ ගලා එන ජල පහර නිවාස තුළින් යෑම නිසා නාය අවදානමක් මතුව ඇතැයි එම නිවැසියෝ පවසති.

මෙසේ දැඩි අවදානමට ලක්ව ඇත්තේ පුපුරැස්ස සුවුමිහියම් විහාරස්ථානය අසල පදිංචිකරුවන්ගේ නිවාසයි.

ඔවුන් පවසන්නේ මෙම අවදානම පිළිබඳව වසර ගණනාවක සිට දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දේශපාලන අධිකාරියට, උඩ පළාත ප්‍රාදේශීය සභාව ඇතුළු නිලධාරීන්ට දැන්වුවද එලක් නොවූ බවය.

■ ගම්පොළ - සුරංග දිල්හාන්

# කුණ්ඩසාලේ වලල පාර වැසි දාට ජලාශයක්



මාර්ගය දෙපස පැති කානු, බෝක්කු ගොඩවී වැසී යෑම හේතුවෙන් කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වාවින්න වලල ප්‍රධාන මාර්ගය වැසි දිනවලදී ජලාශයක් බවට පත්වන බව වාවින්න ප්‍රදේශවාසීහු පවසති. පළාත් මාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කෙරෙන මෙම මාර්ගයේ පැති කානු, බෝක්කු වසර ගණනාවකින් ශුද්ධ පවිත්‍ර නොකිරීමෙන් මෙම තත්ත්වය උදාවී ඇතැයි ප්‍රදේශවාසීහු පවසති. මීට වසර කිහිපයකට පෙර රුපියල් කෝටි ගණනක වියදමින් මෙම මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමෙන් පසු මාර්ගය දෙපස කිසිදු නඩත්තු කටයුත්තක් නොවුණු බව ගම්වාසීහු පවසති. මේ වන විට මාර්ගය දෙසට ගහකොළ වැවී අතු රිකිලි පාර දෙසට නැවී පවතින අතර පාර දෙපස මානා, තණකොළ වැවී කැලෑව වැවී ඇත. එබැවින් වාහන ගමන් කරන විට මාර්ගයේ යන එන අයට පසෙකට වීමටද ඉඩක් නොමැත. මෙසේ මාර්ගයේ නිසි නඩත්තුවක් නොමැතිකමෙන් ධාරානිපාත වැස්සට මාර්ගය වැසි ජලයෙන් යටවන අතර මාර්ගය දෙපසින් ගලා එන ජලය මාර්ගය දිගේ ගලා ඒමෙන් මාර්ගය අසල නිවෙස්වලට ද හානි සිදුවන බව දෙපස පදිංචිකරුවෝ පවසති.

එසේම කෝටි ගණනක් වැය කොට සංවර්ධනය කරන මාර්ගයටද ජලය ගලා ඒමෙන් හානි සිදුවන අතර, මාර්ගයේ ඇතැම් ස්ථාන හිලා බැසීමේ හා ඉරි තැලීමේ ලක්ෂණ පෙන්නුම් කරන බවද ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.

■ වත්තේගම - එස්.එන්. විමලසිරි

# වැහැර නාගරික වෙළෙඳ සංකීර්ණයේ
## එළියෙත් ගස් - ඇතුළෙත් ගස්



කුරුණෑගල නගර සභාව විසින් රුපියල් කෝටි ගණනක් වැය කරමින් ඉදිකර ඇති 'වැහැර නාගරික වෙළෙඳ සංකීර්ණය' නමැති ගොඩනැඟිලි සංකීර්ණයේ මේ වනවිට බිත්ති මත ගස් වැවී බිත්ති පුපුරා ගොස් ඇති අතර වැසිකිළි පද්ධතිවලට පවා මුල් බැස ඇති බව ප්‍රදේශවාසීහු පවසති.

මෙම ගොඩනැඟිල්ලේ පවත්වාගෙන ගිය සතොස ආයතනය ද ඉවත් කරගනු ලැබූයේ මෙම ගස් ඉවත් කර අලුත්වැඩියා කටයුතු කර නොදුන් නිසාය.

එයින් නගර සභාවට මාසිකව ලැබිය යුතු රුපියල් ලක්ෂ හතරකට ආසන්න මුදලක් අහිමි වූ අතර දැනට එම ගොඩනැඟිල්ල අභාවයට යෑමට ඉඩ හැර ඇති අතර එම ගස් වසර ගණනක පමණ කාලයක සිට කපා ඉවත් කිරීමට කටයුතු කර නැති බවත් ඔවුහු පවසති.

■ මාවතගම - ආනන්ද විජේතිලක

# මාරක අනතුරකට අත වනන පනාපිටිය මංසන්ධියේ බෑවුම

කහවත්ත - ගබ්බෙල මාර්ගයේ පනාපිටිය මංසන්ධිය ආසන්නයේ පිහිටි බෑවුම් කොටස දැඩි ලෙස අබලන්වී ඇති හෙයින් විශාල අනතුරක් සිදු විය හැකි බව ප්‍රදේශයේ ජනතාව පෙන්වා දෙති.

ගබ්බෙල සිට අම්බලන්වත්ත දක්වා මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කළ අතර ඉන් කොටසක වැඩ මේ වනවිට නිම කර ඇත. කලල්ඇල්ල සිට අම්බලන්වත්ත මාර්ගයේද එක් කොටසක් පිළිසකර කර තිබේ.

එහෙත් අඩි එකසිය පනහක් වැනි මෙම අබලන් කොටස දැනට වසර ගණනාවක් තිස්සේ පවතින්නේ මෙම තත්ත්වයෙනි.

විශාල බෑවුමක් සහිත ස්ථානයක් වන මෙම ස්ථානයේ අනතුරක් සිදුවුවහොත් විශාල ජීවිත ගණනක ජීවිත අවදානමක්ද පවතින බව ජනතාව පෙන්වා දෙති.

ගබ්බෙල, දෙම්ටහැත්ත, ගැඩුම්වෙල ආදී ප්‍රදේශවල සිට කහවත්ත, කලල්ඇල්ල, පනාපිටිය වැනි පාසල්වලට දරුවෝ විශාල පිරිසක් මෙම මාර්ගයෙන් ගමන් ගනිති. මෙම ප්‍රදේශයේ තේ ඉඩම් බහුලව පිහිටා ඇති අතර අමු තේ දලු ප්‍රවාහනය කරන ලොරි දහයකට අධික ප්‍රමාණයක් දිනකට ගමන් කරයි. මාදම්පේ - රක්වාන මාර්ගයේ සිට කලල්ඇල්ල හරහා මෙම මාර්ගය භාවිත කරමින් නිවිතිගල, කලවාන වැනි දුර බැහැර ප්‍රදේශ දක්වාද ගමන් කළ හැකි කෙටිම මාර්ගයද මෙයයි.

කහවත්ත සිට ගබ්බෙල දක්වා බස් රථ තුනක් මෙම මාර්ගයේ ගමන් ගන්නා අතර මෙම ස්ථානය දැඩි අනතුරුදායක බව බස් රථ රියැදුරෝ පෙන්වා දෙති. වංගුවක් සහිත මෙම අබලන් ස්ථානය නිසා වාහන නිරන්තරයෙන් ආපදාවට ලක් වෙයි. කඩිනමින් මෙම ස්ථානය පිළිසකර කර දෙන ලෙස අදාළ ආයතනවලින් ඉල්ලා සිටී.



■ අවකලන්පන්නේ - තරිඳු උදයශාන්ත

# දින දින තැන තැන

## පොලිස් ශිෂ්‍ය භට තෑග ප්‍රදානෝත්සවය කළුතර පොලිස් විදුහලේදී



2023 පොලිස්පති කුසලාන පොලිස් ශිෂ්‍ය භට කඳවුරේ තෑග ප්‍රදානෝත්සවය මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශාන් ගුණතිලකගේ ප්‍රධානත්වයෙන් කළුතර පොලිස් විද්‍යාලයේදී පැවැත්විණි.

2023 පොලිස්පති කුසලාන ජාතික ශිෂ්‍ය භට කඳවුර දින 7ක් පුරා කළුතර පොලිස් විද්‍යාලයේ පැවැති අතර ශ්‍රී ලංකාවේ පළාත් 9 නියෝජනය කරමින් පාසල් 49ක පොලිස් ශිෂ්‍ය භට බාලක බාලිකාවෝ 1,225ක් ඊට සහභාගි වූහ.

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශාන් ගුණතිලකගේ ප්‍රධානත්වයෙන් පැවැති කඳවුරේ සමාප්ති උළෙලට නි. පොලිස්පති චන්දන වික්‍රමරත්න ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්, ශිෂ්‍ය භට බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු සම්භාවනීය අමුත්තෝ රැසක් එක්ව සිටියහ.

උත්සවයේ අති දක්ෂතම බාලක ශිෂ්‍ය භට බණ්ඩය ලෙස මාතලේ ශාන්ත තෝමස් විද්‍යාලය තේරී ඇති අතර අති දක්ෂම බාලිකා ශිෂ්‍ය භට බණ්ඩය ලෙස කුලියාපිටිය සුරදූත බාලිකා විද්‍යාලය තේරී පොලිස්පති කුසලානය හිමි කර ගත්හ.

## ජාතීන් අතර සුහදත්වයට 21දා මාවනැල්ලේදී වැඩසටහනක්

**උඩුගොඩ – ඒ. නරසිංහ**

ජාතීන් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් විවිධ ජාතීන්, විවිධ ආගම් අතර සංහිඳියාව පිළිබඳව වැඩසටහනක් මෙම මස 21 වැනි දින මාවනැල්ලේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බව කෑගල්ල දිස්ත්‍රික් අන්තර් ආගමික කමිටුව පවසයි.

එදින මාවනැල්ල, මෙනේරිගම මහා විද්‍යාලේදී මෙම වැඩසටහන පෙරවරු 9.30ට ආරම්භ කෙරෙන අතර මේ සඳහා මාවනැල්ල, අරණායක හා රඹුක්කන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් තරුණ තරුණියන් සියදෙනකු සහභාගි වීමට නියමිතය.

## කොස්ගම සුබසෙත සෙවණේ දරුවන්ට දිවා ආහාරයක්



අවිස්සාවේල්ල, පොන්නිවත්තේ පදිංචි පී.එම්. සැටිල්ඩා මෙනෙවියට මුල් දිවයිනටම සාම විනිසුරු පදවිය ලැබීම නිමිති කරගෙන ඇයගේ පවුලේ සාමාජිකයන් විසින් කොස්ගම 'සර්වෝදය සුබසෙත සෙවණේ' දරුවන්ට දිවා ආහාර වේලක් ලබාදෙනු ලැබීය.

## පිටිගල ගංගාතිලක පිරිවෙන 60 වැනි සංවත්සරය සමරයි



පිටිගල ගංගාතිලක පිරිවෙනේ 60 වැනි සංවත්සරය හා පොල්දූගොඩ ශ්‍රී රේවත නාහිමි අනු දෙවැනි වස් සපිරි ආසිරි පැතීමේ මහෝත්සවය හෙට (20දා) දින දවස පුරා පිටිගල ගංගාතිලක පිරිවෙන් විහාරස්ථානයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. පෙරවරු 8.30ට සංවත්සර මහෝත්සවය ආරම්භ වේ. ස්වාධීන රූපවාහිනී සේවයේ ජනප්‍රිය නිවේදක ආචාර්ය හසන්ත හෙට්ටිආරච්චි මහතාගේ විශේෂ දේශනයක්ද, රාත්‍රී 7.00ට ගුවන්විදුලි ධර්ම දේශක පිටිගල ධම්මවිනීත නාහිමියන්ගේ ධර්ම දේශනයක්ද පැවැත්වීමට නියමිතය.

## අපේක්ෂා රෝහලේ රෝගීන්ට ලේ දන්දීමක් පමුණුවිලදී




**බියගම - කේ. දුමින්ද, දෙල්ගොඩ - බිහඳු විතුවර**

මහරගම අපේක්ෂා රෝහලේ ප්‍රතිකාර ලබන නේවාසික රෝගීන්ට අවශ්‍ය වන ලේ ලබාදීම සඳහා දෙවැනි වරටත් සංවිධානය කළ ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් සෙනසුරාදා (14දා) පමුණුවිල, විලශේන සිරි සාරියප්පෙරුම විහාරස්ථානයේදී පවත්වන ලදී.

එහි විහාරාධිපති ශාස්ත්‍රපති අගරුවේ ශාස්ත්‍රවේදී මොරටුවේ භද්දසිරි හිමියන්ගේ ජන්ම දිනයට සමගාමීව සමාජ සේවක ඉන්දික ඇතුළු පමුණුවිල තරුණ කැල විසින් මෙය සංවිධානය කරනු ලැබීය.

## වතුකරයට වසර දෙසීයයි
## වයිකුඹුරේ ළමා හා සමාජ සංවර්ධන වැඩසටහනක්



**ස්ප්‍රිංවැලි - සුනිමල් ශ්‍රියානන්ද**

වතුකර ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර දෙසීයක් සපිරෙන මෙම වසරේ මොනරාගල දිස්ත්‍රික් අන්තර් ආගමික කමිටුව විසින් සිවු අවුරුදු ළමා හා සමාජ සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් සඳහා බඩල්කුඹුර, වයිකුඹුර වතු ආශ්‍රිත ගම්මානය තෝරාගෙන ඇති බව එහි දිස්ත්‍රික් සම්බන්ධීකාරක ධම්මික ලක්ෂ්මන් සමරජීව පවසයි.

මෙහිදී, ළදරුවන් සඳහා සුවිශේෂී පෝෂණ වැඩසටහනක් කඩිනමින් ක්‍රියාත්මක කරමින්ද, බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව මඟින් වැසී ගොස් ඇති ළදරු පාසල යළි පවත්වාගෙන යෑමටද තීරණය කෙරිණි.

# ලොතරැයි ප්‍රතිඵල

**සසිරි** 10-10-2023 — 03 05 12 — දිනුම් වාරය 0387

**ශනිදා වාසනාව** 18-10-2023 — S 07 17 23 55 — දිනුම් වාරය 4406 — 35055

**ලග්න වාසනාව** 18-10-2023 — 14 16 32 34 — දිනුම් වාරය 3957 — 674447 178

**සුපර් බෝල්** 18-10-2023 — M 33 56 62 65 — දිනුම් වාරය 2245

**අද කෝටිපති** 18-10-2023 — Y 02 22 40 66 — දිනුම් වාරය 2071 — 599855

**කප්රුක** 18-10-2023 — W 20 22 32 36 20 — දිනුම් වාරය 1421 — 688232 103

**ජයෝදා** 18-10-2023 — N 18 32 47 66 — දිනුම් වාරය 1966

**හඳහන** 17-10-2023 — 01 02 29 54 — දිනුම් වාරය 579

**මහජන සම්පත** 17-10-2023 — D 9 9 4 5 5 2 — දිනුම් වාරය 5270

**ගොවිසෙත** 17-10-2023 — E 17 20 28 52 E — දිනුම් වාරය 3512 — 51436

**මෙගා පවර්** 17-10-2023 — F 1 1 4 6 5 8 24 — දිනුම් වාරය 1618 — 19218

**ලකී 7** 17-10-2023 — 1 1 4 6 5 8 27 — දිනුම් වාරය 0096

**ධන නිධානය** 17-10-2023 — I 10 14 45 70 I — දිනුම් වාරය 1300 — 15763

**ජාතික සම්පත** 05-07-2023 — 8 0 6 6 0 0 — දිනුම් වාරය 1621

**සංවර්ධන වාසනාව** 28-09-2023 — Q 31 36 63 04 — දිනුම් වාරය 0632

# අකුරු කරවන තැනත් හොරකමට හුරුවෙලා, ණයට ඉල්ලන් ආපු ගිටාරය උස්සලා

මහියංගණය, ආදාළුප්පත ජාතික පාසලෙන් 2023 පළාත් පාසල් සංගීත තරගාවලිය සඳහා ගිය සිසුවියකගේ ගිටාරයක් වෙනත් පාසලකින් පැමිණි සිසුවකු විසින් සොරාගෙන ගොස් ඇතැයි වාර්තා වේ.

වාර්තා වන අන්දමට සිද්ධිය මෙසේය. 2023 ඌව පළාත් පාසල් සංගීත තරගාවලිය ඉකුත් 30 දා හාලිඇළ මහා විද්‍යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ඒ සඳහා දිස්ත්‍රික් සංගීත තරගවලින් ජය ගත් ආදාළුප්පත පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කණ්ඩායමක් සිය සංගීත ගුරුතුමියන් සමඟ ගොස් ඇත.

තම වාරය එන තුරු ගෙනගිය සංගීත භාණ්ඩ මේසයක් මත තබා ආරක්ෂාවට සිසුවියක්ද නතර කොට අනෙක් අය අභ්‍යවශ්‍ය වුවමනාවකට පිටත ගොස් තිබේ.

ඒ වනවිට වෙනත් පාසල්වලින් පැමිණි ශිෂ්‍ය කණ්ඩායම්ද එම ශාලාවේ රැඳී සිට ඇත.

සුළු වේලාවකින් ආරක්ෂාවට සිටි සිසුවියට හිසේ කැක්කුමක් ඇතිවීම නිසා මේසය මත ඔළුව ගසාගෙන තිබේ.

පිටත ගිය අය පැමිණ තරගයට යෑමට සූදානම්ව බලද්දී ගිටාරය නොමැති බව පෙනී ගොස් ඇත.

පසුව සංවිධායක මණ්ඩලයටද පවසා ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ද දන්වා සොයා බැලුවද පලක් වී නැත.

මෙම ගිටාරය ආදාළුප්පත ජාතික පාසලේ සංගීත ගුරුතුමිය විසින් වෙනත් පාසලක ගුරුවරියකගෙන් ඉල්ලාගෙන ආ එකක් වන අතර එය රුපියල් 55,000ක් වැනි අලුත් එකක් බවත්, ඒ සා විශාල මුදලක් සොයා ගැනීම තමන්ට සිහිනයක් බවත් ගිටාරය ලබාගත් සිසුවිය පවසයි. ගුරුතුමිය පවසන්නේ ද තමන්ගේ තත්ත්වය ද එසේම බවය.



මෙය සොරාගෙන ගොස් ඇත්තේ තවත් පාසලක සිසුවකු හෝ සිසුවියක විය යුතු බවත්, එසේනම් ඒ බව එදින ඔවුන් සමඟ පැමිණි ගුරුවරුන් නොදැන සිටියේ දැයි මෙම සිද්ධිය පිළිබඳව පැවසූ ගුරුවරු පිරිසක් විමසා සිටියහ.

■ අම්පාර - එම්. පී. රවීන්ද්‍ර

# ගුවන් මගියාගෙන් රත්රන් ජෙල් පැකට් ගත් පොලිසියේ දෙදෙනෙක් අත්අඩංගුවට

■ කටුනායක - ටී. කේ. ජී. කපිල

ඩුබායි බලා ගුවන්ගත වීමට පැමිණි ගුවන් මගියකුගෙන් රුපියල් එක් කෝටි පනස් ලක්ෂයක් පමණ වටිනා රත්රන් මිශ්‍ර ජෙල් පැකට් දෙකක් ලබාගත් කටුනායක ගුවන් තොටුපොළට අනුයුක්ත කර සිටි සංචාරක පොලිස් කොට්ඨාසයේ සැරයන්වරු දෙදෙනකු ගුවන් තොටුපොළ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ කිඹුලපිටිය ප්‍රදේශයේ පදිංචි 50 හැවිරිදි සහ මුණමල්දෙණිය ප්‍රදේශයේ පදිංචි 36 හැවිරිදි පොලිස් සැරයන්වරු දෙදෙනෙකි.

පෙරේදා (17දා) උදෑසන 11.00ට පමණ නාත්තණ්ඩිය ප්‍රදේශයේ පදිංචි 30 හැවිරිදි ව්‍යාපාරිකයකු ඩුබායි බලා පිටත්ව යෑම සඳහා කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ තිබේ.

එහිදී කටුනායක ගුවන් තොටුපොළ ආශ්‍රිතව රාජකාරි කිරීම සඳහා සංචාරක පොලිස් කොට්ඨාසයට අනුබද්ධිත සැරයන්වරු දෙදෙනා විසින් මෙම ගුවන් මගියා සන්තකයේ තිබූ ග්‍රෑම් 634ක් පමණ බරැති මෙම රත්රන් මිශ්‍ර ජෙල් පැකට් දෙක ලබා ගෙන තිබිණි.

මෙම සිදුවීමෙන් පසු මෙම ගුවන් මගියා සිය ගුවන් ගමන අතහැර, කටුනායක ගුවන් තොටුපොළ පොලිසිය වෙත පැමිණ, මේ පිළිබඳව පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ.

ඒ අනුව ක්‍රියාත්මක වූ කටුනායක ගුවන් තොටුපොළ පොලිසිය වහාම ගුවන් තොටුපොළ වෙත ගොස් මෙම පොලිස් සැරයන්වරු දෙදෙනා සහ ඔවුන් ලබාගත් රත්රන් මිශ්‍ර ජෙල් පැකට් දෙක අත්අඩංගුවට ගෙන තිබේ.

මීගමුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අනුරුද්ධ බණ්ඩාරනායකගේ උපදෙස් පරිදි කටුනායක ගුවන් තොටුපොළ පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මැල්කම් පේජ්ගේ අධීක්ෂණය යටතේ උප පොලිස් පරීක්ෂක චන්දන, පොලිස් සැරයන් උපුල් (72059) සහ පොලිස් කොස්තාපල් දිලන්ත (85188) යන නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ සිදු කරති.

මොවුන් දෙදෙනා 18 දින මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

# රියට හසුවී මිය ගිය අය මඟ දමා පලා ගිය රියැදුරු 31දා තෙක් රිමාන්ඩ්

■ දඹුලුපොළ - චමින්ද ජයලත්

කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයේ කෑගල්ල බල්ලපාන ප්‍රදේශයේ දී පුද්ගලයකු අනතුරකට ලක් කර මිය යෑමෙන් පසුව දේහය රෝහල් ගත නොකොට පලා ගිය කාර් රථයේ රියැදුරු තවදුරටත් ඔක්තෝබර් 31 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කෑගල්ල මහෙස්ත්‍රාත් වාසනා නවරත්න පෙරේදා (17දා) නියෝග කළාය.

මෙලෙස තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත්තේ කෑගල්ල මාදෙයියාව පාම් වත්තේ පදිංචිව සිටින පුස්පනේ ගල්ලත් රාලලාගේ උපාලි බණ්ඩාර ගමිලත් නැමැති 52 හැවිරිදි පුද්ගලයෙකි.

රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති පුද්ගලයා කලක සිට කෑගල්ල නගරයේ කුලී පදනම මත ලබාදෙන වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යන අතර ඉකුත් සැප්තැම්බර් 20 වැනිදා කෑගල්ල පිටිහුම ප්‍රදේශයේ පදිංචිව සිටින ටෙලිකොම් ආයතනයේ විශ්‍රාමික නිලධාරිනියකට අයත් ඇල්ටෝ වර්ගයේ කාර් රථයක් දිනකට රුපියල් 3000ක් ගෙවන පොරොන්දු මත සැකකරු භාරයට ගෙන ඇති බව පොලිසිය පැවැසීය.

පසුව කාර් රථය 21 වැනිදා වරකාපොළ ප්‍රදේශයේ පදිංචිව සිටින පුද්ගලයකුට දින දෙකක කුලී පදනම මත ලබාදී ඇති අතර කාර් රථය ගත් පුද්ගලයා දින දෙක ගත කර ආපසු සැකකරුට භාරදී නොමැත. කාර් රථය යතුර සහිතව වරකාපොළ විකල්ප මාර්ගයේ දමා ගොස් ඇති බවට සැකකරුට ලද තොරතුරකට අනුව 24 වැනිදා කාර් රථය රැගෙන කෑගල්ල බලා ධාවනය කරමින් සිටියදී රාත්‍රී 9.45 ට පමණ බල්ලපාන ප්‍රදේශයේ දී කාර් රථයේ ඉදිරිපස 76 හැවිරිදි කුරුණෑගල මාවදලුපොත 8 වැනි පටුමඟ අංක 810/28 ලිපිනයේ පදිංචිව සිටි නාරායන දිසානායක මුදියන්සේලාගේ ආනන්ද කළුබමලේ නැමැති තිදරු පියා ගැටී මීටර් 10 ක් පමණ දුරට විසි වී ඇති බවත් පොලිසිය පැවැසීය.



පසුව සැකකරු කාර් රථයේ ගැටුණු පුද්ගලයා කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගයේ වැටී සිටියදී ඔහු ගැන සොයා බලා රෝහල් ගත කිරීමට කටයුතු සිදු නොකර කෑගල්ල දෙසට ධාවනය කර ඇති බවත් පොලිසිය පැවැසීය. පසුව තුවාලකරු කෑගල්ල මූලස්ථාන පොලිසියේ රථවාහන අංශයේ නිලධාරීන් දෙදෙනකු විසින් කෑගල්ල මහ රෝහලට ඇතුළත් කර ඇති අතර ඒ වෙන කොටත් තුවාලකරු මිය ගොස් තිබිණි.

පසුව සැකකරු කාර් රථයට සිදුව තිබුණු දැඩි අලාභහානි අලුත්වැඩියා කිරීමට ගලපිටමඩ ප්‍රදේශයේ ගරාජයකට දමා තිබේ.

පසුව මරණය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරන ලද පොලිසිය සී.සී.ටී.වී. කැමරා දින ගණනාවක් පරීක්ෂා කර පළමුව කාර් රථය ගලපිටමඩ ගරාජයක තිබියදී අත්අඩංගුවට ගෙන ගරාජයේ හිමිකරුගේ තොරතුරු මත සැකකරු ඔක්තෝබර් 01 අත්අඩංගුවට ගෙන 02 වැනිදා කෑගල්ල අධිකරණයට ඉදිරිපත් කෙරිණ. එහිදී සැකකරු පෙරේදා 17 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණ. පෙරේදා 17 වැනිදා නඩුව කැඳවූ අවස්ථාවේදී පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි කෑගල්ල මූලස්ථාන පොලිසියේ රථවාහන අංශයේ උප පොලිස් පරීක්ෂක සරත් ජයසුන්දර මහතා කියා සිටියේ අනතුර සම්බන්ධයෙන් සියලු විමර්ශන කටයුතු මේ වන විට පොලිසිය විසින් අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත් සැකකරු සම්බන්ධයෙන් සුදුසු නියෝගයක් නිකුත් කරන ලෙසත් සැකකරුගේ රියැදුරු බලපත්‍රය අත්හිටුවන ලෙස නියෝගයක් නිකුත් කරන ලෙසත් ඉල්ලීමක් කළේය. සැකකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ රංජිත් සේනාධීර මහතා කරුණු දක්වමින් කියා සිටියේ අනතුර සම්බන්ධයෙන් සියලුම කරුණු පොලිසිය සොයාගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත් ඕනෑම ඇප කොන්දේසියක් යටතේ සැකකරුට ඇප ලබාදෙන ලෙසත් ඉල්ලීමක් කළේය.

දෙපාර්ශ්වයේ කරුණු සැලකිල්ලට ගත් මහෙස්ත්‍රාත්වරිය සැකකරුගේ රියැදුරු බලපත්‍රය නඩුව අවසන් වෙන තෙක් අත්හිටුවන ලෙසත් ඔක්තෝබර් 31 වැනිදා දක්වා තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙසත් නියෝග කළාය.

කෑගල්ල මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නාලක මාගෙදරගමගේ උපදෙස් පරිදි රථවාහන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සාගර මාවඩවිලගේ, උප පොලිස් පරීක්ෂක සරත් ජයසුන්දර අධිකරණයේ පෙනී සිටියහ.

## විනිමය අනුපාත

2023.10.18

| විනිමමුදල් වර්ගය | ගැනුම් අනුපාතය | විකුණුම් අනුපාතය |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් | 201.5420 | 211.9753 |
| කැනේඩියානු ඩොලර් | 232.2715 | 243.3253 |
| චීන යුවාන් (රෙන්මින්බි) | 42.8472 | 45.7302 |
| යූරෝ | 335.5314 | 350.6119 |
| ජපන් යෙන් | 2.1229 | 2.2140 |
| සිංගප්පූරු ඩොලර් | 231.5817 | 242.4286 |
| ස්ටර්ලිං පවුම් | 386.8943 | 402.9917 |
| ස්විස් ෆ්‍රෑන්ක් | 351.7908 | 369.6685 |
| ඇ.එක්සත් ජනපද ඩොලර් | 318.9233 | 329.5430 |

| රට | මුදල් වර්ගය | අනුරූපිත අනුපාතිකය |
|---|---|---|
| බහරේනය | බහරේන් ඩිනාර් | 860.6896 |
| කුවේට් | කුවේට් ඩිනාර් | 1,047.7960 |
| ඕමානය | ඕමාන් රියාල් | 841.9656 |
| කටාර් | කටාර් රියාල් | 88.8981 |
| සවුදි අරාබිය ෙ | සෞදි අරාබි රියාල් | 88.8981 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | එ.අ.එ.රා ඩිරාම් | 88.2506 |

## දෛනික ආහාර මිල ගණන්

2023.10.18

| වර්ගය | පෑලියගොඩ වෙළඳපොළ | දඹුල්ල වෙළඳපොළ | මීගොඩ වෙළඳපොළ | වේයන්ගොඩ වෙළඳපොළ |
|---|---|---|---|---|
| උඩරට එළවළු | මිල පරාසය/රු. | | | |
| බෝංචි | 300-350 | 300-350 | 300-350 | 300-350 |
| කැරට් | 130-150 | 130-150 | 130-150 | 130-150 |
| ලීක්ස් | 55-60 | 55-60 | 55-60 | 55-60 |
| බීට්රූට් | 80-100 | 80-100 | 80-100 | 80-100 |
| ගෝවා | 35-80 | 35-80 | 35-80 | 35-80 |
| සැස්කාලි | 120-130 | 120-130 | 120-130 | 120-130 |
| පහතරට එළවළු | මිල පරාසය/රු. | | | |
| වම්බටු | 150-200 | 150-200 | 150-200 | 150-200 |
| මාළු මිරිස් | 300-350 | 300-350 | 300-350 | 300-350 |
| වට්ටක්කා | 50-60 | 50-60 | 50-60 | 50-60 |
| අමු මිරිස් | 280-350 | 280-350 | 280-350 | 280-350 |
| දෙහි | 1300-1400 | 1300-1400 | 1300-1400 | 1300-1400 |
| අර්තාපල් (ආනයනික) | 190-200 | 190-200 | 190-200 | 190-200 |
| අර්තාපල් (නුවරඑළිය) | 190-200 | 190-200 | 190-200 | 190-200 |
| අර්තාපල් (වෙල්ලවාය) | 210-220 | 210-220 | 210-220 | 210-220 |
| ලොකු ළූණු (ආනයනික) | 120-220 | 120-220 | 120-220 | 120-220 |

# පාස්කු ඉරු දින ප්‍රහාර නඩුවේ ඉබ්‍රහිම්ට පනවා තිබූ ඇප කොන්දේසියක් ලිහිල් වෙයි

## මාස්පතා CID යෑම තුන් මසකට වරක්

■ හංසි නානායක්කාර

පාස්කු ඉරුදින ෂැංග්‍රිලා සහ සිනමන් ග්‍රෑන්ඩ් හෝටල්වලට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කළ ස්වයං ඝාතක ඉන්සාෆ් අහමඩ් හා ඉල්හාම් අහමඩ් යන බෝම්බකරුවන්ගේ පියා වන කෝටිපති ව්‍යාපාරික මොහොමඩ් ඉබ්‍රාහිම් යන අයට පනවා තිබුණු ඇප කොන්දේසියක් ලිහිල් කිරීමට කොළඹ මහාධිකරණ විනිසුරු නවරත්න මාරසිංහ ඊයේ (18දා) නියෝග කළේය.

තම සේවාදායකයා ඉතා වයෝවෘද්ධ වන බැවින් ඔහු මේ වන විට ගමන් ගන්නේ රෝද පුටුවක බවත් 2022 මාර්තු මස 25 වැනි දින ඇප මත මුදා හැරීමේදී මහාධිකරණය විසින් සෑම මසකම අවසන් ඉරුදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටින ලෙසට පනවා ඇති ඇප කොන්දේසිය ලිහිල් කරන ලෙස විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

එම ඉල්ලීම සලකා බැලූ විනිසුරුවරයා සෑම මාස තුනකට වරක් අවසන් ඉරුදින පෙරවරුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටින ලෙසට නව කොන්දේසිය පනවනු ලැබීය.

මෙම විත්තිකරු ඇතුළු විත්තිකරුවන් නිදෙනාගේම ජායාරූප වාර්තාවක් මෙම නඩුවේ විභාගය සඳහා නීතිපතිවරයා විසින් අධිකරණයට ඉදිරිපත් කර සිටියේය.

මේ සම්බන්ධයෙන් විත්තියේ විරෝධතා ඇත්නම් ඒවා ලබන මස 7 වැනි දින ගොනු කරන ලෙසත් ප්‍රති විරෝධතා ඇත්නම් ඒවා නොවැම්බර් මස 20 වැනි දින ගොනු කරන ලෙසත් විනිසුරුවරයා දින නියම කළේය.

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට සහ ඒ හරහා ජාතිවාදී කෝලාහල ඇති විය හැකි බවට තොරතුරු දැනගනිමින් ඒ පිළිබඳව පොලිස් නිලධාරියකුට දැනුම් නොදී තොරතුරු වසන් කළැයි කියන සිද්ධිය සම්බන්ධයෙන් විත්තිකරුවන්ට එරෙහිව මෙම නඩුව කොළඹ මහාධිකරණය හමුවේ ගොනුකර තිබිණි.

කෝටිපති ව්‍යාපාරික මොහොමඩ් ඉබ්‍රාහිම්, ඉජාස් අහමඩ් හා ඉස්මයිල් අහමඩ් යන්න විත්තිකරුවන්ට එරෙහිව නීතිපතිවරයා විසින් අධි චෝදනා ගොනු කර තිබිණි.

2019 වසරේ අප්‍රේල් මස 21 වැනි පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට සහ ඒ හරහා ජාතිවාදී කෝලාහල ඇති විය හැකි බවට තොරතුරු දැනගනිමින් ඒ පිළිබඳව පොලිස් නිලධාරියකුට දැනුම් නොදී තොරතුරු වසන් කිරීම තුළින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදක් සිදු කළේ යැයි චෝදනා කොට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා දණ්ඩ නීති සංග්‍රහයේ පනත් ප්‍රකාරව අධි චෝදනා දෙකක් යටතේ නීතිපතිවරයා විසින් කෝටිපති ව්‍යාපාරික මොහොමඩ් ඉබ්‍රාහිම් ඇතුළු විත්තිකරුවන් තුන් දෙනාට එරෙහිව මෙම නඩුව ගොනුකර තිබිණි.

# හොරෙන් ගෙනගිය තේක්ක කොටන් 30ක් සමඟ පුද්ගලයෙක් වාද්දුවේදී අත්අඩංගුවට

■ පොතුපිටිය - සුමිත් රණවක

බලපත් රහිත තේක්ක කොටන් 30ක් ලොරි රථයකින් නීති විරෝධී අන්දමින් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයකු පෙරේදා (17දා) පස්වරුවේ අත්අඩංගුවට ගැනීමට වාද්දුව පොලිසිය සමත්ව ඇත.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ මහ වාද්දුව, වාද්දුව ප්‍රදේශයේ පදිංචි 47 හැවිරිදි පුද්ගලයකු බව පොලිසිය කීය.

රථවාහන ජංගම රාජකාරියේදී සිටි සැරයන් උපුල් කුමාර යන නිලධාරීට ලද තොරතුරක් මත වාද්දුව-මොරොන්තුඩුව මාර්ගයේදී අඩි 4 සිට 12 දක්වා දිග කොටන් තොගය සමඟ ලොරි රථය භාරයට ගෙන සැකකරු අත්අඩංගුවට ගත් බව පොලිසිය කීය.

සැකකරු පානදුර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.



පානදුර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමන්ත වෙදගේ සහ සහකාර පොලිස් අධිකාරී කමල් ජයනෙත්ති යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි ස්ථානාධිපති (වැඩ) පොලිස් පරීක්ෂක ශයාන් කහටපිටිය මහතාගේ උපදෙස් පරිදි සැරයන් උපුල් කුමාර (41133) සහ කොස්තාපල් ලක්සාන් (101793) වැටලීමට එක්වූහ.

## උතුරු මැද පළාතේ ආයුර්වේද කොමසාරිස්ට ඇසිඩ් ගැසීමේ සිද්ධිය

# මැදවච්චිය පොලිස් ස්ථානාධිපතිගේ සාක්ෂියට දුරකථන වාර්තා යොදා ගැනීම තහනම්

■ අනුරාධපුර - උපාලි ආනන්ද කරුණාදාස

උතුරු මැද පළාත් ආයුර්වේද කොමසාරිස් වෛද්‍ය තුෂාර අල්විස්ට අනුරාධපුරයේ පිහිටි ඒ මහතාගේ නිල නිවෙසේදී ඇසිඩ් ප්‍රහාරයක් එල්ල කර එක් ඇසක් අන්ධ කර අනෙක් ඇසට, මුහුණට සහ ශරීරයේ ස්ථාන රැසකට බරපතළ තුවාල සිදු කිරීමේ සිද්ධියට අදාළ නඩුවට ආයුර්වේද වෛද්‍යවරයා ඇතුළු විත්තිකරුවන්ගේ දුරකථන විශ්ලේෂණ වාර්තා පදනම් කර ගනිමින් සාක්ෂි ලබාදීමට මැදවච්චිය පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර්.එම්.අයි.පී. රත්නායක මහතාට අධිකරණයේ අවසරය ලබාදිය නොහැකි බවට අනුරාධපුර මහාධිකරණ විනිසුරු විශ්‍රාන්ත ශ්‍රීනාත් ගුණසේකර මහතා තීන්දු කළේය. එසේ තීන්දු කළේ මෙම සිද්ධියට අදාළ නඩුව අනුරාධපුර මහාධිකරණය හමුවේ යළි කැඳවූ අවස්ථාවේදීය.

උතුරු මැද පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාට ඇසිඩ් ප්‍රහාරයක් එල්ල කර එක් ඇසක් අන්ධ කර මුහුණට, ඇස්වලට සහ ශරීරයේ තවත් ස්ථාන කිහිපයකට බරපතළ තුවාල සිදු කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් අනුරාධපුර මහාධිකරණය හමුවේ අධි චෝදනා ලබා සිටින පළමු විත්තිකාර ආයුර්වේද වෛද්‍යවරයා ඇතුළු විත්තිකරුවන්ට ඔක්තෝබර් මස 9 වැනි දින යළි මහාධිකරණය හමුවේ පෙනී සිටින ලෙසට මහාධිකරණ විනිසුරුවරයා නියෝග කළේය.

උතුරු මැද පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාට ඇසිඩ් ප්‍රහාරයක් එල්ල කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් අනුරාධපුර මහාධිකරණය හමුවේ අධිචෝදනා ලබා සිටින්නේ මින්නේරිය - හබරණ පාර මෛත්‍රීපුර ලිපිනයේ ආයුර්වේද වෛද්‍යවරයකු වන සුසිරි වික්‍රමසිංහ, මින්නේරිය, රජඇළ, අංක 161/2 ලිපිනයේ හිටපු යුද හමුදා සෙබළකු වන නුවන් කුමාර සහ වතුරගම, ගලබඩ, අංක 304 ලිපිනයේ පදිංචි මාළු වෙළෙන්දකු වන ඩබ්.ඒ. කෝසිත හශාන් යන විත්තිකරුවන්ය.

Sports




ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය

# නෙදර්ලන්ත පිලට එක්වූ අප්‍රිකානුවන් තිදෙනකු අප්‍රිකානුවන්ගේ බලය බිඳිති

## ශ්‍රී ලංකා-නෙදර්ලන්ත තරගයට මහේල නැහැ

## ප්‍රසාද ලකුණු සටහනේ නෙදර්ලන්තය 9 ශ්‍රී ලංකාව 10

ඉන්දියාවේදී පැවැත්වෙන මෙවර එක්දින ලෝක කුසලානයේදී වඩාත් පෙරළිකාරතම ජයක් හිමිකර ගැනීමට නෙදර්ලන්ත කණ්ඩායම පෙරේදා (17දා) රාත්‍රියේ ධර්මසාලාහිදී සමත් විය.

එහිදී දකුණු අප්‍රිකානු කණ්ඩායමට එරෙහිව ලකුණු 38ක පෙරළිකාර ජයක් වාර්තා කර ගැනීමට නෙදර්ලන්තය සමත් වූයේ ඉතිහාසගත ජයක් බවට එය පරිවර්තනය කරමිනි. එනම් එක්දින ලෝක කුසලානයකදී නෙදර්ලන්තය විසින් ටෙස්ට් ක්‍රීඩා කරන රටක් පරාජයට පත් කළ පළමු අවස්ථාව ලෙසින් මෙය ඉතිහාසයට එක්වේ.

කෙසේ වෙතත් නෙදර්ලන්තය මුහුණදෙන මීළඟ තරගය ශ්‍රී ලංකා කණ්ඩායම සමඟින් ලක්නව්හි ඒකානා ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී එළැඹෙන 21 වැනිදා (සෙනසුරාදා) පැවැත්වීමට නියමිතව තිබේ. එසේම ඒකානා ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී පසුගියදා ඕස්ට්‍රේලියානුවන් හමුවේ අමිහිරි පරාජයක් අත්විඳි ශ්‍රී ලංකාවට මෙය කිසිදු ලෙසකින්වත් පහසු අභියෝගයක් නොවන බවද නොරහසකි. ශ්‍රී ලංකා පුහුණු උපදේශක මහේල ජයවර්ධන පෙරේදා (17දා) රාත්‍රියේ හැවතත් ශ්‍රී ලංකාවට ළඟාවී ඇති නිසා මෙම තරගයේදී මහේලගේ සේවයද ශ්‍රී ලංකාවට අහිමිව යනු ඇති බවද දැනගන්නට ඇත. පෞද්ගලික හේතුවක් නිසා මහේල මෙලෙස ශ්‍රී ලංකාවට ගොස් ඇති බවත්, එළැඹෙන 26 වැනිදා බෙංගලූරුහිදී පැවැත්වෙන ශ්‍රී ලංකා-එංගලන්ත තරගයට පෙර මහේල ජයවර්ධන පුහුණු උපදේශකවරයා ලෙස ශ්‍රී ලංකා කණ්ඩායම සමඟින් නැවතත් එක්වීමට නියමිතව ඇති බවද සඳහන්ය.

මෙම ලිපිය ලියන මොහොත වන විට එක්දින ලෝක කුසලානයේ මූලික වටයේ තරග 15ක් නිමා වී තිබේ. එහිදී සෑම කණ්ඩායමක්ම තරග 3 බැගින් ක්‍රීඩා කර ඇති පසුබිමක සහභාගී වූ තරග 3ම පරාජයට පත්ව ඇත්තේ ශ්‍රී ලංකාව පමණි. ඒ අනුව මෙවර ලෝක කුසලාන එක්දින ක්‍රිකට් තරගාවලියේ 10 වැනි ස්ථානය දක්වා පහත වැටීමට ශ්‍රී ලංකාවට සිදුව තිබීමද සංවේදනාත්මක සිදුවීමකි.

කෙසේ වෙතත් ඊයේ (18දා) වන විට ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට අපරාජිත ඉන්දීය කණ්ඩායම සමත්ව තිබුණේ ලකුණු 6ක් සහ 1.821ක ශුද්ධ ලකුණු ලබා ගැනීමේ වේගයක් රඳවා ගැනීම හේතුවෙනි. එසේම නවසීලන්තය දෙවැනි ස්ථානයේ පසුවෙද්දී දකුණු අප්‍රිකානුවන් තෙවැනි ස්ථානය හිමිකර ගැනීමට සමත් වී තිබේ. පාකිස්තානය සිව්වැනි ස්ථානයත්, වත්මන් ලෝක ශූර එංගලන්තය 5 වැනි ස්ථානයත් හිමිකර ගෙන තිබේ.

ඇෆ්ගනිස්තානය 6 වැනි ස්ථානයේත්, බංග්ලාදේශය 7 වැනි ස්ථානයේත් පසුවෙද්දී ඕස්ට්‍රේලියානුවන් 8 වැනි ස්ථානය දක්වා පහත වැටී ඇත්තේ ශ්‍රී ලංකාවට පමණක් එරෙහිව ජයග්‍රහණයක් වාර්තා කර ගැනීම නිසාවෙනි. පෙරේදා දිනයේදී දකුණු අප්‍රිකානුවන් හමුවේ වාර්තා කළ පෙරළිකාර ජයග්‍රහණය හේතුවෙන් ප්‍රසාද ලකුණු සටහනේ 9 වැනි ස්ථානයට පත්වීමට නෙදර්ලන්තයට හැකියාව ලැබී ඇත.



ඉහත සඳහන් කළ පෙරළිකාර ජයග්‍රහණයෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් නෙදර්ලන්ත නායක ස්කොට් එඩ්වඩ්ස් කියා සිටියේ මෙවැන්නකි. "සැබෑ වශයෙන්ම මෙය අගනාමහාර විය හැකි ජයක්. අපි ආවේ බලාපොරොත්තු රැසක් පොදි බැඳගෙනයි. අපිට ඉතා දක්ෂ ක්‍රීඩකයන් ඉන්නවා. එසේම මෙලෙස පළමු ජයග්‍රහණය වාර්තා කිරීමට හැකි වීම ගැන සතුටු වන අතරම ඉදිරියේදී තවත් තරග කිහිපයක් ජයගත හැකි වෙතැයි විශ්වාසය අපි තබමු. කෙසේ වෙතත් පළමු තරග කිහිපයේදීත් අපි ශක්තිමත් ස්ථානයක සිටියත් අවාසනාවන්ත ලෙස පරාජයට පත් වුණා."

මේ අතර පෙරේදා දකුණු අප්‍රිකානුවන් පරාජයට පත් කළ නෙදර්ලන්ත සංචිතයට මෙයට පෙර දකුණු අප්‍රිකාව නියෝජනය කළ ක්‍රීඩකයන් තිදෙනකු අයුලත්ව තිබීමද සැලකෙනෙන සිදුවීමකි. රොලොෆ් වැන්ඩර් මර්වි, කොලින් ඇකර්මන් සහ රයන් ක්ලේ යන ක්‍රීඩකයන් මීට පෙර දකුණු අප්‍රිකාව නියෝජනය කරමින් ක්‍රීඩා කර තිබේ.



එසේම දකුණු අප්‍රිකානුවන් හමුවේ නෙදර්ලන්තය වාර්තා කළ ජයග්‍රහණයේ නියමුවෙකු වූ වේගපන්දු යවන ක්‍රීඩක පෝල් වැන් මීකුන් පිළිබඳ සුවිශේෂී සටහනක් මේ වන විට බොහෝ දෙනෙකුගේ අවධානය යොමු වූ මාතෘකාවක් බවට පත්ව ඇත.

ඒ අනුව 2020 වසරේදී කොවිඩ්-19 වයිරස් වසංගත තත්ත්වය හමුවේ මුහුණදුන් ආර්ථිකමය අර්බුදකාරී වාතාවරණය හමුවේ ලොව ප්‍රධානතම ආහාර බෙදාහැරීමේ ජාලයක ආහාර බෙදාහරින්නෙකු ලෙස තමන් කටයුතු කළ බව මීකුන් 2020 වසරේ තම සමාජ මාධ්‍ය ජාලයේ යෙදූ සටහනක දක්වා තිබිණි. ඒ අනුව කොවිඩ් වයිරස් තත්ත්වය හමුවේ තමන්ට මෙලෙස රැකියාවක නිරත වීමට සිදුවූ බවද සඳහන් කර තිබූ නෙදර්ලන්ත වේගපන්දු යවන්නා මෙසේද මාධ්‍ය වෙත පවසා තිබිණි. "මට යම් ඉතිරි කළ මුදලක් තිබුණා. එසේ වුවත් ඒවා ඉතිරි කිරීම පමණයි. මට ඒවා වියදම් කළ නොහැකිවී. ඒ අනුව දැඩිව සිතා බලා එම සීත කාලය අසීරුතාවක් මධ්‍යයේ ගෙවා දැමීම සඳහා මට එම රැකියාවට යොමු වීමට සිදු වුණා. ක්‍රිකට් ක්‍රීඩා කළ නොහැකි නිසා මට ආදායම් මාර්ගයක් සොයා ගැනීමේ අවශ්‍යතාව මත එම රැකියාව තෝරා ගත්තා"



■ ගමිත දෙහිපිටිය - ලක්නව්හි ඒකානා ක්‍රීඩාංගණයේ සිට...




# ඇෆ්ගන් පිලේ මුජීබ් ළඟ ඉන්දියානු දරුවකු හඬා වැටෙයි

■ ගමිත දෙහිපිටිය ඉන්දියාවේ ලක්නව්හි සිට...

මෙවර ලෝක කුසලානයේදී තවත් එක් පෙරළිකාර කණ්ඩායමක් බවට පත් වූ ඇෆ්ගනිස්තාන කණ්ඩායම පසුගියදා එංගලන්තය හමුවේ ලද ජයග්‍රහණයෙන් අනතුරුව සිදුවූ අපූරු සිදුවීමක් සම්බන්ධයෙන් මේ වන විට බොහෝ දෙනෙකුගේ අවධානය යොමුවී තිබේ.

ඒ අනුව එම තරගයෙන් ඇෆ්ගනිස්තානය ජය ගැනීමෙන් අනතුරුව වයස අවුරුදු 10ක පමණ කුඩා දරුවකු, ඇෆ්ගනිස්තාන දඟ පන්දු යවන ක්‍රීඩක මුජීබ් උර් රෙහෙමාන් වැලඳගෙන හඬා වැටෙනු අයුරු දැකගත හැකි විය. ඉන් අනතුරුව මුජීබ් එම දරුවා සනසමින් ඔහුට ඩීමට යමක් ලබා දෙන අයුරු ද ඔහු සනසමින් දීර්ඝ වේලාවක් ගත කරන අයුරුද දක්නට හැකි වූ අතර, එම අවස්ථාවේදී බොහෝ දෙනකු සිතුවේ අදාළ දරුවා ඇෆ්ගනිස්තානුවකු බවයි.

එසේ වුවත් දීර්ඝ නිහැඬියාවකින් අනතුරුව මෙම සිදුවීම පිළිබඳව තම හඬ අවදි කිරීමට ඇෆ්ගනිස්තාන දඟ පන්දු යවන ක්‍රීඩක මුජීබ් උර් රෙහෙමාන් ඊයේ (18දා) කටයුතු කර තිබිණි. ඒ අනුව තම නිල සමාජ මාධ්‍ය ගිණුම ඔස්සේ අදාළ සිදුවීම පිළිබඳව ඡායාරූප කිහිපයක් සහ වීඩියෝවක් උපුටා දක්වමින් මුජීබ් සඳහන් කර තිබුණේ, මෙම දරුවා ඇෆ්ගනිස්තානුවකු නොවන බවත් තම කණ්ඩායමේ ජයග්‍රහණය ගැන උද්දාමයට පත්වෙමින් සතුටු කඳුළු වැගිරූ ඉන්දියානු දරුවකු බවත් අදාළ පණිවුඩයේ මුජීබ් සඳහන් කර තිබිණි.

එසේම තමන් ඇතුළු ඇෆ්ගනිස්තාන කණ්ඩායමට එම තරගයේදී ඉන්දීය ප්‍රේක්ෂකයන්ගෙන් උණුසුම් ප්‍රතිචාර ලැබුණු බවත් තමන් මෙම දරුවා හමුවූ අවස්ථාවේදී වඩාත් සංවේදී වූ බවද මුජීබ් අදාළ සමාජ මාධ්‍ය සටහනේ දක්වා තිබිණි. එපමණක් නොව ක්‍රිකට් යනු හුදෙක්ම ක්‍රීඩාවක් පමණක් නොව හැඟීම්බර ප්‍රකාශනයක් ලෙසත් මුජීබ් එහිදී පවසා තිබේ.

# උණ රෝගයකින් පාකිස්තානු පිල රත්වෙයි

■ ගමිත දෙහිපිටිය - ඉන්දියාවේ ලක්නව්හි සිට...

එක්දින ලෝක කුසලානයට එක්ව සිටින පාකිස්තාන කණ්ඩායමේ ක්‍රීඩකයන් අතර උණ රෝගයක් ව්‍යාප්ත වෙමින් පැවතීම නිසා පාකිස්තාන කණ්ඩායම දැඩි අර්බුදයකට මුහුණදී ඇති බව වාර්තා වේ. මේ හේතුවෙන් ඕස්ට්‍රේලියානුවන් සමඟින් පැවැත්වීමට නියමිතව ඇති මීළඟ තරගයේදී පාකිස්තානයේ ප්‍රබල ක්‍රීඩකයින් කිහිපදෙනකුටම අහිමි වී යෑමට ඉඩ ඇති බවද සඳහන්ය.

ඒ අනුව පාකිස්තාන කණ්ඩායමේ ක්‍රීඩකයන් කිහිපදෙනකුම මෙම උණ රෝගී තත්ත්වයෙන් පීඩා විඳින බවත්, තවත් කිහිපදෙනකු මේ වන විට සුවය ලබමින් පසුවන බවත් පාකිස්තාන කණ්ඩායමේ කළමනාකාරීත්වය නිකුත් කර තිබූ නිවේදනයක දක්වා තිබිණි. එසේම පාකිස්තාන වේගපන්දු බලඇණියේ ප්‍රධානතම තුරුම්පුව බවට පත්ව තිබෙන වමත් වේගපන්දු යවන ක්‍රීඩක ෂහීන් ෂා අෆ්රිඩිටද මෙම උණ රෝගකාරකය ආසාදනය වී ඇති බවට සැක කරන බවද පාකිස්තාන ක්‍රිකට් කණ්ඩායමේ කළමනාකරු පවසා තිබේ.

කෙසේ වෙතත් පාකිස්තාන කණ්ඩායමේ ප්‍රධානතම ක්‍රීඩකයන් කිහිපදෙනකුම මේ වන විටත් උණ රෝගයෙන් පීඩා විඳින බවත්, ඔවුන් මෙතෙක් ඉන් සුවය ලබා නොමැති බවද සඳහන්ය. අදාළ ක්‍රීඩකයන් පාකිස්තාන ක්‍රිකට් පාලක මණ්ඩල වෛද්‍ය කමිටුවේ දැඩි අධීක්ෂණය යටතේ මේ වන විට ප්‍රතිකාර ලබමින් පසුවන බවද පාකිස්තාන කණ්ඩායමේ කළමනාකරු සඳහන් කර ඇත.

එහිදී ෂහීන් ෂා අෆ්රිඩිට අමතරව අබ්දුල්ලා ෂෆීක්, මොහොමඩ් රිස්වාන්, සල්මාන් අලි ආගා, මොහොමඩ් හාරිස් සහ ෂමාන් ඛාන් මෙලෙස උණ රෝගී තත්ත්වයෙන් පීඩා විඳින බවද සඳහන්ය.

මේ අතර අහමදාබාද්හිදී පැවැති ඉන්දීය-පාකිස්තාන තරගය අතරතුරදී තරඟකරුවන්ගේ නොමනා හැසිරීම් පිළිබඳව තරඟකරුවන්ට එරෙහිව ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලයට සහ ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පාකිස්තාන ක්‍රිකට් බලධාරීන් කටයුතු කර ඇති බවද සඳහන්ය. එසේම පාකිස්තාන ක්‍රීඩා මාධ්‍යවේදීන් සහ ක්‍රීඩාලෝලීන්ට ඉන්දියාවට ඇතුළු වීමට වීසා බලපත්‍ර ලබා නොදීම පිළිබඳව තම බලවත් විරෝධය පළ කිරීමටද අදාළ පැමිණිල්ලේදී පාකිස්තාන ක්‍රිකට් බලධාරීන් කටයුතු කර ඇති බවද දැක්වේ.

ඒ අනුව පසුගිය 14 වැනිදා පැවැති ඉන්දියා-පාකිස්තාන තරගය අතරතුරදී පාකිස්තාන සංචිතය ඉලක්ක කරගනිමින් ඉන්දීය ක්‍රීඩාලෝලීන් දැක්වූ නොමනා හැසිරීම පිළිබඳව ඉහත දැක්වූ පැමිණිල්ල මඟින් කරුණු දක්වමින් ඒ පිළිබඳ විශේෂ පරීක්ෂණයක් සිදු කරන ලෙස පාකිස්තාන ක්‍රිකට් බලධාරීන් අයි.සී.සී.යෙන් ඉල්ලීමක් කර ඇත. එපමණක් නොව නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් පාකිස්තානු තරඟකරුවන් සහ ක්‍රීඩා මාධ්‍යවේදීන් වීසා ඉල්ලුම් කර තිබුණද වීසා බලපත්‍ර ලබා නොදීම ගැන ඉදිරියේදී නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් විරෝධතාවක් දියත් කරන බවත් පාකිස්තාන ක්‍රිකට් බලධාරීන් මේ සම්බන්ධයෙන් නිකුත් කර තිබූ නිවේදනයේ දක්වා ඇති බවද පැවසේ.

කෙසේ වෙතත් මේ පිළිබඳව ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය මේ දක්වා කිසිදු නිවේදනයක් නිකුත් කර නොතිබීමද විශේෂත්වයකි.

මේ අතර මෙවර ලෝක කුසලානයේදී පාකිස්තානය මුහුණදෙන මීළඟ තරගය ඕස්ට්‍රේලියානුවන් සමඟින් හෙට (20දා) පැවැත්වීමට නියමිතව තිබේ.

අවුරුදු 19න් පහළ ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සම්මාන ප්‍රදානෝත්සවය

# වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩක සහ ක්‍රීඩිකා සම්මාන ෂෙවොන්ට සහ විශ්මිට

## පාසල් ක්‍රීඩක-ක්‍රීඩිකාවන්ට මුරලිගෙන් සුපිරි ඔවදන් රැසක්

■ ඉෂාන් රශ්මිත




වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා - කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලයේ ෂෙවොන් ඩැනියෙල්




වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව - ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයේ විශ්මි ගුණරත්න

ශ්‍රී ලංකා ක්‍රිකට් අනුග්‍රහය ඇතිව ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය විසින් සංවිධානය කරනු ලැබූ වයස අවුරුදු 19න් පහළ ක්‍රිකට් සම්මාන ප්‍රදානෝත්සවයේදී වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා සහ ක්‍රීඩිකාව ලෙස සම්මාන ලැබීමට කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලයේ ෂෙවොන් ඩැනියෙල් සහ ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයේ විශ්මි ගුණරත්න සමත් වූහ.

ශ්‍රී ලංකා යොවුන් පිලේ නායකත්වය දැරූ ෂෙවොන් ඩැනියෙල් මෙම සම්මානයට අමතරව ජාතික මට්ටමේ දක්ෂතම පිතිකරු ලෙස සම්මානය ද හිමිකරගත් අතර, ශ්‍රී ලංකා කාන්තා පිලේ සාමාජිකාවක වන විශ්මි ගුණරත්නද මෙම සම්මානයට අමතරව සම්මාන කිහිපයකට හිමිකම් කීය.

කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැති මෙම සම්මාන ප්‍රදානයේදී ශූරතා සහ අනු ශූරතා දිනාගත් කණ්ඩායම්, පළාත් මට්ටමේදී ශූරතාවන් හිමිකරගත් කණ්ඩායම් සහ දෙදින තරගාවලියේදී දක්ෂතා දැක්වූ ක්‍රීඩක-ක්‍රීඩිකාවන් ද ඇගයීමට ලක්කෙරිණි.

අනාගත ජාත්‍යන්තර ක්‍රිකට් තරු බිහිකිරීමේ තිඹිරිගෙය වන පාසල් ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් සුවිසල් කාර්යභාරයක් ඉටුකරන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මෙම සම්මාන ප්‍රදානයේදී විශාල පිරිවැයක් දරමින් වඩාත් උත්කර්ෂවත් සහ සාඩම්බර අයුරින් ක්‍රීඩක-ක්‍රීඩිකාවන් ඇගයීම සිදු කිරීමට ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය සමඟින් කටයුතු යෙදීය.

මේ අතර ලෝක පූජිත ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩක මුත්තයියා මුරලිදරන් මහතා මෙහිදී අදහස් දක්වමින් පැවසුවේ මෙවැන්නකි. "ඕනෑම අයකු වැඩි වාර ගණනකදී දුර්වල වෙන්න පුළුවන්. ඒ හැම අවස්ථාවකම කැපවීමෙන් කටයුතු කිරීමෙන් තමයි සාර්ථකත්වයට එන්න පුළුවන් වෙන්නේ. මෙතැන ඉන්න හැම දෙනාම රටට ක්‍රීඩා කරන්න කැමැති වුණත් ඒ අවස්ථාව ලැබෙන්නේ නෑ. ඒ නිසා කිසිම විටක අධ්‍යාපනය කඩාකප්පල් කරගන්න එපා. අධ්‍යාපනයත් සමඟින් ක්‍රීඩාව කරන්න. එවිට බොහෝ දේ ජය ගන්න පුළුවන්" යැයි පැවසීය.

"මම ක්‍රිකට් පටන් ගත්ත කාලයට වඩා අද තත්ත්වය වෙනස් වෙලා තියෙන්නේ. අපි පාසල් ක්‍රිකට් ක්‍රීඩා කරන කාලේ මුළු රටේම පාසල් කිහිපයක් පමණයි ක්‍රිකට් ක්‍රීඩා කළේ. අද විශාල පාසල් සංඛ්‍යාවක් ක්‍රීඩා කරනවා. ඒ ගැන සතුටු වෙනවා වගේම ඒ තත්ත්වයට ගේන්න කටයුතු කළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සහ ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයට ගෞරවය පිරිනමනවා. ඒ වගේම දැන් පහසුකම් වැඩි දියුණු වෙලා තියෙන්නේ. අපේ කාලේ නම් පහසුකම් ගොඩාක් අඩුයි. ඒ කාලේ අපට තිබුණු ලොකුම සිහිනය තමයි පාසලේ කණ්ඩායමට ක්‍රීඩා කරන එක. අද ඒ තත්ත්වය වෙනස් වෙලා හැමෝගෙම තිබෙන ලොකුම හීනය තමයි රට වෙනුවෙන් ක්‍රීඩා කිරීම. අපි ක්‍රීඩාවෙන් විනෝද වුණා. නමුත් දැන් ක්‍රීඩකයන් විශාල පීඩනයකින් ඉන්න බව පේනවා. පාසල් සමයේදී ලොකු පීඩනයක් ගන්න එපා. අද මේ උත්සවයේදී මම දුටුවා කොළඹින් පිට පාසල් විශාල සංඛ්‍යාවක් තෑගග ලබනවා. එයින් කියැවෙන්නේ ගමේ ක්‍රිකට් දියුණු වෙලා තියන එක.

ක්‍රිකට් කියන්නේ විශාල පීඩනයක් තියෙන ක්‍රීඩාවක්. තමන් තියාගන්න පීඩනය අඩු කරන්න කරන්න දියුණුව වැඩි වෙනවා. ක්‍රීඩාවෙන් විනෝදය ලබාගැනීමට තමයි අපි ප්‍රමුඛතාවක් දියයුත්තේ. ක්‍රිකට් ක්‍රීඩාව නිවැරදිව හඳුනාගෙන වඩාත් කැපවීමෙන් විනයගරුකව කටයුතු කළොත් බොහෝ ඉදිරියට යන්න පුළුවන්. ක්‍රිකට් ක්‍රීඩාවේදී විනය ඉතා වැදගත්. මේ පාසල් ක්‍රීඩකයන්ගේ ලොකුම සිහිනය රටට ක්‍රීඩා කරන එක. නමුත් කණ්ඩායමට එන්න පුළුවන් රැඳෙන්න තමයි අමාරු. ඕනෑම ක්‍රීඩකයෙක් ඕනෑම වෙලාවක දුර්වල තත්ත්වයට වැටෙන්න පුළුවන්."

ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් කේ. මහේෂන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ගයත්‍රී අබේගුණවර්ධන ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපති ශම්මි සිල්වා, ලේකම් මොහාන් සිල්වා, ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ සභාපති සහ කොළඹ රාජකීය විද්‍යාලයේ විදුහල්පතිතුමා ඇතුළු ආරාධිත අමුත්තන් රැසක් මෙම සම්මාන ප්‍රදානයට එක්ව සිටියහ.

ශ්‍රී ලංකා තරගයේදී ලබාදුන් තීරණය පිළිබඳව

# වෝනර් UDRSට දෙහි කපයි

■ ගමිත දෙහිපිටිය - ඉන්දියාවේ ලක්නව්හි සිට...

මෙවර ලෝක කුසලාන එක්දින ක්‍රිකට් තරගාවලියේ මෙතෙක් පැවැති තරගවලදී ලබා දුන් විනිසුරු තීරණ කිහිපයක් සම්බන්ධයෙන් යම් සහතාබාත් නිර්මාණය වී ඇති පසුබිමක එහි නවතම සිදුවීම ලෙස පසුගියදා නිමා වූ ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා තරගයේදී ඕස්ට්‍රේලියානු ආරම්භක පිතිකරු ඩේවිඩ් වෝනර්ට ලබා දුන් කඩුල්ල මුවා කිරීමේ තීරණය සම්බන්ධයෙන් වෝනර් තම අසතුට පළකර තිබේ.

ඒ අනුව අදාළ දැවී යෑම සම්බන්ධයෙන් අදහස් දක්වමින් වෝනර් පවසා තිබුණේ තමන් මුහුණදුන් පන්දුවේ ගමන් පථයත්, රූපවාහිනී තිරයේ දක්නට ලැබුණු වමත් වේගපන්දු යවන ක්‍රීඩක දිල්ෂාන් මදුශංක යොමු කළ එම පන්දුවේ ගමන් පථයත් අතර යම් පරස්පරතාවක් තිබෙන බවයි. එහිදී තවදුරටත් මෙසේද කරුණු දක්වා තිබූ වෝනර් "තාක්ෂණය ඔස්සේ අපිට නොරතුරු විශාල ප්‍රමාණයක් ලබා දෙනවා. කෙසේ වෙතත් වර්තමානයේදී යම් ගොයකින් විනිසුරුවකු කඩුල්ල මුවා කිරීමේ වරදක් සිදුවූ බව තීන්දු කළහොත් විනිසුරු තීරණය නැවත සලකා බැලීමේ ක්‍රමවේදය (UDRS) යටතේ එම තීරණය වෙනස් වන්නේ ඉතාමත් අල්ප වශයෙනි. කෙසේ වෙතත් මෙම දැවී යෑමෙන් අනතුරුව මම විනිසුරු ජෝ විල්සන්ගෙන් විමසා සිටියා එම දැවී යෑමේ තීරණය ලබා දුන්නේ ඇයිද කියා. ඔහු එහිදී පවසා සිටියේ එම පන්දුව කඩුල්ල තුළට පේලනය වන සෙයක් දක්නට ලැබුණු බවයි. කෙසේ වෙතත් ක්‍රීඩකයකු ලෙස මම මේ සම්බන්ධයෙන් දැඩි ලෙස කලකිරීමකට පත්වෙනවා. එයට හේතුව වන්නේ දැවී යෑමක් ලබා දීමෙන් අනතුරුව කිසිදු ලෙසකින්වත් කරුණු දැක්වීමක් සිදු නොවීමයි. එසේම මෙය හුදු තාක්ෂණික කරුණක් නිසා ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දිය යුතුයි." යනුවෙන් පවසා තිබිණි.

වෙළෙඳ සේවා පිහිනුම් ශූරතාවලිය

# 10 වැනි වරටත් මාස් හෝල්ඩින්ග්ස්ට



*මාස් හෝල්ඩින්ග්ස් හි ශාලිකා විමලරත්න සහ ලහිරු ඒකනායක විසින් වෙළෙඳ සේවා පිහිනුම් ශූරතාව ප්‍රධාන ආරාධිත අමුත්තා වූ ප්‍රේමලාල් බ්‍රාහ්මණගේ මහතාගෙන් ලබාගත් අයුරු. තර්ස්ටන් විදුහල් අනුග්‍රාහක ශ්‍රේෂන් ගුණවර්ධන, තර්ස්ටන් විදුහල්පති ප්‍රමුදිත වික්‍රමසිංහ, සංවිධාන කමිටුවේ සභාපති මේජර් ජෙනරල් ඩඩ්ලි පෙරේරා යන මහත්වරුන්ද ඡායාරූපයේ සිටී.*

ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමයේ අධීක්ෂණය යටතේ තර්ස්ටන් විද්‍යාලයීය ජල ක්‍රීඩා සමාජය සංවිධානය කරනු ලැබූ 14 වැනි වෙළෙඳ සේවා පිහිනුම් ශූරතාවලියේදී 10 වැනි වරටත් ශූරතාව දිනාගැනීමට මාස් හෝල්ඩින්ග්ස් කණ්ඩායම (Mas Holdings) සමත් විය.

ඒ අනුව පසුගියදා කොළඹ තර්ස්ටන් පිහිනුම් තටාකයේදී පැවැති මෙම තරගාවලියේදී මාස් හෝල්ඩින්ග්ස් කණ්ඩායම ලකුණු 728ක් ලබාගත් අතර, ලකුණු 658ක් ලබාගත් ජෝන් කීල්ස් පිල අනු ශූරතාව දිනාගත්තේය.

එසේම ලකුණු 208ක් ලබාගත් හේලීස් පී.එල්.සී. තෙවැනි තැන දිනාගත් අතර, මෙම තරගාවලියට වෙළෙඳ සේවා සංවිධාන 32කින් ක්‍රීඩක-ක්‍රීඩිකාවන් 600 දෙනකු පමණ එක්ව සිටියහ.

මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස තර්ස්ටන් විදුහල් ආදි ශිෂ්‍ය ප්‍රයිම් සමූහ ව්‍යාපාරයේ සභාපති ප්‍රේමලාල් බ්‍රාහ්මණගේ මහතා එක්ව සිටියේය.

කොළඹ 07, රොස්මීඩ් පෙදෙස, අංක 101 හි පිහිටි ශ්‍රීමත් ... විසින් ... මිනුවන්ගොඩ පාර, 302/1/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.

C M Y K